# වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
# කාර්ය සාධන වාර්තාව - 2018

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**“ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය කිරීම”**

## පටුන

1 වන පරිච්ඡේදය ....................................................................................................1
සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය....................................................................................1
1.1 හැඳින්වීම ....................................................................................................1
1.2 අංශයේ ප්‍රධාන කාර්ය භාරයන් 1
1.3 ආයතනික සැකැස්ම 1
1.4 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් අයවැය යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් ....................................................................................................1
1.4.1 බීජ පැළ සකස් කිරීම ....................................................................................................1
1.4.2 දැනුවත් කිරීමේ සහ ව්‍යාප්ති වැඩ සටහන්....................................................................................................2
1.4.3 සහභාගිත්ව රුක් රෝපණ වැඩ සටහන්....................................................................................................2
1.4.4 නව ගොවි වන වගා ස්ථාපනය කිරීම ....................................................................................................2
1.4.5 2016/2017 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු කිරීම ....................................3
1.4.6 ගෙවතු සංවර්ධනය කිරීම ....................................................................................................3
1.4.7 වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන සන්නිවේදන මෙවලම් සැකසීම.....................................4
2 වන පරිච්ඡේදය ....................................................................................................5
වන විද්‍යා හා වන කළමනාකරණ අංශය ....................................................................................................5
2.1 හැඳින්වීම ....................................................................................................5
2.2 මෙම අංශයේ මූලික අරමුණු....................................................................................................5
2.3 ආයතනික සැකැස්ම....................................................................................................5
2.4 ප්‍රධාන කාර්යයන් හා එහි සාරාංශ ගත ක්‍රියාකාරිත්වය....................................................................................................6
2.4.1 නැවත වන වගා කිරීම. ....................................................................................................6
2.4.2 වන විද්‍යාත්මක ප්‍රතිකර්ම සහ වන වගාවලින් අස්වැන්න ලබාගැනිම සැලසුම් කිරිම ,ක්‍රියාත්මක කිරිම සහ පාලනය කිරීම. ....................................................................................................6
2.4.3 රාජ්‍ය දැව සංස්ථාව සමඟ සම්බන්ධීකරණ කටයුතු වල නිරත වීම ....................................................6
2.4.4 පයිනස් ඔලියො - රෙසින් නිස්සාරණ කටයුතු ක්‍රියාත්මක කිරීම....................................................6
2.5 වනාන්තරවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම....................................................................................................6
2.5.1 පාරිසරික ප්‍රතිස්ථාපනය....................................................................................................7
2.5.2 නැවත වන වගා කරන ලද බිම් නඩත්තු කිරීම....................................................................................................7
2.5.3 නැවත රුක් රෝපණය සිදුකල ප්‍රදේශ නඩත්තු කිරීම ....................................................................................................7
2.6 2018 වසර තුල දී සිදු කරන ලද ක්‍රියාකාරකම් වල ප්‍රගතිය. ....................................................................................................7
2.6.1 නැවත වනවගා කිරීමේ වැඩ සටහන - 2018....................................................................................................7
2.6.2 බීජ පැල නිෂ්පාදනය - 2018....................................................................................................8
2.6.3 නොමේරූ වන වගා නඩත්තු කිරීම - 2018 ....................................................................................................8
2.7 වන වගාවල වන විද්‍යාත්මක මෙහෙයුම් - 2018....................................................................................................10
2.7.1 පූර්ව වානිජමය තුනීකිරීම්....................................................................................................10
2.7.2 වානිජමය තුනී කිරීම්....................................................................................................10
2.7.3 පරිනත වන වගාවල පුනර්ජනනීය හෙලීම්....................................................................................................11

2.7.4 පශ්චාත් හෙලීම් සංගණනය ....................................................................................11
2.7.5 රිකිලි නඩත්තු කිරීම .....................................................................................................11
2.7.6 ශුද්ධ කිරීම. ..............................................................................................................12
2.7.7 මධ්‍යම කඳුකරයේ කඳුමුදුන් සංරක්ෂණ.........................................................................12
2.7.8 පයිනස් වනවගා පුළුල් පත්‍ර සහිත වනවගා බවට පරිවර්තනය කිරීම........................12
2.7.9 වනාන්තරවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ වැඩ සටහන..............................13
2.7.10 පයිනස් වන වගා වලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම. –2018.......................13
2.7.11 2018 වර්ෂය තුල මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ස්කන්ධ භාගය ........................14
2.7.12 පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන .........................................14
2.7.13 වන වගා වලින් ලද අස්වැන්න .......................................................................15
2.7.14 2018 වර්ෂයේ දී සංචාරක බංගලා වලින් ලද ආදායම ..........................................16
2.7.15 2018 වසරෙ මූල්‍යමය ප්‍රගතිය .......................................................................18
3 වන පරිච්ඡේදය.....................................................................................................19
වන සංගණන සහ භූගෝල විද්‍යා තොරතුරු පද්ධති අංශය ........................................19
3.1 හැඳින්වීම .............................................................................................................19
3.2 ප්‍රධාන අරමුණු .........................................................................................................19
3.3 ආයතන සැකසුම .....................................................................................................19
3.4 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්...................................................20
3.4.1 වන ආවරණ සිතියම් සැකසීම සඳහා දුරස්ථ සන්නිවේදනය ......................................20
3.4.2 වන සංගණන කටයුතු.............................................................................................20
3.4.3 වන වගා දත්ත සමුදාය (FORDATA) කළමනාකරණය ..............................................20
3.4.4 (NFI) දත්ත සමුදාය ජාතික වන සංගණනය ...........................................................20
3.4.5 මිණුම් කිරීම සහ මායිම් සළකුණු කිරීම .................................................................21
3.4.6 භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය කළමනාකරණය කිරීම ..........................................21
4 වන පරිච්ඡේදය ..................................................................................................22
පරිසර සංරක්ෂණ හා කළමනාකරණ අංශය .................................................................22
4.1 හැඳින්වීම...............................................................................................................22
4.2 ප්‍රධාන ක්‍රියාකාරකම්..................................................................................................22
4.3 ආයතනික සැකැස්ම...................................................................................................23
4.4 වාර්ෂික ක්‍රියාකාරකම්................................................................................................23
4.4.1 ලෝකඋරුම වනභූමීන් නඩත්තුව හා කළමනාකරණය ..............................................23
4.4.2 සංරක්ෂණ මධ්‍යස්ථාන කළමනාකරණය ...................................................................23
4.4.3 හුරුළු පාරිසරික උද්‍යානය ....................................................................................24
4.4.4 සංචාරකයින්ගේ තොරතුරු සහ ඔවුන්ගෙන් ප්‍රවේශ ගාස්තු ලෙස එකතු කල ආදායම 24
4.4.5 වනාන්තර තුල රූගත කිරීම් වලින් ලද ආදායම.........................................................27
4.4.6 පරිසර බලපෑම් ඇගයීම ...........................................................................................27

4.4.7 පාරිසරික තොරතුරු කළමනාකරණ පද්ධතිය ........................................................27
5 වන පරිච්ඡේදය........................................................................................................................28
පර්යේෂණ, අධ්‍යාපන සහ සංවර්ධන අංශය ................................................................................28
5.1 හැඳින්වීම ..........................................................................................................................28
5.2 පර්යේෂණ හා අධ්‍යාපන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් ...........................................................28
5.3 ආයතනික සැකැස්ම (ප්‍රධාන කාර්යාලය)...............................................................................29
5.4 2018 වර්ෂය තුලදී ස්ථාපනය කරන ලද නව පර්යේෂණ.............................................................29
5.5 පර්යේෂණන නඩත්තු කිරීම...................................................................................................31
5.6 පර්යේෂණ වලින් ලබා ගන්නා නව සොයා ගැනීම් අන් අයටද ලබා දීම. ...................................31
5.7 ජාතික වන ක්ෂේත්‍ර පර්යේෂණ කමිටුව ...................................................................................32
5.8 පුස්තකාලය. .........................................................................................................................38
5.9 වන විද්‍යා තොරතුරු සේවාව...................................................................................................38
5.10 වන විද්‍යා අධ්‍යාපනය .........................................................................................................38
5.10.1 දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා සාමාන්‍ය පාඨමාලා. .......................................................38
5.10.2 වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ සේවයේ නිරත නිලධාරීන් සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් ..................................................................................................................40
5.10.3 අනෙකුත් ආයතන සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන්. ..................................................42
5.10.4 පරිසර පද්ධති සංරක්‍ෂණ සහ කලමණාකරන ව්‍යාපෘතිය මගින් සැපයෙන මූල්‍යාධාර යොදාගන්මින් ශ්‍රී ලංකා වන විද්‍යායතනය අලුත් වැඩියා කිරීම සහ වැඩිදියුණුකිරීම. ...............42
5.11 අංශයේ මූල්‍යමය කාර්යසාධනය. ...........................................................................................42
6 වන පරිච්ඡේදය........................................................................................................................43
වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශය.......................................................................43
6.1 හැඳින්වීම ..........................................................................................................................43
6.2 ප්‍රධාන ක්‍රියාකාරකම්.............................................................................................................43
6.3 ආයතනික සැකැස්ම...............................................................................................................43
6.4 ක්‍රියාකාරකම් පිළිබඳ සාමාන්‍ය සමාලෝචනයක් .....................................................................44
6.5 වන සංරක්ෂණ ආඥා පනත යටතේ නව වනාන්තර ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම ............44
6.6 ආරක්ෂණ කටයුතු වල ප්‍රගතිය................................................................................................44
6.6.1 සාමාන්‍ය ..........................................................................................................................44
6.6.2 හදිසි වැටලීම් ඒකකයන්හි කාර්ය සාධනය ..........................................................................45
6.6.3 දැව පරීක්ෂණ මධ්‍යස්ථාන.....................................................................................................45
6.6.4 පුද්ගලික දැව ව්‍යාපාර .......................................................................................................45
6.7 පුහුණු වැඩසටහන් ................................................................................................................45
6.8 ත්‍යාග මුදල් ලබා දීම ...........................................................................................................45
6.9 මුල්‍යමය ප්‍රගතිය ...................................................................................................................46
6.10 වනාන්තර නොවන ප්‍රභව වලින් ලබා ගන්නා නිෂ්පාදන අපනයනය කිරීම ...............46
7 වන පරිච්ඡේදය........................................................................................................................47

සැලසුම් හා ප්‍රගති පාලන අංශය ....................................................................................................47
7.1 හැඳින්වීම ....................................................................................................47
7.2 මෙම අංශයේ ප්‍රධාන අරමුණු ....................................................................................................47
7.3 ආයතනික සැකැස්ම ....................................................................................................47
7.4 ප්‍රධාන ක්‍රියාකාරකම් ....................................................................................................48
7.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රාග්ධන අයවැය සකස් කිරීම ....................................................................................................48
7.4.2 ප්‍රගති වාර්තා සැපයීම ....................................................................................................48
7.4.3 ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියාව ....................................................................................................48
8 වන පරිච්ඡේදය ....................................................................................................54
ප්‍රවාහන අංශය ....................................................................................................54
8.1 හැඳින්වීම. ....................................................................................................54
8.2 කාර්ය මණ්ඩලය හා ආයතනික සැකැස්ම. ....................................................................................................54
8.3 මූල්‍යමය ප්‍රතිපත්ති ....................................................................................................54
9 වන පරිච්ඡේදය ....................................................................................................55
මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන අංශය ....................................................................................................55
9.1 හැඳින්වීම ....................................................................................................55
9.2 ස්ථාන මාරු ....................................................................................................56
9.3 බඳවා ගැනීම් ....................................................................................................56
9.4 තනතුරු උසස් වීම් ....................................................................................................57
9.5 ණය ලබා දීම ....................................................................................................57
9.6 තොරතුරු අයිතිවාසිකම් ඒකකය ....................................................................................................57
10 වන පරිච්ඡේදය ....................................................................................................58
මුදල් අංශය ....................................................................................................58
10.1 හැඳින්වීම ....................................................................................................58
10.2 මුදල් අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් ....................................................................................................58
10.3 ආයතනික සැකැස්ම ....................................................................................................58
10.4 අයවැය තොරතුරු ....................................................................................................58
.10.5 අත්තිකාරම් ගිණුම් ....................................................................................................59
10.6 ආදායම් රැස් කිරීම. ....................................................................................................60
10.7 කැලෑ දෙපාර්තමේන්තු අරමුදල-------------------------------------------------------60

# වගු ලැයිස්තුව


| | | | පිටුව |
|---|---|---|---|
| 01 | වගුව 1.1 | දැනුවත් කිරීම් හා වන වගා වැඩ සටහන් | 02 |
| 02 | වගුව 1.2 | රුක් රෝපණ ක්‍රියාකාරකම් | 02 |
| 03 | වගුව 1.3 | නව ගොවි වන වගා ස්ථාපනය කිරීම | 03 |
| 04 | වගුව 1.4 | 2016/2017 වසරවල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු | 03 |
| 05 | වගුව 1.5 | ගෙවතු සංවර්ධනය සහ ශාක කළමණාකරණය කිරීම | 04 |
| 06 | වගුව 2.1 | නැවත වන වගා කිරීමේ වැඩ සටහන -2018 | 07-08 |
| 07 | වගුව 2.2 | බීජ පැල නිෂ්පාදනය -2018 | 08 |
| 08 | වගුව 2.3 | නොමේරු වන වගා නඩත්තුව - 2018 | 09-10 |
| 09 | වගුව 2.4 | පූර්ව වාණිජමය තුනී කිරීම් - 2018 | 10 |
| 10 | වගුව 2.5 | වාණිජමය තුනී කිරීම් -2018 | 10-11 |
| 11 | වගුව 2.6 | පශ්චාත් හෙලීම් සංගණනය - 2018 | 11 |
| 12 | වගුව 2.7 | රිකිලි නඩත්තු කිරීම - 2018 | 12 |
| 13 | වගුව 2.8 | ශුද්ධ කිරීම - 2018 | 12 |
| 14 | වගුව 2.9 | මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් නඩත්තු කිරීම (2017 වර්ෂයේ ස්ථාපනය කරන ලද) | 12 |
| 15 | වගුව 2.10 | මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් නඩත්තු කිරීම (2015 වර්ෂයේ ස්ථාපනය කරන ලද) | 12 |
| 16 | වගුව 2.11 | පුළුල් පත්‍ර සහිත වන වගා ස්ථාපනය කිරීම | 13 |
| 17 | වගුව 2.12 | 2017 වර්ෂයේදී ස්ථාපනය කරන ලද පුළුල් පත්‍ර සහිත වන වගා නඩත්තු කිරීම | 13 |
| 18 | වගුව 2.13 | 2016 වර්ෂයේදී ස්ථාපනය කරන ලද පුළුල් පත්‍ර සහිත වන වගා නඩත්තු කිරීම | 13 |
| 19 | වගුව 2.14 | 2015 වර්ෂයේදී ස්ථාපනය කරන ලද පුළුල් පත්‍ර සහිත වන වගා නඩත්තු කිරීම | 13 |
| 20 | වගුව 2.15 | වනාන්තර වල ගුණාත්මක බව වැඩිදියුණු කිරීමේ වැඩ සටහන | 13 |
| 21 | වගුව 2.16 | 2018 වර්ෂයේදී බදු දුන් ඉඩම් ප්‍රමාණය සහ ලබාගත් බදු ආදායම | 14 |
| 22 | වගුව 2.17 | පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩ සටහන් තත්ත්වය - 2018 | 14-15 |
| 23 | වගුව 2.18 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන වගා/වනාන්තර වලින් ලද අස්වැන්න -2018 | 15-16 |
| 24 | වගුව 2.19 | සංචාරක බංගලා වලින් ලද ආදායම - 2018 | 17-18 |
| 25 | වගුව 2.20 | වන විද්‍යා සහ වන කළමනාකරණ අංශයේ මූල්‍යමය ප්‍රගතිය - 2018 | 18 |
| 26 | වගුව 4.1 (අ) | උඩවත්ත කැලේ (මහනුවර) | 24 |
| 27 | වගුව 4.1 (ආ) | නකල්ස් වනාන්තරය ( ඩීන්ස්ටන් - මහනුවර) | 24 |
| 28 | වගුව 4.1 (ඇ) | නකල්ස් වනාන්තරය (පිටවලපතන, මාතලේ) | 24 |
| 29 | වගුව 4.1 (ඈ) | සිංහරාජ වනාන්තරය ( පිටදෙනිය, මාතර) | 25 |
| 30 | වගුව 4.1 (ඉ) | සිංහරාජ වනාන්තරය ( කුඩව, රත්නපුර) | 25 |
| 31 | වගුව 4.1 (ඊ) | හුරුළු පාරිසරික උද්‍යානය (හබරණ, පොලොන්නරුව | 25 |
| 32 | වගුව 4.1 (උ) | කොට්ටව වනාන්තරය (ගාල්ල) | 25-26 |

| | | | |
|---|---|---|---|
| 33 | වගුව 4.1 (ඌ) | කන්නෙලිය වනාන්තරය (ගාල්ල) | 26 |
| 34 | වගුව 4.1 (එ) | මාකන්දාව වනාන්තරය (කෑගල්ල) | 26 |
| 35 | වගුව 4.1 (ඒ) | කන්දෙඇල අධ්‍යාපනික වනෝද්‍යානය (නුවරඑළිය) | 26 |
| 36 | වගුව 5.1 | පර්යේෂණ කමිටු සාමාජිකයින් | 33 |
| 37 | වගුව 5.2(අ) | වන තාක්ෂණික විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ NVQ 5 වන මට්ටමේ පාඨමාලාවේ 1 වන අධ්‍යන වාරයේ පාඨමාලාවේ අන්තර්ගතය | 39 |
| 38 | වගුව 5.2(ආ) | වන තාක්ෂණික විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ NVQ 5 වන මට්ටමේ පාඨමාලාවේ 2 වන අධ්‍යන වාරයේ පාඨමාලාවේ අන්තර්ගතය | 39-40 |
| 39 | වගුව 5.3 | 2018 වර්ෂය තුල ශ්‍රී ලංකා වන විද්‍යාලය විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරින් සඳහා පවත්වන ලද පුහුණු වැඩ සටහන් | 40-41 |
| 40 | වගුව 5.4 | අනෙකුත් ආයතන සඳහා කෙටි කාලීන පුහුනු වැඩසටහන් | 42 |
| 41 | වගුව 6.1 | හදීසි වැටලීම් අංශයේ ප්‍රගතිය | 45 |
| 42 | වගුව 6.2 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අරමුදලේ මූල්‍යමය ප්‍රගතිය | 46 |
| 43 | වගුව 7.1 | ඒකාබද්ධ අරමුදල උපයෝගී කර ගනිමින් ඉදිකළ ගොඩනැගිලි පිළිබද තොරතුරු - 2018 | 48 |
| 44 | වගුව 7.2 | 2018 වසර තුල ගොඩනැගිලි ඉදිකිරීම සහ සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය | 48 |
| 45 | වගුව 7.3 | වර්ෂ 2018 තුල නඩත්තු කරන ලද ගොඩනැගිලිවල තොරතුරු | 49-52 |
| 46 | වගුව 7.4 | ගොඩනැගිලි නඩත්තුව - මූල්‍යමය ප්‍රගතිය -2018 | 52 |
| 47 | වගුව 7.5 | 2018 වසරතුල ගෘහ භාණ්ඩ, හා කාර්යාල උපකරණ හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය | 53 |
| 48 | වගුව 7.6 | 2018 වසර යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය | 53 |
| 49 | වගුව 7.7 | 2018 වසර යන්ත්‍රෝපකරණ නඩත්තුව හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය | 53 |
| 50 | වගුව 8.1 | 2018 වසරේ ලැබුණු ප්‍රතිපාදන හා ඒවා වියදම් වූ ආකාරය | 54 |
| 51 | වගුව 9.1 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු | 55 |
| 52 | වගුව 9.2 | 2018 වසරේ බඳවා ගැනීම් | 55 |
| 53 | වගුව 9.3 | 2018 වසරේ විශ්‍රාම ගැනීම් | 55-56 |
| 54 | වගුව 9.4 | සේවයෙන් ඉල්ලා අස්වීම්/තනතුරු වලින් නිදහස් වීම | 56 |
| 55 | වගුව 9.5 | මියගිය නිලධාරින් පිළිබද විස්තර | 56 |
| 56 | වගුව 9.6 | විනය කටයුතු | 56 |
| 57 | වගුව 9.7 | සේවය අතහැරයාම් | 56 |
| 58 | වගුව 9.8 | බඳවා ගැනීම් | 57 |
| 59 | වගුව 9.9 | ලබාදුන් තොරතුරු වලට එරෙහිව තොරතුරු කොමිසන් සභාවේ විභාගය වූ අභියාචනා | 57 |
| 60 | වගුව 10.1 | දෙපාර්තමේන්තු මූල්‍යමය ප්‍රගතිය | 58 |
| 61 | වගුව 10.2 | රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් ගිණුම | 59 |
| 62 | වගුව 10.3 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආදායම් | 60 |
| 63 | වගුව 10.4 | කැලෑ දෙපාර්තමේන්තු අරමුදල් ගිණුම් සම්බන්ධ ගනුදෙනුවල සාරාංශය | 60 |

# ඇමුණුම් ලැයිස්තුව



| | | පිටුව |
|---|---|---|
| ඇමුණුම I | වන අපරාධ වල සාරාංශය (උසාවි නඩු) - 2018 | 61-62 |
| ඇමුණුම II | වන සංරක්ෂණ ආඥා පනතේ 30 වන වගන්තිය යටතේ වන අපරාධ - 2018 | 63-64 |
| ඇමුණුම III | රාජසන්තක කල වාහන - 2018 | 65-69 |
| ඇමුණුම IV | ක්‍රියාකාරී තත්ත්වයේ පවතින ලියා පදිංචි දැව ව්‍යාපාර සංඛ්‍යාව - 2018 | 70 – 71 |
| ඇමුණුම V | නව දැව ගබඩා ලියා පදිංචි කිරීම - 2018 | 72 |
| ඇමුණුම VI | තෑගි මුදල් ගෙවීම - 2018 | 73 |
| ඇමුණුම VII | පුහුණු වැඩ සටහන් - 2018 | 74 – 75 |
| ඇමුණුම VIII | හදිසි වැටලීම් අංශයන්හි කාර්ය සාධනය - 2018 | 76 |
| ඇමුණුම IX | පැල හෝ අනෙකුත් වන නිෂ්පාදන සඳහා අපනයන බලපත්‍ර නිනුත් කිරීමෙන් ලද ආදායම ( සාමාන්‍යය සේවය ) 2018 | 77 |
| ඇමුණුම X | ඉරූ දැව, ලී බඩු, අත්කම්, සෙල්ලම් බඩු, පැල වර්ග හා වන ද්‍රව්‍ය වල අපනයන වාර්ෂික ආදායම හා එකතු කල අගය එක්දින සේවාව - 2018 | 78-79 |
| ඇමුණුම XI | ඉරූ දැව, ලී බඩු, අත්කම්, සෙල්ලම් බඩු වල වාර්ෂික ආදායම හා එකතු කල අගය සීඝ්‍රගාමීසේවාව (ලී බඩු හා වෙනත්) - 2018 | 80 |
| ඇමුණුම XII | ඉරූ දැව, ලී බඩු, අත්කම්, සෙල්ලම් බඩු වල වාර්ෂික ආදායම හා එකතු කල අගය සාමාන්‍ය සේවාව (ලී බඩු හා වෙනත්) – 2018 | 81 |
| ඇමුණුම XIII | පැල හා වෙනත් වන ද්‍රව්‍ය අපනයන බලපත්‍ර වාර්ෂික ආදායම සීඝ්‍රගාමී සේවය (පැල හා වන ද්‍රව්‍ය) - 2018 | 82 |
| ඇමුණුම XIV | පැල හා වෙනත් වන ද්‍රව්‍ය අපනයන බලපත්‍ර වාර්ෂික ආදායම එක්දින සේවාව (පැල හා වන ද්‍රව්‍ය) - 2018 | 83 |

# හැඳින්වීම

ජාතියේ සෞභාග්‍ය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ. මෙම මෙහෙවර සහතික කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් 2017 වර්ෂය තුලදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.එම වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩ කටයුතු පහත දක්වා ඇති අරමුණු කරා ළඟාවීමට විශාල වශයෙන් දායක විය.

- සමාජ සහ පාරිසරික ප්‍රතිලාභ තිරසාරව ලබා ගැනීම සහතික කිරීම සඳහා උපරිම වන ආවරණයක් සංරක්ෂණය කිරීම.
- රටේ දැව අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා හා දැව සැපයුම ඉහළ නැංවීම උදෙසා ජාතික වන වගා ස්ථාපනය කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම.
- ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය හා වන සංරක්ෂණ ආඥා පනතේ විධි විධාන වලට අනුකූලව වනාන්තරවල ආරක්ෂාව ශක්තිමත් කිරීම.
- රජයේත්, ප්‍රජාවගේත් පුද්ගලික අංශයේත් සහභාගිත්වයෙන් දේශයේ තුරු වැස්ම ඉහළ නැංවීම.
- පර්යේෂණ, අධ්‍යාපන සහ ව්‍යාප්ති යන අංශ ඔස්සේ ජාතික වන සම්පත් සංවර්ධනය සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම.
- ප්‍රජා වන කළමනාකරණ වැඩ කටයුතු සංවර්ධනය කිරීම.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාල මට්ටමේදී තාක්ෂණික අංශ 07 ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති ,වන විද්‍යා සහ වන කළමනාකරණ, වන සංගණන හා භූ විද්‍යා තොරතුරු, පරිසර සංරක්ෂණ හා කළමනාකරණ, වන පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන, වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීම සහ සැලසුම් සහ ප්‍රගති පාලන යන අංශ වේ. මෙයට අමතරව දෙපාර්තමේන්තුවේ එදිනෙදා මූල්‍ය කළමනාකරණ සහ පරිපාලන කටයුතු පිළිවෙලින් මුදල් අංශය සහ මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන අංශය යන අංශ මගින් සිදු කරයි.

මෙම අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩ කටයුතු පිළිබඳව දීර්ඝ තොරතුරු විස්තරයක් ඉදිරියේ දක්වා ඇති පරිච්ඡේද මගින් විග්‍රහ කෙරේ. මෙම ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව, මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි යන ස්ථාන වල පිහිටි දිසාවන කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම දිසාවන්ගේ කටයුතු  කොළඹ, රත්නපුරය, නුවරඑළිය, අනුරාධපුරය සහ කිළිනොච්චිය යන ස්ථාන වල ස්ථාපනය කර තිබෙන කළාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාල මගින් අධීක්ෂණය කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩ සටහන් නුවරඑළියේ පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යායතනයේදී එහි අධ්‍යක්ෂ/ වන සංරක්ෂක (අධ්‍යාපන) ගේ මූලිකත්වය යටතේ සිදු කරයි.

අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන) විසින් පර්යේෂණ කටයුතු, අධීක්ෂණය කර සම්බන්ධීකරණය කරනු ලැබේ. මෙම කටයුතු කුඹල්පොල සහ බදුල්ල යන ස්ථාන වල පිහිටි පර්යේෂණ මධ්‍යස්ථාන ඔස්සේ ක්‍රියාත්මක වේ.

# 1 වන පරිච්ඡේදය

## සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය

### 1.1 හැඳින්වීම

ජාතික මට්ටමේ ව්‍යාප්ති සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙන්ම සියළුම සහභාගිත්ව සහ සමාජ වන විද්‍යා වැඩ සටහන් සංවර්ධනය සහ අධීක්ෂණය, ව්‍යාප්ති වැඩ සටහන් සැලසුම් කිරීම සහ ඒ සඳහා බීජ පැල නිෂ්පාදනය, පුහුණු හා ව්‍යාප්ති වැඩ සටහන් සඳහා අවශ්‍ය කරන මුද්‍රිත ද්‍රව්‍ය සැකසීම සහ අවට ප්‍රජාව සඳහා නියමු මට්ටමේ ආදායම් උපදවන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යනාදී කටයුතුවල නිරතවීම සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශයේ වගකීම් වේ. මෙම අංශයට සහභාගිත්ව වන වගා සහ සහභාගිත්ව වන කළමනාකරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීමද පැවරී තිබේ. ස්වභාවික වනාන්තර වල සිදු කරන ප්‍රජා වන කළමනාකරණ කටයුතු වල වගකීමද පැවරී තිබෙන්නේ සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය වෙතය.

### 1.2 අංශයේ ප්‍රධාන කාර්ය භාරයන්

- මහජනයා සඳහා පොදු දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- වන විද්‍යා සංවර්ධන වැඩසටහන් පිළිබඳව විවිධ පාර්ශව කණ්ඩායම් වෙත ව්‍යාප්ති සේවාවන් සැපයීම.
- මහජනයා සම්බන්ධ කර ගන්නා විවිධ රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ඒ යටතේ
  - ✓ ගෙවතු සංවර්ධනය.
  - ✓ සහභාගිත්ව සංරක්ෂණ රුක් රෝපණ වැඩසටහන්.
  - ✓ මාර්ග දෙපස රුක් රෝපණය කිරීමේ වැඩසටහන්.
  - ✓ වන වගා / කෘෂි වන වගා
  - ✓ බීජ පැල නිෂ්පාදනය යනාදී කාර්යයන් ඉටුකරේ.
- ස්වභාවික වන සම්පත් ආරක්ෂා කිරීමට සහ කළමනාකරණය කිරීමට සහභාගිත්ව වන කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 1.3 ආයතනික සැකැස්ම

මෙම අංශය වන සංරක්ෂකවරයෙකුගේ ප්‍රධානත්වය යටතේ ක්‍රියාත්මක වේ. අංශයේ ප්‍රධාන කාර්ය භාරයන් ඉටු කිරීම සඳහා සහකාර වන සංරක්ෂකවරයෙක්, විශේෂ වන පාලකවරයෙක්, වැඩ සටහන් සහකාර - 01, ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර - 01, බීට්ටු වන නිලධාරි - 03, වන ව්‍යාප්ති නිලධාරි -02, වන ක්ෂේත්‍ර සහකාර නිලධාරි - 01 ක් හා අනෙකුත් කාර්ය මණ්ඩලය සහාය දක්වති. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සියල්ලම පාහේ කලාප නියෝජ්‍ය වන සංරක්ෂකවරු පස්දෙනාගේ අධීක්ෂණය යටතේ දිසා වන කාර්යාල මගින් මෙහෙයවනු ලබයි.

### 1.4. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් අයවැය යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

#### 1.4.1 බීජ පැළ සකස් කිරීම

වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන බීජ පැල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැල තවාන්වල නිපදවන ලදි. 2018 වසරේ නිපදවන ලද සම්පූර්ණ බීජ පැල සංඛ්‍යාව 558,850 කි.

නිපදවන ලද සම්පූර්ණ බීජ පැල සංඛ්‍යාවෙන් බීජ පැල 124,686 ක් අලෙවි කරන ලද අතර 283,382 ක් රුක් රෝපණ වැඩ සටහන් සඳහා අනෙකුත් රාජ්‍ය සහ වෙනත් ආයතනවලට නොමිලයේ

ලබාදෙන ලදි. ඉතිරිය " වනරෝපා" ජාතික රුක් රෝපණ වැඩ සටහන සහ ගෙවතු සංවර්ධන වැඩසටහන් වැනි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ සටහන් සඳහා යොදා ගන්නා ලදි.

### 1.4.2 දැනුවත් කිරීමේ සහ ව්‍යාප්ති වැඩ සටහන්

අංක 1.1 වගුවේ දැක්වෙන දැනුවත් කිරීමේ සහ වන ව්‍යාප්ති වැඩ සටහන් අදාල කාල පරිච්ඡේදය තුල සිදු කරන ලදි.

**වගුව 1. 1 - දැනුවත් කිරිමේ සහ වන ව්‍යාප්ති වැඩ සටහන්**

| වර්ගය | සංඛ්‍යාව |
|---|---:|
| දැනුවත් කිරීමේ වැඩ සටහන් | 1322 |
| රුක් රෝපණ වැඩ සටහන් | 786 |
| තරඟ සහ වෙනත් විශේෂ වැඩසටහන් | 247 |
| **එකතුව** | **2,355** |

### 1.4.3 සහභාගිත්ව රුක් රෝපණ වැඩ සටහන්

"වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබෙන ප්‍රධාන ආයතන අතුරින් එක් ආයතනයක් වන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. "වන රෝපා" වැඩසටහන යටතේ 2018 වර්ෂයේ හෙක්. 1,956.9 ක භූමි ප්‍රමාණයක් , පැල සිටුවීමේ කටයුතු වලට යොදා ගත් අතර ඒ සඳහා පැළ 2,153,479 ක් දෙපාර්තුමේන්තුව මඟින් බෙදා දෙන ලදී.

වන ව්‍යාප්ති වැඩ සටහනේ වාර්ෂික වැඩ සැලැස්ම යටතේ පහත සඳහන් රුක් රෝපණ කටයුතු සිදු කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 1.2 යටතේ දක්වා ඇත.

**වගුව 1.2 - රුක් රෝපණ ක්‍රියාකාරකම්**

| ක්‍රියාකාරකම් | වැඩ සටහන් සංඛ්‍යාව |
|---|---:|
| මාර්ග දෙපස රුක් රෝපණය කිරීම | 26 |
| ජලාධාරවල සහ ගං ඉවුරුවල රුක් රෝපණය කිරීම | 53 |
| පාසැල්වල රුක් රෝපණය කිරීම | 203 |
| අනෙකුත් රජයේ ආයතන භූමිවල රුක් රෝපණය කිරීම | 75 |
| ආගමික සිද්ධස්ථාන භූමිවල රුක් රෝපණය කිරීම | 41 |
| වෙනත් රුක් රෝපණ වැඩ සටහන් | 388 |
| **එකතුව** | **786** |

### 1.4.4 නව ගොවි වන වගා ස්ථාපනය කිරීම

මෙම වර්ෂය තුල ගොවි වන වගා හෙක්ටයාර් 101.2 ක් ස්ථාපනය කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 1.3 හි දැක්වේ.

වගුව **1 .3 -** නව ගොවි වන වගා ස්ථාපනය කිරීම

| දිසාව | වන වගා (හෙක්) | සහභාගි වූ ගොවියන් සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුරය | 20.2 | 42 |
| අම්පාර | 25 | 50 |
| බදුල්ල | 11 | 18 |
| ත්‍රිකුණාමලය | 05 | 10 |
| මඩකලපුව | 05 | 05 |
| මොණරාගල | 20 | 20 |
| මන්නාරම | 10 | 20 |
| වව්නියාව | 05 | 05 |
| **එකතුව** | **101.2** | **170** |

### 1.4.5 2016/2017 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු කිරීම

2016 සහ 2017 වර්ෂයන් තුළ ස්ථාපනය කරන ලද ගොවි වන වගා හෙක්ටයාර් 241 ක් විද්‍යාත්මකව කළමනාකරණය කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 1.4 හි දැක්වේ.

වගුව **1. 4 - 2016/2017** වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා නඩත්තු

| දිසාව | වන වගා ප්‍රමාණය. හෙක්. |
|---|---|
| බදුල්ල | 25.0 |
| හම්බන්තොට | 39.0 |
| අනුරාධපුරය | 40.0 |
| වව්නියා | 10.0 |
| අම්පාර | 20.0 |
| ත්‍රිකුණාමලය | 20.0 |
| මඩකලපුව | 15.0 |
| මන්නාරම | 15.0 |
| මොණරාගල | 41.0 |
| මහනුවර | 16.0 |
| **එකතුව** | **241** |

### 1.4.6 ගෙවතු සංවර්ධනය කිරීම

ගෙවතු 6087 ක් සඳහා බිජ පැල සපයා දීමෙන් සහ තාක්ෂණික සහය ලබා දීමෙන් සංවර්ධනය කරන ලදි. ශාක කළමනාකරණය කිරීමේ වැඩසටහන් 106 ක් ක්‍රියාත්මක කරන ලදි. වැඩිදුර තොරතුරු වගුව 1.5 මගින් දැක්වේ.

වගුව **1. 5 -** **ගෙවතු සංවර්ධනය සහ ශාක කළමනාකරණය කිරීම**

| දිසාව | සංවර්ධනය කරන ලද ගෙවතු ප්‍රමාණය | ශාක කළමනාකරණ වැඩ සටහන් |
|---|---|---|
| අනුරාධපුරය | 240 | 06 |
| පොලොන්නරුව | 300 | 05 |
| අම්පාර | 300 | 06 |
| කුරුණෑගල | 370 | 05 |
| මාතලේ | 300 | 06 |
| නුවරඑළිය | 254 | 04 |
| බදුල්ල | 300 | 04 |
| මහනුවර | 290 | 07 |
| ගම්පහ | 175 | 02 |
| පුත්තලම | 300 | 06 |
| රත්නපුරය | 220 | 08 |
| ගාල්ල | 230 | 02 |
| කෑගල්ල | 280 | 04 |
| මොණරාගල | 260 | 05 |
| මඩකලපුව | 300 | 05 |
| වව්නියාව | 150 | 04 |
| ත්‍රිකුණාමලය | 300 | 07 |
| හම්බන්තොට | 200 | 06 |
| මාතර | 280 | 04 |
| කළුතර | 225 | - |
| මන්නාරම | 300 | 04 |
| කිලිනොච්චි | 313 | 03 |
| මුලතිව් | 200 | 03 |
| **එකතුව** | **6087** | **106** |

### 1.4.7 වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන සන්නිවේදන මෙවලම් සැකසීම.

අදාළ වර්ෂය තුලදී රුක් සඟරා එකක් සහ පුවත් සඟරා දෙකක් ප්‍රකාශයට පත් කරන ලදි. මහජනතාව වනාන්තර සහ පරිසරය පිළිබඳ වඩාත් ඵලදායී ලෙස දැනුවත් කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් සැදුම් ලත් වීදි නාට්‍ය කණ්ඩායම විසින් නාට්‍ය දර්ශන වාර කිහිපයක් එළි දැක්වීමද සිදු කරන ලදි.

# 2 වන පරිච්ඡේදය
# වන විද්‍යා හා වන කළමනාකරණ අංශය

## 2.1 හැඳින්වීම

වන නිෂ්පාදන හා සේවා සැපයීම තහවුරු කරමින් තිරසාර ලෙස ස්වභාවික වනාන්තර හා වන වගා කළමනාකරණය කිරීම වන විද්‍යා හා වන කළමනාකරණ අංශයේ ප්‍රධාන වගකීම වේ. වන වගා ස්ථාපනය කිරීම හා කළමනාකරණය සහ රටේ වන ආවරණය ඉහල නැංවීම සඳහා හායනයට පත් වූ වනාන්තර ප්‍රතිස්ථාපනය කිරීම මෙම අංශය සතු ප්‍රධාන කාර්යයන් වේ. අස්වනු නෙලීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත වන වගා නිදහස් කිරීමට සහ එම කටයුතු අධීක්ෂණය කිරීමටද මෙම අංශය දායක වේ.

## 2.2 මෙම අංශයේ මූලික අරමුණු

i. 1995 වන ක්ෂේත්‍ර මහා සැලැස්ම මගින් යෝජනා කල පරිදි ස්වභාවික වනාන්තර සහ වන වගා සඳහා කළමනාකරණ සැලසුම් සකස් කිරීම.

ii. විවිධ වන වගා ශාක විශේෂ සඳහා වූ කළමනාකරණ සැලසුම් මගින් දක්වා ඇති පරිදි, වන විද්‍යාත්මක ප්‍රතිකර්ම සහ දැව හෙලීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.

iii. හායනයට පත් වූ වනාන්තර ඉඩම් ප්‍රතිස්ථාපනය කිරීම.

iv. නැවත වගා කිරීමේ කටයුතු සහ වනාන්තර නොවන ඉඩම් වනාන්තර බවට පත්කිරීමේ කටයුතු සහ ඉන්පසු නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීම.

v. පුද්ගලික අංශයේ වෙත බදුදුන්, පයිනස් වනවගා වල ඔලියෝ රෙසින් නිස්සාරණය අධීක්ෂණය කිරීම.

vi. තෝරාගත් රජයේ ඉඩම් වල සිදුකරන පෞද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

vii. ප්‍රාදේශිය වැවිලි සමාගම් සිය වතු වලින් දැව ලබා ගැනීම සඳහා පිළියෙල කරන ලද වන කළමනාකරණ සැලසුම් සමාලෝචනය කිරීම.

viii. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු සංචාරක බංගලා කළමනාකරණය සහ නඩත්තු කිරීම.

## 2.3 ආයතනික සැකැස්ම

මෙම අංශය වන සංරක්ෂකවරයකු යටතේ ක්‍රියාත්මක වේ.මෙම අංශයට අදාල සියලුම කාර්යයන් කලාප කාර්යාලවල සහ දිසා වන කාර්යාලවල කාර්ය මණ්ඩලවල සහය ඇතිව ඉටුකරයි. එම කාර්යයන් සැලසුම් කිරිම, සම්බන්ධිකරණය, පාලනය සහ සම්පත් වෙන්කිරිම යන කටයුතු සඳහා වන සංරක්ෂකවරයාට, මාණ්ඩලික නිලධාරින් දෙදෙනෙකුගේ සහාය ලැබේ. මෙයට අමතරව එක් සංවර්ධන සහකාරවරයෙකු සංවර්ධන නිලධාරින් දෙදෙනෙකු, එක් බීට්ටු වන නිලධාරියෙකු, කළමනාකරණ සහකාරවරු 02 ක්,වන ක්ෂේත්‍ර සහකාරවරු 03ක් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය මෙම කටයුතු වලට සහාය දක්වති.

## 2.4 ප්‍රධාන කාර්යයන් හා එහි සාරාංශ ගත ක්‍රියාකාරිත්වය

### 2.4.1 නැවත වන වගා කිරීම.

නැවත වන වගා කිරීම යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- දැව නිෂ්පාදනය සඳහා වන වගා ස්ථාපනය කිරීම.
- ආරක්ෂණ කටයුතු සඳහා වන වගා ස්ථාපනය කිරීම.
- පූර්ණ හෙළීම් සිදුකළ වන වගාවල දැව නිෂ්පාදනය සඳහා නැවත වන වගා කිරීම.
- පයිනස් වන වගා පුළුල් පත්‍ර මිශ්‍ර විශේෂ සහිත වගා බවට පරිවර්තනය කිරීම.
- පැලතවාන් ස්ථාපනය කිරීම සහ කළමනාකරණය කිරීම.
- කැලෑ ගිනි කළමනාකරණය කිරිම.
- නොමේරූ වන වගා වන කළමනාකරණය කිරිම.
- පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.
- මධ්‍යම කඳුකරයේ පිහිටි කඳු මුදුන් සංරක්ෂණය කිරීම.

### 2.4.2 වන විද්‍යාත්මක ප්‍රතිකර්ම සහ වන වගාවලින් අස්වැන්න ලබාගැනිම සැලසුම් කිරිම ,ක්‍රියාත්මක කිරිම සහ පාලනය කිරීම.

වන සම්පත් දත්ත පද්ධතිය උපයෝගී කර ගනිමින් වන වගාවලට සිදුකළ යුතු වනවිද්‍යාත්මක ප්‍රතිකර්ම හඳුනා ගැනීම. මෙම ප්‍රතිකර්ම මෙම අංශයේ වාර්ෂික වැඩ සැලසුමටද ඇතුලත්කර තිබේ. පුනර්ජනනීය කැපිම්, වානිජමය තුනී කිරිම්, පූර්ව වානිජ තුනී කිරිම්, ශුද්ධ කිරිම, පශ්චාත් හෙළීම සංගණනය සහ රිකිලි කළමනාකරණය වන විද්‍යාත්මක ප්‍රතිකර්ම වලට ඇතුලත් වේ. ඒ සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ සහය ලබාගෙන තිබේ.

### 2.4.3 රාජ්‍ය දැව සංස්ථාව සමඟ සම්බන්ධීකරණ කටයුතු වල නිරත වීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වන වගා වලින් දැව ලබා ගැනීමට බලය ලබාදී තිබෙන්නේ රාජ්‍ය දැව සංස්ථාව වෙත බැවින්, එම ආයතන සමග සම්බන්ධතාවයක් පවත්වා ගෙන රාජ්‍ය දැව සංස්ථාව විසින් ගෙවිය යුතු ස්කන්ධභාගය ක්‍රමානුකූලව ගණනය කිරීම සහ අය කිරීම සිදු කරන ලදි.

### 2.4.4 පයිනස් ඔලියො - රෙසින් නිස්සාරණ කටයුතු ක්‍රියාත්මක කිරීම

පයිනස් ඔලියො රෙසින් නිස්සාරණය සඳහා තෝරාගත් පෞද්ගලික අංශයේ සමාගම් වලට, පරිණත පයිනස් කැරිබියා වන වගා බඳු දීම හා එම කටයුතු අධීක්ෂණයසිදු කරනු ලබයි.

## 2.5 වනාන්තරවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකාවේ වන ආවරණය භූමි ප්‍රමාණයෙන් 29.7 % සිට 32% දක්වා ඉහළ නැංවීම සඳහා වනාන්තරවල ගුණාත්මක බව වැඩිකිරිමේ වැඩ සටහනක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේ දී ආරම්භ කරන ලදී. විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඉහත අරමුණු ඉටුකර ගැනීම වන විද්‍යා සහ වන කළමනාකරණ අංශය සතු වගකීමකි.

මෙම වැඩසටහන යටතේ වන ආවරණය ඉහල නැංවීම සඳහා ප්‍රධාන උපාය මාර්ග තුනක් හඳුනාගෙන තිබේ. ඒවානම්, දැනට තිබෙන වනාන්තර ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම, නව ප්‍රදේශවලට වනාන්තර ව්‍යාප්ත කිරීම සහ පුද්ගලික ඉඩම්වල තුරු ආවරණය ඉහල නැංවීමයි. ඉහත උපාය මාර්ග යටතේ 2018වර්ෂයතුල පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.

### 2.5.1 පාරිසරික ප්‍රතිස්ථාපනය

පාරිසරික ප්‍රතිස්ථාපනය මගින් මුලින් තිබූ වනාන්තර නැවත ස්ථාපනය කිරීම අරමුණ වේ. මෙයට ස්වභාවික පුනර්ජනනය ප්‍රවර්ධනය (සහායලද ස්වභාවික පුනර්ජනනය), බීජ වැපිරීම. විසිරුණු රුක් රෝපණය, සුපෝෂණය වගා කිරීම ඇතුලත් වේ. නොමේරූ බීජ පැල වල වර්ධනයට බාධා කරන අනවශ්‍ය සහ බාධා කරන වෘක්ෂලතා ඉවත් කිරීමෙන් බීජ ප්‍රරෝහනයට සහ ස්වභාවික පුනර්ජනනයට යෝග්‍ය තත්වයන් උදා කරයි. ලැව්ගිනි ඇතිවීම වැලැක්වීම, ගවයින් විසින් උලාකෑම වැලැක්වීම සහ මිනිසාගේ වෙනත් බලපෑම් වලින් ආරක්ෂා කිරීම නිර්දේශිත ක්‍රියාකාරම් වේ. මෙම ක්‍රම කලාපයේ වෙනත් රටවල් රුසක් ප්‍රායෝගිකව යොදාගෙන තිබෙන අතර සාර්ථක ප්‍රථිපල අත්කරදී තිබේ.

### 2.5.2 නැවත වන වගා කරන ලද බිම් නඩත්තු කිරීම

මෙම වසර තුල දී 2014 ,2015 සහ 2016 යන වසර වල දී ප්‍රතිස්ථාපනය කරන ලද ප්‍රදේශ නඩත්තු කරන ලදී. මේ යටතේ ප්‍රතිස්ථාපනය කරන ලද හෙක්ටයාර 7583 ක් නඩත්තු කරන ලදී.

### 2.5.3 නැවත රුක් රෝපණය සිදුකල ප්‍රදේශ නඩත්තු කිරීම

මිශ්‍ර දේශීය විශේෂ යොදා ගනිමින් වසර 2015 සහ 2014 යන වර්ෂ වල දී ප්‍රතිස්ථාපනය කරන ලද ඉඩම් මෙම වසර තුල දී නඩත්තු කරන ලදී. මේ යටතේ වනවගා හෙක්:420 ක නඩත්තු කටයුතු සිදුකරන ලදී.

## 2.6 2018 වසර තුල දී සිදු කරන ලද ක්‍රියාකාරකම් වල ප්‍රගතිය.

### 2.6.1 නැවත වනවගා කිරීමේ වැඩ සටහන - 2018

මෙය යටතේ මෙම කාල පරිච්ඡේදය තුල මෙම අංශය විසින් පූර්ණ හෙලීම් සිදුකල වන වගා වල වන වගා හෙක්ටයාර් 951.7 ක් ස්ථාපනය කරන ලදී. මෙම වැඩ සටහන පිලිබඳ වැඩිදුර තොරතුරු වගුව අංක 2.1 මගින් දක්වා තිබේ.

වගුව **2.1 -** නැවත වන වගාකිරීමේ වැඩ සටහන **- 2018**

| දිස්ත්‍රික්කය | පැරණි විශේෂය | අළුතින් ස්ථාපනය කරන ලද විශේෂය | ඉලක්කය (හෙක්ටයාර්) | ප්‍රගතිය (හෙක්ටයාර්) |
|---|---|---|---|---|
| අම්පාර | තේක්ක | තේක්ක/කායා | 142 | 142 |
| අනුරාධපුර | තේක්ක | තේක්ක/කායා | 109.5 | 109.5 |
| පොළොන්නරුව | තේක්ක | හල්මිල්ල | 62 | 62 |
| මඩකලපුව | තේක්ක | කායා | 150 | 150 |
| මුලතිව් | තේක්ක | තේක්ක | 50 | 50 |
| වවුනියාව | තේක්ක | තේක්ක | 35 | 35 |
| මාතලේ | තේක්ක | තේක්ක | 33 | 33 |
| මොණරාගල | තේක්ක | තේක්ක | 52.4 | 52.4 |
| බදුල්ල | ඉයුකැලිප්ටස්/පයිනස් | ඉයුකැලිප්ටස්/කායා | 67.6 | 67.6 |
| නුවරඑළිය | ඉයුකැලිප්ටස්/පයිනස් | ඉයුකැලිප්ටස් | 43.2 | 43.2 |
| කළුතර | පයිනස්/මිශ්‍ර | හොර/මිශ්‍ර | 40 | 37.5 |
| කුරුණෑගල | තේක්ක | තේක්ක | 59.1 | 59.1 |
| ගම්පහ | ඇකේෂියා | දේශීය විශේෂ | 12 | 10 |
| පුත්තලම | තේක්ක/කායා | කුඹුක් | 40 | 40 |

| | | | | |
|---|---|---|---|---|
| රත්නපුර | කායා/හල්මිල්ල | ඉයුකැලිප්ටස්/ඇකේෂියා | 30 | 30 |
| මාතර | පයිනස් | හොර/ මිශ්‍ර | 30.4 | 30.4 |
| **එකතුව** | | | **956.2** | **951.7** |

### 2.6.2 බීජ පැල නිෂ්පාදනය - 2018

ඉහත නැවත වන වගා කිරීමේ වැඩසටහන සඳහා බීජ පැල 1748639 ක් නිෂ්පාදනය කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 2.2 මගින් දැක්වේ. මෙහිදී තේක්ක, ඉයුකැලිප්ටස් සහ දේශීය විශේෂ මෙම නැවත වන වගා කිරීමේ වැඩසටහන සඳහා භාවිතා කරන ලදී.

**වගුව 2.2 - බීජ පැල නිෂ්පාදනය- 2018**

| දිස්ත්‍රික්කය | විශේෂය | බීජ පැල සංඛ්‍යාව |
|---|---|---|
| අම්පාර | තේක්ක/කායා | 249920 |
| අනුරාධපුරය | තේක්ක/කායා | 203209 |
| මඩකලපුව | කායා | 240000 |
| පොළොන්නරුව | හල්මිල්ල | 99200 |
| රත්නපුර | කායා/මී/කඹුක්/මාදං/දිවුල්/කොස්/හල්මිල්ල /මිල්ල | 48000 |
| මාතර | හොර | 55500 |
| මාතලේ | තේක්ක/කායා | 80000 |
| මහනුවර | දේශීය වර්ග/ මිශ්‍ර | 12000 |
| නුවරඑළිය | ඉයුකැල්ප්ටස් | 81000 |
| මොණරාගල | තේක්ක | 74200 |
| බදුල්ල | ඉයුකැලිප්ටස්/කායා | 149770 |
| කළුතර | හොර / මිශ්‍ර | 51000 |
| කුරුණෑගල | තේක්ක | 129000 |
| ගම්පහ | මැහෝගනී | 50000 |
| පුත්තලම | කායා/කුඹුක් | 68000 |
| මන්නාරම | තේක්ක | 7840 |
| මුලතිව් | තේක්ක | 88000 |
| වවුනියා | තේක්ක | 62000 |
| **එකතුව** | | **1748639** |

### 2.6.3 නොමේරූ වන වගා නඩත්තු කිරීම - 2018

වන වගා නඩත්තු කිරීමේ වැඩ සටහන යටතේ වල් නෙලීම, පොහොර යෙදීම, ලැව් ගිනි වැලැක්වීම සහ පාළු පැල සිටුවීම යන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කරන ලදී. අදාල වර්ෂය තුල වන වගා හෙක්ටයාර 2349.44 ක නඩත්තු කටයුතු සිදු කරන ලදි. වැඩිදුර තොරතුරු වගුව 2.3 මගින් දැක්වේ.

වගුව **2.3** **- නොමේරූ වන වගා නඩත්තු කිරීම. –2018**

| දිස්ත්‍රික්කය | 2016 වසරේ ස්ථාපිත වසර 01ක් වයසැති වන වගාප්‍රමාණය (හෙක්ටයාර) | | | 2015 වසරේ ස්ථාපිත වසර දෙකක් වයසැති වන වගා (හෙක්ටයාර) | | | 2014 වසරේ ස්ථාපිත වසර 3ක් වයසැති වන වගා (හෙක්ටයාර) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | විශේෂය | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | විශේෂය | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | විශේෂය | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) |
| කුරුණෑගල | තේක්ක | 83.34 | 83.34 | තේක්ක/ කායා | 62.61 | 62.61 | තේක්ක/ කායා | 95.46 | 95.46 |
| ගම්පහ | - | - | - | - | | | හොර/මිශ්‍ර | 24.8 | 24.8 |
| පුත්තලම | | | | තේක්ක | 54.4 | 54.4 | - | - | - |
| කළුතර | හොර / මිශ්‍ර | 31 | 31 | හොර | 25 | 25 | හොර | 15 | 15 |
| අනුරාධපුරය | තේක්ක/ කායා හල්මිල්ල | 101.4 | 101.4 | තේක්ක | 79.8 | 79.8 | | 72 | 72 |
| අම්පාර | තේක්ක/ කායා | 87 | 87 | තේක්ක | 85 | 85 | තේක්ක | 72 | 72 |
| පොළොන්නරුව | කායා/හල්මිල්ල/ කොහොඹ | 75 | 75 | | 35 | 35 | | 50 | 50 |
| මඩකලපුව | කායා | 55 | 55 | කායා | 25 | 25 | කායා | 20 | 20 |
| ත්‍රිකුණාමලය | | | | තේක්ක | 56 | 56 | - | - | - |
| වවුනියාව | තේක්ක | 31 | 31 | තේක්ක | 35 | 35 | - | - | - |
| මුලතිව් | තේක්ක | 48 | 48 | තේක්ක | 40 | 40 | තේක්ක | 20 | 20 |
| මහනුවර | - | - | - | | | | දේශීය විශේෂ | 10 | 10 |
| නුවරඑළිය | ඉයුකැලිප්ටස් | 51 | 51 | ඉයුකැලිප්ටස් | 74.8 | 74.8 | ඉයුකැලිප්ටස් | 22.8 | 22.8 |
| මොණරාගල | තේක්ක | 50.3 | 50.3 | තේක්ක/කායා | 110.95 | 110.95 | තේක්ක/ කායා | 58.04 | 58.04 |
| මාතලේ | කායා | 69.6 | 69.6 | කායා | 75.0 | 75.0 | තේක්ක | 75 | 75 |
| බදුල්ල | ඉයුකැලිප්ටස් | 60.2 | 60.2 | ඉයුකැලිප්ටස් | 54 | 54 | ඉයුකැලි/ සයිප්‍රස් | 35 | 35 |
| රත්නපුර | මිශ්‍ර | 30 | 30 | | | | මිශ්‍ර | 16 | 16 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| මාතර | හොර / මිශ්‍ර | 36.4 | 36.4 | හොර / මිශ්‍ර | 42.2 | 42.2 | හොර / මිශ්‍ර | 27.4 | 27.4 |
| හම්බන්තොට | තේක්ක | 17.6 | 17.6 | මිශ්‍ර | 10 | 10 | - | - | - |
| කෑගල්ල | - | - | - | මිශ්‍ර | 19.84 | 19.84 | - | - | - |
| **එකතුව** | | **826.84** | **826.84** | | **884.6** | **884.6** | | **613.5** | **613.5** |

## 2.7 වන වගාවල වන විද්‍යාත්මක මෙහෙයුම් - 2018

අදාල වර්ෂය තුලදී තෝරාගත් ඇතැම් වන වගාවල පහත සදහන් වන විද්‍යාත්මක මෙහෙයුම් සිදු කරන ලදි.

- පූර්ව වානිජමය තුනී කිරීම්
- වානිජමය තුනී කිරීම්
- පශ්චාත් හෙළීම් සංගණනය
- රිකිලි නඩත්තු කිරීම
- ශුද්ධ කිරීම

### 2.7.1 පූර්ව වානිජමය තුනීකිරීම්

දිස්ත්‍රික්ක 8 ක තේක්ක, ඉයුකැලිප්ටස් සහ කායා වන වගාවල පූර්ව වානිජමය තුනී කිරීම් සිදු කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 2.4 මගින් දැක්වේ.

**වගුව 2.4 - පූර්ව වානිජමය තුනී කිරීම් - 2018**

| **දිස්ත්‍රික්කය** | **විශේෂය** | **ඉලක්කය (හෙක්)** | **ප්‍රගතිය (හෙක්)** |
|---|---|---|---|
| රත්නපුර | ඉයුකැලිප්ටස්/ තේක්ක | 57 | 57 |
| බදුල්ල | තේක්ක/ ඉයුකැලිප්ටස් | 27.8 | 27.8 |
| නුවරඑළිය | ඉයුකැලිප්ටස් | 3 | 3 |
| මාතලේ | කායා | 29 | 29 |
| මොණරාගල | තේක්ක | 40.3 | 40.3 |
| මහනුවර | ඉයුකැලිප්ටස් | 14.5 | 14.5 |
| අනුරාධපුර | තේක්ක/කායා | 49.6 | 49.6 |
| කුරුණෑගල | තේක්ක/කායා | 261.32 | 311.12 |
| **එකතුව** | | **482.52** | **532.32** |

### 2.7.2 වානිජමය තුනී කිරීම්

දිස්ත්‍රික්ක 08 ක පිහිටි තේක්ක සහ ඉයුකැලිප්ටස් වන වගාවල තුනී කිරීම් සිදුකරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 2.5 මගින් දැක්වේ.

**වගුව 2. 5 - වානිජමය තුනී කිරීම් - 2018**

| දිස්ත්‍රික්කය | විශේෂය | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) |
|---|---|---|---|
| රත්නපුරය | තේක්ක | 32.2 | 32.2 |
| හම්බන්තොට | තේක්ක | 50 | 50 |
| මාතලේ | කායා | 50 | 50 |

| | | | |
|---|---|---|---|
| නුවරඑළිය | ඉයුකැලිප්ටස් | 187 | 155 |
| බදුල්ල | ඉයුකැලිප්ටස් | 232 | 258.3 |
| අනුරාධපුරය | තේක්ක | 66 | 66 |
| කුරුණෑගල | තේක්ක | 37.8 | 37.8 |
| පුත්තලම | කායා | 46.49 | 46.48 |
| එකතුව | | **701.49** | **695.78** |

### 2.7.3 පරිනත වන වගාවල පුනර්ජනනීය හෙලීම්

නැවත වන වගා කිරීමේ කටයුතු සඳහා වනවගාවල සිදු කරන පුනර්ජනනීය කැපීම් මෙම ක්‍රියාකාරකමට අයත්වේ. (වගුව 2.1) ඇතැම් කඳුකර ඉයුකැලිප්ටස් වන වගාද පූර්ණ හෙලිම්වලට ලක්කර ඒවායේ වැඩිපුර තේක්ක විශේෂ රෝපණය කරන ලදී. තෝරාගත් ඇතැම් මේරූ පයිනස් වගාවන් පූර්ණ හෙලීම් වලට ලක්කර හොර, ඉයුකැලිප්ටස් සහ දේශීය විශේෂ මගින් ආදේශ කර තිබේ. වියලි කලාපීය තේක්ක වන වගා දෙවන වටයේදිද, ප්‍රධාන වශයෙන් තේක්ක යොදා ගනිමින් නැවත ස්ථාපනය කර තිබේ. කෙසේවුවද, අලින්ගේ තර්ජන දැඩිව තිබෙන ප්‍රදේශවල තේක්ක වෙනුවට කායා සහ දේශීය විශේෂ වගා කරන ලදී. මෙම ක්‍රියාකාරකම් ඉයුකැලිප්ටස් , පයිනස් සහ තේක්ක කළමනාකරණ සැලසුම්වලට අනුකූලව සිදු කරන ලදි.

### 2.7.4 පශ්චාත් හෙලීම් සංගණනය

වන වගාවල පූර්ණ වානිජමය තුනි කිරිම් හෝ වානිජමය තුනි කිරිම් සිදු කිරිමෙන් පසු පශ්චාත් හෙලීම් සංගණනය සිදු කරන ලදි. (වගුව 2.6)

වගුව **2.6 -** **පශ්චාත් හෙලීම් සංගණනය - 2018**

| **දිස්ත්‍රික්කය** | **විශේෂය** | **ඉලක්කය (හෙක්)** | **ප්‍රගතිය (හෙක්.)** |
|---|---|---|---|
| පුත්තලම | තේක්ක/කායා | 46.49 | |
| කුරුණෑගල | තේක්ක/කායා | 299.12 | 373.62 |
| මාතලේ | කායා | 79 | 29 |
| නුවරඑළිය | ඉයුකැලිප්ටස් | 260.2 | 271.2 |
| මොණරාගල | තේක්ක | 40.3 | 40.3 |
| මහනුවර | ඉයුකැලිප්ටස් | 14.5 | 14.5 |
| බදුල්ල | ඉයුකැලිප්ටස් /තේක්ක | 390.8 | 91.3 |
| අනුරාධපුර | තේක්ක | 115.6 | 49.6 |
| හම්බන්තොට | තේක්ක | 50 | |
| රත්නපුරය | ඉයුකැලිප්ටස් /තේක්ක | 89.2 | 57 |
| **එකතුව** | | **1385.21** | **926.52** |

### 2.7.5 රිකිලි නඩත්තු කිරිම

සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ. (වගුව 2.7)

වගුව **2.7 -** **රිකිලි නඩත්තු කිරිම-2018**

| දිස්ත්‍රික්කය | විශේෂය | ඉලක්කය(හෙක්.) | ප්‍රගතිය(හෙක්.) |
|---|---|---|---|
| පොලොන්නරුව | ඉයුකැලිප්ටස් | 92 | 92.00 |
| **එකතුව** | | **92** | **92.00** |

### 2.7.6 ශුද්ධ කිරීම.

හෙක්ටයාර් 152.6 ක ශුද්ධ කිරීමේ කටයුතු පහත පරිදි සිදු කරන ලදී (වගුව 2.8)

වගුව **2.8 - ශුද්ධ කිරීම - 2018**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්ටයාර්) | ප්‍රගතිය (හෙක්ටයාර) |
|---|---|---|
| අනුරාධපුරය | 15 | 15 |
| අම්පාර | 26 | 26 |
| මඩකලපුව | 50 | 50 |
| මන්නාරම | 30 | 30 |
| බදුල්ල | 20 | 55 |
| නුවරඑළිය | 17 | 49.4 |
| මහනුවර | 14.5 | 14.5 |
| මාතලේ | 18.5 | 18.7 |
| පුත්තලම | 25 | 25 |
| කුරුණෑගල | 27.5 | 46.1 |
| කළුතර | 20 | 42.9 |
| රත්නපුර | 25 | 25 |
| හම්බන්තොට | 25 | 35 |
| **එකතුව** | **313.5** | **432.6** |

### 2.7.7 මධ්‍යම කඳුකරයේ කඳුමුදුන් සංරක්ෂණය කිරීම.

වගුව **2.9** - මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් නඩත්තු කිරීම **(2017** වර්ෂයේ දී ස්ථාපනය කරන ලද)

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්ටයාර්) | ප්‍රගතිය (හෙක්ටයාර) |
|---|---|---|
| මාතලේ | **6.4** | **6.4** |
| බදුල්ල | **55.0** | **55.0** |
| එකතුව | **61.4** | **61.4** |

වගුව **2.10 -** මධ්‍යම කඳුකරයේ කඳුමුදුන් නඩත්තු කිරීම **(2015** වර්ෂයේ දී ස්ථාපනය කරන ලද)

| දිසත්‍රික්කය | ඉලක්කය (හෙක්ටයාර) | ප්‍රගතිය (හෙක්ටයාර) |
|---|---|---|
| නුවරඑළිය | 20.0 | 20.0 |
| බදුල්ල | 22.5 | 22.5 |
| එකතුව | **42.5** | **42.5** |

### 2.7.8 පයිනස් වනවගා පුළුල් පත්‍ර සහිත වනවගා බවට පරිවර්තනය කිරීම

වගුව **2.11 -** පුළුල් පත්‍ර සහිත වනවගා ස්ථාපනය කිරීම

| දිස්ත්‍රික්ක්ය | ඉලක්කය (හෙක්ටයාර් | ප්‍රගතිය (හෙක්ටයාර්) |
|---|---|---|

| | | |
|---|---|---|
| මාතර | **4.8** | **4.8** |
| බදුල්ල | **20.5** | **20.5** |
| එකතුව | **25.3** | **25.3** |

වගුව **2.12 - 2017** වර්ෂයේ දී ස්ථාපනය කරන ලද පුළුල් පත්‍ර සහිත වනවගා නඩත්තු කිරීම

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්ටයාර්) | ප්‍රගතිය (හෙක්ටයාර්.) |
|---|---|---|
| මහනුවර | 24.0 | 24.0 |
| ගාල්ල | 16.0 | 16.0 |
| නුවරඑළිය | 2.0 | 3.5 |
| එකතුව | **42.0** | **43.5** |

වගුව **2.13 - 2016** වර්ෂයේ දී ස්ථාපනය කරන ලද පුළුල් පත්‍ර සහිත වනවගා නඩත්තු කිරීම

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්ටයාර්) | ප්‍රගතිය (හෙක්ටයාර්.) |
|---|---|---|
| රත්නපුරය | 20.4 | 20.4 |
| එකතුව | **20.4** | **20.4** |

වගුව **2.14 - 2015** වර්ෂයේ දී ස්ථාපනය කරන ලද පුළුල් පත්‍ර සහිත වනවගා නඩත්තු කිරීම

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්ටයාර්) | ප්‍රගතිය (හෙක්ටයාර්.) |
|---|---|---|
| රත්නපුරය | 27.0 | 27.0 |
| එකතුව | **27.0** | **27.0** |

### 2.7.9 වනාන්තරවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ වැඩ සටහන

පහත දැක්වෙන පරිදි ක්‍රියාකරකම් සිදුකරන ලදී ( වගුව **2.15** )

වගුව **2.15 -** වනාන්තරවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීමේ වැඩ සටහන

| | වැඩසටහන | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) |
|---|---|---|---|
| 1 | සහාය ලබාදෙන ලද ස්වභාවික පුනර්ජනනය බිම් නඩත්තු කිරීම (1 වන වසර) | 600 | 600 |
| 2 | සහාය ලබාදෙන ලද ස්වභාවික පුනර්ජනනය සිදුකල බිම් නඩත්තුව (2 වන වසර/4 වන වසර) | 6563 | 6563 |
| 3 | නැවත වනවගා බිම් නඩත්තුව | 420 | 420 |
| | එකතුව | **7583** | **7583** |

### 2.7.10 පයිනස් වන වගා වලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම. –2018

පහත සඳහන් පුද්ගලික අංශයේ සංවිධාන 5, සිය වානිජ මට්ටමේ රෙසින නිස්සාරණ කටයුතු වලට අදාල

ගිවිසුම් දීර්ඝ කරන ලද අතර එම වන වගා වල රෙසින් නිස්සාරණ කටයුතු 2018 වර්ෂය පුරා සිදු කරන ලදී. මීට අදාල තොරතුරු වගුව 2.16 මගින් දැක්වේ.

1. කොනිපර් ප්‍රොඩක්ට්ස් ප්‍රොසෙසින් (පුද්ගලික) සමාගම.

2. ඔරියන්ටල් රෙසින් (පුද්ගලික) සමාගම

3. පයනියර් ලංකා පයිනස් (පුද්ගලික) සමාගම
4. JCT කෙමිකල්ස් (පුද්ගලික) සමාගම
5. විලව් මොබයිල්

වගුව **2.16 - 2018** වර්ෂයේදී බදු දුන් ඉඩම් ප්‍රමාණය සහ ලබාගත් බදු ආදායම.

| සංවිධානයේ නම | බදු දුන් ඉඩම් ප්‍රමාණය (හෙක්.) | බදු ආදායම (රුපියල්) |
|---|---|---|
| 1. කොනිෆර් ප්‍රොඩක්ට්ස් ප්‍රොසෙසින් (පුද්) සමාගම | 34.3 | 224596.18 |
| 2. ඔරියන්ටල් රෙසින්ස් (පුද්) සමාගම | 343.14 | 2060161.92 |
| 3. පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම | 354.8 | 2199885.51 |
| 4. ජේ.සී.ටී. කෙමිකල්ස් (පුද්) සමාගම | 198.9 | 1105633.39 |
| 5. විලව් මෝබයිල් | 35.5 | 418553.52 |
| **එකතුව** | **966.64** | **6,008,830.52** |

### 2.7.11 2018 වර්ෂය තුල මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ස්කන්ධ භාගය

රාජ්‍ය දැව සංස්ථාව විසින් 2018 වර්ෂය සඳහා ගෙවිය යුතු සම්පූර්ණ ස්කන්ධ භාගය රු: 1,033,853,193.16 කි. මෙයට පරිණත වන වගා කළමනාකරණය මගින් ලබා ගන්නා දැව වල වටිනාකම වන රු109,299,339.05 ද, පුනර්ජනනිය කැපීම් මගින් ලබා ගන්නා දැවවල වටිනාකම වන රු. 869,568,976.40 ද, වන අපරාධ වලින් අත්පත් කරගෙන රාජ්‍ය දැව සංස්ථාවට ලබාදුන් දැවවල වටිනාකම වන රු. 54,984,877.71 ද ඇතුලත්වේ.

### 2.7.12 පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන

පුද්ගලික අංශය සතු සම්පත් , වන වගා සංවර්ධනය සඳහා උපයෝගී කර ගැනීමේ අරමුණින් පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩ සටහන නිර්මාණය කර තිබේ. මෙම වැඩ සටහනේ අදියර දෙකක් වසර 2000 දී සහ 2002 දී දියත් කරන ලදි.2018 වර්ෂයේදී පුද්ගලික අංශය සමග ඇති කර ගත් ගිවිසුම් අනුව නැවත වන වගා කිරීමේ වැඩසටහනේ තත්ත්වය වගුව 2.17 මගින් දැක්වේ.

වගුව **2.17 -** පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහනේ තත්ත්වය **- 2018**

| දිස්ත්‍රික්කය | අඩවිය | ගිවිසුම් අංකය | විශේෂය | අදියර | | ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|---|---|---|---|
| | | | | I | II | |
| කුරුණෑගල | ගල්ගමුව | 1070 | තේක්ක | ✓ | | 17.80 |
| | ගල්ගමුව | 1108 | තේක්ක | ✓ | | 11.42 |
| | ගල්ගමුව | 1091 | තේක්ක | ✓ | | 6.244 |
| අනුරාධපුරය | අනුරාධපුරය | 2002/01 | තේක්ක | | ✓ | 40.00 |
| | අනුරාධපුරය | 2002/09 | තේක්ක | | ✓ | 83.00 |
| | කැකිරාව | 2002/07 | තේක්ක | | ✓ | 35.00 |
| | කැකිරාව | 2002/05 | තේක්ක | | ✓ | 4.00 |
| | අනුරාධපුරය | 2002/12 | තේක්ක | | ✓ | 4.00 |
| | අනුරාධපුරය | 17 | තේක්ක | ✓ | | 20.234 |
| | කැකිරාව | 177 | තේක්ක | ✓ | | 4.00 |
| | කැකිරාව | 234 | තේක්ක | ✓ | | 14.77 |
| | අනුරාධපුරය | 230 | තේක්ක | ✓ | | 4.02 |
| | අනුරාධපුරය | 168 | තේක්ක | ✓ | | 6.02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පොළොන්නරුව | හබරණ | 2002/26 | මිශ්‍ර විශේෂ | | ✓ | 47.00 |
| මාතලේ | නාඋල | 1180 | තේක්ක | ✓ | | 9.50 |
| | නාඋල | 1228 | තේක්ක | ✓ | | 4.00 |
| | නාඋල | 2002/15 | තේක්ක | | ✓ | 3.00 |
| | නාඋල | 2002/20 | තේක්ක / කාායා | | ✓ | 90.00 |
| | නාඋල | 2002/18 | තේක්ක | | ✓ | 5.00 |
| | නාඋල | 2002/16 | තේක්ක | | ✓ | 4.00 |
| **එකතුව** | | | | **10** | **10** | **413.008** |

### 2.7.13 වන වගා වලින් ලද අස්වැන්න

අදාල වර්ෂය තුල දී සිදු කරන ලද විවිධ දැව හෙලීම් සහ වන විද්‍යාත්මක ප්‍රතිකර්ම මගින් ලබාගත් දැව ප්‍රමාණය සාරාංශයක් ලෙස වගුව 2.18 මගින් දැක්වේ. මෙම ක්‍රියාකාරකම් වලට පූර්ව වානිජමය තුනී කිරීම්, වානිජමය තුනී කිරීම්, පුනර්ජනන හෙලීම් ඇතුලත් වේ. සංවර්ධන ව්‍යාපෘති සඳහා වනාන්තර හෙලි කිරීමෙන් ලද දැව ද මෙයට ඇතුලත් වේ. 2018 වසර තුල දී රජයේ වනාන්තර වලින් ලබාගත් සියලුම දැව වල අලෙවි වටිනාකම රුපියල් 3,295,209,036.70.

**වගුව 2.18 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වනවගා වලින්/වනාන්තර වලින් ලද අස්වැන්න - 2018**

| කඳන් වර්ගය | තුනී කිරීම් වලින් ලද අස්වැන්න (ඝන මීටර්) | පුනර්ජනන හෙලීම් මගින් ලද අස්වැන්න (ඝන මීටර්) | සංවර්ධන ව්‍යාපෘති මඟින් ලද අස්වැන්න | පරිත්‍යාග ලෙස ලැබුණු දැව මඟින් ලද අස්වැන්න | වන අපරාධ යටතේ ලැබුණු දැව | එකතුව | වෙළෙඳපොල වටිනාකම රුපියල් (බදු සහිතව) | වෙළෙඳපොල වටිනාකම රුපියල් (බදු රහිතව) |
|---|---|---|---|---|---|---|---|---|
| තේක්ක කඳන් (ඝන මීටර්) | 2,427 | 32,359 | 247 | 613 | 265 | 35,911 | 1,913,501,649.50 | 1,630,636,188.27 |
| නැදුන් කඳන් (ඝන මීටර්) | - | - | - | 18 | 6 | 24 | 914,448.00 | 779,268.73 |
| මැහෝගනී කඳන් (ඝන මීටර්) | - | 8 | 1 | 881 | 124 | 1,014 | 42,784,716.00 | 36,460,018.85 |
| මිල්ල කඳන් (ඝන මීටර්) | - | 7 | 209 | 34 | 4 | 254 | 7,213,452.10 | 6,147,115.70 |
| තේක්ක.නැදුන්,මැහෝගනී සහ මිල්ල හැරුණුවිට වෙනත් අති විශේෂ කඳන් (ඝන මීටර්) | - | 39 | 329 | 1,341 | 534 | 2,244 | 99,401,063.04 | 84,706,992.85 |
| විශේෂ පන්තියේ ඉහල සහ විශේෂ පන්තියේ | 509 | 824 | 2,317 | 2,104 | 163 | 5,917 | 144,455,196.60 | 123,100,950.15 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| කඳන් (ඝන මීටර්) | | | | | | | | |
| පලමු පන්තියේ කඳන් (ඝන මීටර්) | 9 | 518 | 1,293 | 1,840 | 67 | 3,727 | 62,979,869.16 | 53,669,801.55 |
| දෙවන පන්තියේ කඳන් (ඝන මීටර්) | 730 | 5,823 | 63 | 3,220 | 142 | 9,978 | 153,941,583.46 | 131,185,001.56 |
| තෙවන පන්තියේ කඳන් (ඝන මීටර්) | 3 | 152 | 1,830 | 2,940 | 359 | 5,282 | 28,082,101.67 | 23,930,834.46 |
| පයිනස් කඳන් (ඝන මීටර්) | 5 | 36,286 | 1,438 | 5,802 | 226 | 43,756 | 880,203,742.40 | 750,086,667.44 |
| ඉරන ලද දැව (ඝන මීටර්) | - | - | 244 | 342 | 322 | 908 | 79,676.209.89 | 67,897,987.56 |
| විදුලි සම්ප්‍රේෂණ කණු (සංඛ්‍යාව) | 8031 | 243 | 67 | - | - | 8,341 | 86,487,829.00 | 73,702,671.67 |
| සිල්පර (සංඛ්‍යාව) | - | 23,140 | - | 79 | - | 23,219 | 247,259,131.00 | 210,707,781.20 |
| දර (ඝන මීටර්) | 6,153 | 33,561 | 24,907 | 13,868 | 133 | 78,622 | 47,330,143.00 | 40,333,513.17 |
| වැටකණු (සංඛ්‍යාව) | 39,198 | 37,270 | 13,511 | 42 | 435 | 90,456 | 11,759,280.00 | 10,020,951.65 |
| වැටකණු (සංඛ්‍යාව) | 59,176 | 14,178 | 3,140 | 4,649 | 1,692 | 82,835 | 14,827,465.00 | 12,635,578.87 |
| පිටපලු (සංඛ්‍යාව) | 275 | 3,723 | - | 51 | 43 | 4,092 | 605,616.00 | 516,090.16 |
| අලි වැටවල කණු (සංඛ්‍යාව) | 7,220 | 2,221 | 2,186 | - | - | 11,627 | 45,403,435.00 | 38,691,622.87 |
| එකතුව | | | | | | | **2,861,543,53** | **3,295,209,036.70** |

### 2.7.14 2018 වර්ෂයේ දී සංචාරක බංගලා වලින් ලද ආදායම

සංචාරක බංගලා, සංරක්ෂණ මධ්‍යස්ථාන, නැරඹුම් කුටි සහ කඳවුරු බිම් මහජනයාගේ පරිහරනයට ලබාදීමෙන් රු:8,828,099.01 ක මුදලක් උපයාගෙන තිබේ. මේ පිලිබද වැඩිදුර තොරතුරු වගුව 2.19 දක්වා තිබේ.

වගුව **2.19 :** සංචාරක බංගලා වලින් ලද ආදායම - 2018

| සංචාරක බංගලාවේ නම | ආදායම (රුපියල්) |
|---|---|
| අනුරාධපුර සංචාරක බංගලාව | 197455.00 |
| නුවරඑළිය | 160080.50 |
| පට්ටිපොල | 13800.00 |
| කුඹල්පොල | 32258.50 |
| තණමල්විල | 40595.00 |
| මින්නේරිය | 137410.00 |
| නාඳුගල | 575.00 |
| ඔහිය | 225687.50 |
| හම්බන්තොට | 8280.00 |
| මහනුවර | 62560.00 |
| කතරගම | 102975.00 |
| හපුතලේ | 142427.00 |
| කන්නේලිය | 1351558.00 |
| දුම්බර වන නිවහන | 1065785.00 |
| කන්නෙලිය කා.අංක 4 | 2357.50 |
| ඩීන්ස්ටන් ස.ම | 206287.00 |
| කන්දේඇල | 848412.50 |
| තෙල්ගමුව ඔය | 517787.50 |
| රඹුක්ඔළුව | 305440.00 |
| නිදන ශාලාව | 460690.00 |
| කැබින් 1,2,3 | 477623.00 |
| සිංහරාජ මා.නි | 10292.50 |
| පිටදෙනිය | 770947.51 |
| ගිංගඟ | 294687.50 |
| හිරිකටුඔය | 882735.00 |
| මෝනිංසයිඩ් | 440365.00 |
| මුරකැලේ වත්ත | 135930.00 |
| මින්නේරිය නව සං | 61467.50 |
| හම්බන්තොට ක.භූ. | 73025.00 |
| පොල්ලත්තාව ක.භූ. | 23000.00 |
| කොස්ගුලාන වන නිවහන | 166405.00 |
| හිරිකටුඔය වන නිවහන | 9200.00 |
| හිරිකටුඔය | 882735.00 |
| මෝනිංසයිඩ් | 440365.00 |
| මුරකැලේ වත්ත | 135930.00 |
| මින්නේරිය නව සං | 61467.50 |
| හම්බන්තොට ක.භූ. | 73025.00 |
| පොල්ලත්තාව ක.භූ. | 23000.00 |
| කොස්ගුලාන වන නිවහන | 166405.00 |
| හිරිකටුඔය වන නිවහන | 9200.00 |
| එකතුව | **8,828,099.01** |

### 2.7.15 2018 වසරේ මූල්‍යමය ප්‍රගතිය

වන විද්‍යා සහ වන කළමනාකරණ අංශයේ ක්‍රියාකාරකම් සඳහා රු: 598,000,000 ක් වෙන් කර තිබූ අතර, අදාල වර්ෂය තුල ඉන් රු: 596,671,767.76ක් වියදම් කරන ලදී. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු පහත 2.20 වන වගුව මගින් දැක්වේ.

**වගුව 2.20 - වන විද්‍යා සහ වන කළමනාකරණ අංශයේ මූල්‍යමය ප්‍රගතිය - 2018**

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු) | වියදම (රු.) | % |
|---|---|---|---|
| කාර්මික වන වගා ස්ථාපනය සහ කළමනාකරණය | 325,000,000 | 324,671,632.81 | 99.89 |
| පයිනස් වනවගා පුලුල් පත්‍ර සහිත වගා බවට පරිවර්තනය කිරීම | 10,000,000 | 9,000,550.95 | 99.99 |
| මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය | 8,000,000 | 8,000,000.00 | 100 |
| වන ආවරණය ඉහළ නැංවීම | 255,000,000 | 254999584.00 | 99.77 |
| එකතුව | **598,000,000** | **596,671,767.76** | **99.77** |

# 3 වන පරිච්ඡේදය

# වන සංගණන සහ භූගෝල විද්‍යා තොරතුරු පද්ධති අංශය

## 3.1 හැඳින්වීම

වන සංගණන හා භූගෝල විද්‍යා තොරතුරු පද්ධති අංශය ප්‍රධාන වශයෙන් රටේ වන සම්පත් ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමේ වගකීම දරයි. මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ රටේ පවතින වනාන්තර මිනුම් කිරීම සහ සිතියම් සැකසීම, වනාන්තරවල මායිම් සලකුණු කිරීම, ස්වාභාවික සහ මිනිසා ඇති කරන ලද වනාන්තරවල සංගණනයන් පැවැත්වීම, වන වගාවන් වල සංගණන දත්ත අඩංගු දත්ත සමුදායක් නඩත්තු කිරීම, වන ආවරණ සිතියම් සැකසීම, දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශවල ක්‍රියාකාරකම් වලට අවශ්‍ය අංකිත සිතියම් සැකසීම, වනාන්තර රක්ෂිත බවට ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය උපලේඛන සැකසීම හා ඒවා පරීක්ෂා කිරීම වේ. ඊට අමතරව රාජ්‍ය දැව සංස්ථාවට හෙළීම සඳහා ලබාදෙන වන වගා සඳහා රාජ්‍ය දැව සංස්ථාව මඟින් ගෙවිය යුතු ස්කන්ධ භාගය ගණනය කිරීම ද මෙම අංශයේ වගකීමක් වේ. එසේම පැරණි ගුවන් ඡායාරූප, අංකිත දත්ත, භූ සිතියම්, ගුවන් ඡායාරූප ලබාගත් රේඛාවන් දක්වන භූ සිතියම් ආරක්ෂිතව ගබඩා කර තැබීම ද මෙම අංශයේ වගකීමක් වේ.

## 3.2 ප්‍රධාන අරමුණු

1. වන සම්පත් සඳහා කළමනාකරන ක්‍රමෝපායන් ගොඩනැඟීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින සියළුම කැළෑ සිතියම් ගතකිරීම
2. වන වගා කළමනාකරණය සඳහා අවශ්‍යවන තොරතුරු නිපදවීම සඳහා වන වගා සංගණන දත්ත එකතු කිරීම සහ ගබඩා කිරීම
3. ස්වාභාවික වනාන්තර සංගණනයන් කිරීම.
4. යාවත්කාලීන කරන ලද සිතියම් සැකසීම සඳහා භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය කළමනාකරණය කිරීම.
5. වන වගා දත්ත සමුදාය කළමනාකරණ කිරීම මඟින් සංගණන දත්ත පිරි සැකසුම් කර තොරතුරු නිපදවීම.
6. වනාන්තර මැනුම් කිරීම්, ඊට අදාළ පිඹුරු සහ ඉඩම් විස්තර ලැයිස්තු මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීම, කැළෑවල මායිම් කණු සිටුවීම, මනින ලද වනාන්නර ප්‍රකාශයට පත් කිරීම සඳහා උපලේඛන සකස් කිරීම.
7. මිනුම් කරන ලද සියළු වානාන්තරවල මායිම්වලට අදාළ අංකිත දත්ත සකසා නඩත්තු කිරීම.
8. වන සංගණනය, දත්ත සමුදාය කළමණාකරණය, භූගෝල විද්‍යා තොරතුරු පද්ධති භාවිතයෙන් සිතියම් සැකසීම සම්බන්ධව නිලධාරීන් පුහුණු කිරීම.
9. කාලානුරූපව වන ආවරණ සිතියම් සැකසීම.

## 3.3 ආයතන සැකසුම

මෙම අංශය 2015 වසරේ දී ස්ථාපිත කරන ලද අතර එය වන සංරක්ෂකවරයෙක් යටතේ පාලනය වේ. ඒ සඳහා සහකාර වන සංරක්ෂකවරයෙක් ද සහය වේ. මෙම අංශයට අදාළ ක්ෂේත්‍ර මට්ටමේ කාර්යයන් දෙපාර්තමේන්තුවේ කලාප සහ දිසා මට්ටමේ නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි. අනෙක් සහාය කාර්යය මණ්ඩලයට සැලසුම් ශිල්පීන් 7 දෙනෙකු ද සංවර්ධන සහකාරවරයෙක් ද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාරවරියක් ද, රාජ්‍ය කළමනාකරණ සහකාරවරයෙක්ද, බීට්ටු වන නිලධාරියෙක්ද, කාර්යාල කාර්ය සහායකයින් දෙදෙනෙකු ද ඇතුළත් වේ.

## 3.4 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

### 3.4.1 වන ආවරණ සන්නිවේදනය සිතියම් සැකසීම සඳහා දුරස්ථ

මෙම අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලින් එකක් වන්නේ රටේ ආවරණ සිතියම යාවත්කාලීන කිරීම ය. ආසන්නතම යාවත්කාලීන කිරීම 2015 දී ආරම්භ කළ අතර එය Google Earth Pro මෘදුකාංගය භාවිතයෙන් අදාළ චන්ද්‍රිකා දත්ත භාගත කිරීම සිදුකරන ලදී. මේ සඳහා REDD+ කාර්යාලය සහ ශ්‍රී ලංකාවේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ලබා ගන්නා ලදී. මෙම පහසුකම නිසා චන්ද්‍රිකා ප්‍රතිබිම්භවල විභේදනය මීටර් 2 කට පමණ වැඩි කර ගැනීමට හැකි වූ අතර එමඟින් වන ආවරණ සිතියම්වල නිවැරදි බව වැඩි කරගැනීමට හැකි විය. මේ වන විට පැවති ESRI ArcGIS මෘදුකාංගයේ නවතම සංස්කරණ වූ 10.6.1 භාවිතයෙන් චන්ද්‍රිකා ප්‍රතිබිම්බ අර්ථ නිරූපණය සිදු කරන ලදී. එමඟින් ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි සකසන ලද සියළුම මූලික සිතියම් ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් තහවුරු කිරීම සිදු කරගන්නා ලද අතර එමඟින් ලබාගත් තොරතුරු භාවිතා කර සිතියම් තවදුරටත් යාවත්කාලීන කරන ලදී. මේ වන විට වනාන්තරවල තුරු වියන් ආවරණය පදනම් වූ වර්ගීකරණය භාවිතයෙන් ශ්‍රී ලංකාවේ වන ආවරණ සිතියම් සහ ඊට අදාළ තොරතුරු පද්ධතියක් සකසා ඇත. ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු ශ්‍රී ලංකාවේ මුළු වන ආවරණය (ලෝක කෘෂිකර්ම හා ආහාර සංවිධානයේ වනාන්තර අර්ථ දැක්වීමමෙන් රබර් ඉවත් කළ පසු) හෙක්ටයාර් 2,304,799.99 ලෙසත්, ස්වභාවික වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර් 2,210,507.93 ලෙස හා වන වගා ප්‍රමාණය හෙක්ටයාර් 94,292.06 ලෙස දැක්විය හැක. තවද තුරු වියන් ආවරණය සැලකූ විට ඝන වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර් 1,811,748.06 ලෙස ද විවෘත වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර් 380,209.02 ලෙස හා කඩොලාන වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර් 18,550.85 ලෙස ද අර්ථ දක්වා තිබේ. මීට අමතරව කටු පඳුරු කැලෑ සහ තෘණ භූමි හෙක්ටයාර 155,971.02 ක් හා වගුරු බිම් හෙක්ටයාර් 19,234.33 ද සිතියම් ගත කර තිබේ. 2017 වසර අවසන් වන විට මෙම වන ආවරණය දැක්වෙන සිතියම් වන ක්ෂේත්‍ර සහකාර කොට්ඨාශ මට්ටමින් මුද්‍රණය කිරීම සහ සූදානම් කිරීම සිදු කරන ලදී. අදාළ සිතියම් වන ක්ෂේත්‍ර සහකාරවරුන්, බීට්ටු වන නිලධාරීන්, අඩවි වන නිලධාරීන් හා දිසා වන නිලධාරීන් වෙත මුද්‍රණය කර ලබාදීම 2018 වසරේ මුල් භාගයේදී සිදුකර අවසන් කල අතර ස්වාභාවික වනාන්තර ගැසට් කිරීමේ ක්‍රියාවලිය සිදුකරමින් පවතියි.

### 3.4.2 වන සංගණන කටයුතු

රාජ්‍ය දැව සංස්ථාවට 2017 වසරේ නිදහස් කළ යුතු වන වගාවල ගස් සලකුණු කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලද අතර හෙක්ටයාර් 636 ක ඉලක්කයෙන් හෙක්ටයාර් 725 ක ගස් සලකුණු කිරීම නිම කරන ලදි.

### 3.4.3 වන වගා දත්ත සමුදාය (FORDATA) කළමනාකරණය

දැනට පවතින දත්ත සමුදායේ (FORDATA) අඩුපාඩු හේතුවෙන් එම දත්ත සමුදාය යාවත්කාලීන කිරීමක් සිදු නොවේ. නමුත් මීට පෙර එය භාවිතයෙන් සැකසූ දත්ත සුරක්ෂිතව ගබඩා කර තිබේ. නව දත්ත සමුදායක් (Database) සැකසීමේ අවශ්‍යතාවයක් පවතී.වන වගා දත්ත යාවත්කාලීන කිරීම ආරම්භ කර ඇත.

### 3.4.4 (NFI) දත්ත සමුදාය ජාතික වන සංගණනය

UN – REDD වැඩසටහනේ ආධාර යටතේ ආරම්භ කරන ලද ජාතික වන සංගණන කටයුතු වල දත්ත ගබඩා කිරීම් සඳහා පවත්වා ගෙන යනු ලබන පරිගණක සර්වරයක මෙම ජාතික වන සංගණන දත්ත ඇතුළත් කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කෙරේ. 2017 වසරේ දත්ත ඇතුළත් කර ඇත. සෑම වසරකදීම ලබා ගන්නා වන සංගණන නියැදි දත්ත මෙසේ ඇතුළත් කර යුතුව ඇත.

### 3.4.5 මිණුම් කිරීම සහ මායිම් සළකුණු කිරීම

මෙම වසර සඳහා මායිම් සළකුණු කිරීමේ ඉලක්කය කිලෝ මීටර් 550 ක් වූ අතර කිලෝ මීටර් 695.75 මායිම් සළකුණු කරන ලද අතර වනාන්තර මායිම් කිලෝ මීටර් 200 ක මිනුම් කිරීමට සැලසුම් කර තිබූ අතර කිලෝ මීටර් 182.73 ක මිනුම් කටයුතු නිම කරන ලදී.

### 3.4.6 භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය කළමනාකරණය කිරීම

මෙම අංශයේ තිබූ Esri ArcGIS මෘදුකාංගය යාවත් කාලීන කර නව පරිගණකවල ස්ථාපනය කරන ලදී. දැනට පවතින නවතම Esri ArcGIS සංස්කරණය වන 10.6.1 සංස්කරණය දැනට පරිගණක පද්ධතිය තුළ ස්ථාපිත කර තිබේ. වන ආවරණ සිතියම් සැකසීම හා වෙනත් අවශ්‍ය සිතියම් සකසා දීම මෙම මෘදුකාංගය භාවිතයෙන් සිදු කරනු ලබයි.

# 4 වන පරිච්ඡේදය

# පරිසර සංරක්ෂණ හා කළමනාකරණ අංශය

## 4.1 හැඳින්වීම

වන ප්‍රතිපත්තියේ මූලික අරමුණක් වන පාරිසරික පද්ධතීන් සංරක්ෂණය කිරීමේ අරමුණ මත පිහිටමින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනයේ පවත්නා සියළු පරිසර පද්ධතීන්හි ජෛවවිවිධත්ත්වය, පස, ජලය, ඓතිහාසික, සංස්කෘතික ආගමික හා සෞන්දර්යාත්මක අගයයන් සංරක්ෂණය කරමින් කළමනාකරණය කිරීම, මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ.

## 4.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

- ප්‍රකාශිත සිංහරාජ හා නකල්ස් ලෝකඋරුම වනභූමින්වල පවත්නා විශ්වීය වටිනාකම් වලට හානි නොවන සේ ඒවා රැකගනිමින් කළමනාකරණ කටයුතු සිදු කිරීම.

- මිනිසා හා ජෛවගෝල සංරක්ෂිත වනාන්තර කළමනාකරණ කටයුතු සිදු කිරීම.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත සංරක්ෂිත හා රක්ෂිත වනාන්තරවල තිරසර කළමනාකරණ කටයුතු සිදු කිරීම.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනයේ පවත්නා භූමීන් තුල සිදු කිරීමට යෝජිත අත්‍යාවශ්‍ය සංවර්ධන කාර්යයන් සඳහා ජාතික පාරිසරික පනතට අනුව, සිදු කෙරෙන පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියේදී ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය ලෙසින් කටයුතු කරමින්, අවම පරිසර හානියකින් හා එමගින් සිදුවන හානිය අවම කිරීමට සුදුසු කොන්දේසි පනවමින් පාරිසරික අනුමැතීන් ලබාදීම.

- පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියේදී, පාරිසරික බලපෑම් ඇගයීම් තාක්ෂණික කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කරමින් පරිසර හානි අවම කර ගැනීම සඳහා නිර්දේශ ලබාදීම.

- පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා විභවයක් ඇති ස්ථානවල පාරිසරික සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම තුලින් ජාතික ආර්ථිකය ඉහළ නැංවීම.

- කඩොලාන පරිසර පද්ධතීන් සංරක්ෂණය හා කළමනාකරණය කිරීම.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනයේ ඇති ස්වභාවික සෞන්දර්ය සහිත ස්ථානවල සුදුසු කොන්දේසි මත රූගත කිරීම් සඳහා අවසර දීම හා එමගින් ජාතික ආදායම ඉහළ නැංවීම.

- ජාතික සංරක්ෂණ විමසුම මගින් හඳුනාගෙන ඇති ප්‍රමුඛ පරිසර පද්ධතීන් සංරක්ෂණ හා කළමනාකරණය.

- වනාන්තර පරිසර පද්ධතීන්ගේ ආරක්ෂාව හා පැවැත්ම තහවුරු කිරීම සඳහා එම පද්ධතීන්ට මැදිව හා යාව ඇති පුද්ගලික ඉඩම් පවරා ගැනීමට කටයුතු කිරීම.

- පුහුණු හා අධ්‍යාපනික වැඩසටහන් මගින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ පරිසර කළමනාකරණ ගැටළු හඳුනාගැනීම හා විසඳීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

## 4.3 ආයතනික සැකැස්ම

පරිසර සංරක්ෂණ හා කළමනාකරණ අංශය, වන සංරක්ෂකවරයකු යටතේ ක්‍රියාත්මක වේ. මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය මෙහෙයවීමට වන සංරක්ෂකවරයාට සහකාර වන සංරක්ෂකවරයකුගේ සහාය ලැබේ. වන සංරක්ෂක සහ සහකාර වන සංරක්ෂකගේ සහායට සංවර්ධන නිළධාරිනියන් දෙදෙනෙකු, එක් කළමනාකරණ සහකාරවරයෙක් හා කළමනාකරණ සහකාරවරියන් දෙදෙනෙකු සහ වන ක්ෂේත්‍ර සහකාරවරියන් දෙදෙනෙකු මෙම අංශයට අනුයුක්ත කර ඇත.

මෙයට අමතරව ක්ෂේත්‍ර කටයුතු අදාල කලාප නියෝජ්‍ය වන සංරක්ෂකවරුන්, දිසා වන නිළධාරීන් හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මගින් සිදු කරනු ලබයි.

## 4.4 වාර්ෂික ක්‍රියාකාරකම්

ඉහත 4.2 ට අදාළව, පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කර ඇත.

### 4.4.1 ලෝකඋරුම වනභූමීන් නඩත්තුව හා කළමනාකරණය

(i) සිංහරාජ, නකල්ස් ලෝකඋරුම වනභූමීන්ගේ පවත්වා ගෙන යනු ලබන ස්වභාවික මංපෙත්, නවාතැන් ඇතුළු සියළු පහසුකම් නඩත්තු කරමින් පවත්වා ගෙන යාම.

<u>සිංහරාජ ලෝකඋරුම වනභූමිය</u>

සිංහරාජ ලෝකඋරුම වන භූමියට මායිම්ව ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු සියළු කැළෑ හා පෞද්ගලික කැළෑ භූමීන් ද ඇතුලත් වන සේ අළුතින් මායිම් සළකුණු කර, ඒ අනුව අළුතින් මැනීම් කර මායිම් සළකුණු කිරීමට කටයුතු කරමින් පවතී. සිංහරාජ වනාන්තරයට යාව ඇති සියළු වනාන්තර භූමීන් ඇතුලත් වන සේ ජී.පී.එස්. තාක්ෂණයෙන් භූමිතික ඛණ්ඩාංක අනුව, කළුතර දිස්ත්‍රික්කයේ හැර සිතියම් සකස් කර අවසන් කර ඇත. මෙම මායිමට ඇතුලත් වන පෞද්ගලික හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කැළෑ ඉඩම් පවරා ගැනීමට අදාළ කටයුතු ද කෙරෙමින් පවතී.

<u>නකල්ස් ලෝකඋරුම වනභූමිය</u>

නකල්ස් ලෝකඋරුම වන භූමියේ මායිම් නිරූපණය යටතේ මෙම වසර තුල දි මාතලේ දිස්ත්‍රික්කයේ මායිම් නිරූපණය කිරිම බොහෝ දුරට සම්පූර්ණ කර ඇති අතර, ඉතිරි වි ඇති කි.මී. 6 ක් සඳහා මැනුම් කිරීමට අදාලව ද ඉදිරි කටයුතු සිදු කර ඇත. ඒ අනුව මාතලේ දිස්ත්‍රික්කයේ මායිම් සළකුණු කිරීම 2019 වසරේ දී සම්පූර්ණ කිරිමට හැකි වනු ඇත. මෙම මායිමට ඇතුලත් වන පෞද්ගලික හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කැළෑ භූමීන් පවරා ගැනීමට අදාළ කටයුතු ද කෙරෙමින් පවතී.

(ii) මෙම ලෝකඋරුම වනභූමීන් නැරඹීමට පැමිණෙන පාසල් සිසුන් ඇතුළු සියළු කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන් හා මාර්ගෝපදේශ පහසුකම් සැපයීම.

### 4.4.2 සංරක්ෂණ මධ්‍යස්ථාන කළමනාකරණය

කන්නෙලිය, කොට්ටව, උඩවත්තකැලේ, ඔලියගන්කැලේ හා කුරුළුකැලේ යන සංරක්ෂණ මධ්‍යස්ථානවල හා කන්දෙඇල අධ්‍යාපනික වන උද්‍යානයේ හා හපුතලේ උද්‍යානයේ අවශ්‍ය පහසුකම් නඩත්තු හා වැඩි දියුණු කරමින් පවත්වා ගෙන යාම.

### 4.4.3 හුරුළු පාරිසරික උද්‍යානය

හුරුළු පාරිසරික උද්‍යානයේ සියළුම පහසුකම් වැඩි දියුණු කරමින් හා නඩත්තු කරමින් පවත්වා ගෙන යාම.

### 4.4.4 සංචාරකයින්ගේ තොරතුරු සහ ඔවුන්ගෙන් ප්‍රවේශ ගාස්තු ලෙස එකතු කල ආදායම

සංචාරකයින්ගේ තොරතුරු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් රැස්කරන ලද ආදායම වගුව 4.1 (අ) – 4.1 (එ) මගින් දැක්වේ.

වගුව 4.1 - (අ) උඩවත්ත කැලේ ( මහනුවර)

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසැල් සිසුන් (නොමිලේ) | 266 | - |
| පාසල් සිසුන් (අයකර) | 904 | 6773.21 |
| ගුරුවරුන්(නොමිලේ) | 34 | - |
| ගුරුවරු (අයකර) | 50 | 1250.00 |
| දේශීය ළමුන් | 536 | 6922.80 |
| දේශීය වැඩිහිටි | 19,682 | 512,247.84 |
| විදේශීය ළමුන් | 421 | 122,090.00 |
| විදේශීය වැඩිහිටි | 122,33 | 7,033,975.00 |
| **එකතුව** | **34,126** | **7,683,258.85** |

වගුව **4.1 -** (ආ) නකල්ස් වනාන්තරය (ඩීන්ස්ටන්, මහනුවර)

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| දේශීය ළමුන් | 330 | 4,125.00 |
| දේශීය වැඩිහිටි | 3,257 | 81,425.00 |
| විදේශීය ළමුන් | 41 | 11,890.00 |
| විදේශීය වැඩිහිටි | 1,771 | 1,018,325.00 |
| එකතුව | 5,399 | 1,115,765.00 |

වගුව **4.1 -** (ඇ) නකල්ස් වනාන්තරය (පිටවලපතන, මාතලේ)

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන්(නොමිලේ) | 35 | - |
| පාසල් සිසුන් (අයකර) | 2441 | 31,958.55 |
| ගුරුවරුන්(නොමිලේ) | 2 | - |
| දේශීය වැඩිහිටි | 808 | 9441.87 |
| දේශීය ළමුන් | 54,628 | 1,249,986.25 |
| විදේශීය ළමුන් | 3 | 783.00 |
| විදේශීය වැඩිහිටි | 789 | 424,015.50 |
| **එකතුව** | **58,706** | **1,716,185.17** |

වගුව **4.1 - (ඈ) සිංහරාජ වනාන්තරය (පිටදෙනිය, මාතර )**

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන්(නොමිලේ) | 434 | - |
| ගුරුවරු (නොමිළේ) | 36 | - |
| දේශීය ළමුන් | 1,604 | 20188.24 |
| දේශීය වැඩිහිටි | 14,879 | 369,801.25 |
| විදේශීය ළමුන් | 274 | 69,175.00 |
| විදේශීය වැඩිහිටි | 6,614 | 3,271,725.00 |
| **එකතුව** | **23,841** | **3,730,889.49** |

වගුව 4.**1 - (ඉ) සිංහරාජ වනාන්තරය ( කුඩව, රත්නපුර )**

| **අමුත්තන් වර්ගය** | **අමුත්තන් සංඛ්‍යාව** | **ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්)** |
|---|---|---|
| පාසල් සිසුන් (නොමිළේ) | 1,682 | - |
| පාසල් සිසුන් (අයකර) | 5,407 | 32,562.00 |
| ගුරුවරු (නොමිළේ) | 226 | - |
| ගුරුවරු (අයකර) | 562 | 14,050.00 |
| දේශීය ළමුන් | 1968 | 24,600.00 |
| දේශීය වැඩිහිටි | 15,333 | 383,325.00 |
| විදේශීය ළමුන් | 907 | 86,710.00 |
| විදේශීය වැඩිහිටි | 7,754 | 4,808,150.00 |
| **එකතුව** | **33,839** | **5,349,397.00** |

වගුව 4.**1 - (ඊ) හුරුළු පාරිසරික උද්‍යානය ( හබරණ, පොළොන්නරුව)**

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| දේශීය ළමුන් | 1,453 | 56,856.51 |
| දේශීය වැඩිහිටි | 19,175 | 1,500,652.17 |
| විදේශීය ළමුන් | 1,225 | 798,913.03 |
| විදේශීය වැඩිහිටි | 35,439 | 46,224,782.60 |
| **එකතුව** | 57,292 | **48,581,204.31** |

- මීට අමතරව සංචාරකයින් පැමිණෙන වාහන 13,603 ක් සඳහා රු: 4,435,760.87 ක ආදායමක් ලැබී ඇත.

වගුව **4.1 - (උ)කොට්ටව වනාන්තරය ( ගාල්ල)**

| **අමුත්තන් වර්ගය** | **අමුත්තන් සංඛ්‍යාව** | **ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල් )** |
|---|---|---|
| පාසල් සිසුන් (අයකර) | - | - |
| දේශීය ළමුන් | 142 | 1,775.00 |
| දේශීය වැඩිහිටි | 1,660 | 41,500.00 |
| විදේශීය ළමුන් | 35 | 10,150.00 |

| | | |
|---|---|---|
| විදේශීය වැඩිහිටි | 335 | 204,125.00 |
| **එකතුව** | **2,172** | **257,550.00** |

වගුව 4.1 - **(ඍ) කන්නෙලිය වනාන්තරය ( ගාල්ල )**

| **අමුත්තන් වර්ගය** | **අමුත්තන් සංඛ්‍යාව** | **ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල් )** |
|---|---|---|
| පාසල් සිසුන් (නොමිළේ) | 2,219 | - |
| පාසල් සිසුන් (අයකර) | 5,072 | 30,432.00 |
| දේශීය ළමුන් | 1,945 | 24,312.50 |
| දේශීය වැඩිහිටි | 53,236 | 1,330,900.00 |
| විදේශීය ළමුන් | 110 | 31,900.00 |
| විදේශීය වැඩිහිටි | 2,197 | 1,263,275.00 |
| **එකතුව** | **64,779** | **2,680,819.50** |

වගුව 4.1 - **(එ) මාකන්දාව වනාන්තරය (කෑගල්ල )**

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල් ) |
|---|---|---|
| පාසල් සිසුන් (නොමිළේ) | 211 | - |
| පාසල් සිසුන් (අයකර) | 7 | 100.66 |
| දේශීය ළමුන් | 198 | 4208.94 |
| දේශීය වැඩිහිටි | 1,897 | 50,538.75 |
| විදේශීය ළමුන් | 102 | 24,635.50 |
| විදේශීය වැඩිහිටි | 1,144 | 712,295.50 |
| **එකතුව** | **3,559** | **791,779.35** |

වගුව 4.1 - **(ඒ) කන්දෙඇල අධ්‍යාපනික වනෝද්‍යානය ( නුවරඑළිය )**

| **අමුත්තන් වර්ගය** | **අමුත්තන් සංඛ්‍යාව** | **ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල් )** |
|---|---|---|
| පාසල් සිසුන් (නොමිළේ) | 995 | - |
| පාසල් සිසුන් (අයකර) | 1,832 | 16,825.00 |
| දේශීය ළමුන් | 1,346 | 10,992.00 |
| දේශීය වැඩිහිටි | 2,726 | 68,150.00 |
| විදේශීය ළමුන් | 2 | 500.00 |
| විදේශීය වැඩිහිටි | 9 | 5,175.00 |
| **එකතුව** | **6,910** | **101,642.00** |

- 2018 වසරේ දී පිදුරුතලාගල සංරක්ෂිත වනාන්තරය නැරඹීම සඳහා කණ්ඩායම් වශයෙන් පැමිණි කාර් හා වෑන් රථ සඳහා අවසර දීමෙන් ඉපැයූ ආදායම රු 4,107,000.00 ක් වේ.

සම්පූර්ණ නැරඹීම් මගින් ලැබූ ආදායම රුපියල් 80,551,251.54 කි.

### 4.4.5 වනාන්තර තුල රූගත කිරීම් වලින් ලද ආදායම

දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය කරනු ලබන රක්ෂිත වනාන්තර තුල වීඩියෝ රූගත කිරීම් මගින් රුපියල් 576,000.00 ක ආදායමක් උපයා තිබුණි.

### 4.4.6 පරිසර බලපෑම් ඇගයීම

2004 වසරේ සිට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, රජයේ වනාන්තර භූමීන් වල ක්‍රියාත්මක විවිධ සංවර්ධන ව්‍යාපෘතිවලින් සිදුවන පාරිසරික බලපෑම්, ඇගැයීම සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ අනු නියෝජිත ආයතනයක් ලෙස හා තාක්ෂණික කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම සඳහා පත් කර තිබේ. ඒ අනුව 2018 වසරේදී පාරිසරික අනුමැතිය ලබා ගැනීමට හා තාක්ෂණික නිර්දේශ ලබා දීමට යොමු කරන ලද විවිධ ව්‍යාපෘති යෝජනා 50 ක් පමණ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබේ. මෙම යෝජනා අතුරින් විවිධ ව්‍යාපෘති 07 ක් සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 2018 දී පත් කර ඇත.

පසුගිය වසරවල පරිසර අනුමැතිය ලබා දුන් විවිධ ව්‍යාපෘතින් ඒවායේ පනවනු ලැබූ කොන්දේසි යටතේ සිදු කරනු ලබන බවට අධීක්ෂණ කටයුතු සිදු කර ඇත. මෙම වසරේ දී පාරිසරික අනුමැතිය ඉල්ලා යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.

මීට අමතරව, මෙම වසරේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ආරම්භ කරන නිර්දේශිත ව්‍යාපෘති 15 ක් සම්බන්ධයෙන් වන තාක්ෂණික ඇගැයිම් කමිටු සාමාජිකයෙකු ලෙසද කටයුතු කර ඇත.

### 4.4.7 පාරිසරික තොරතුරු කළමනාකරණ පද්ධතිය

ස්වාභාවික වනාන්තරවල ජෛවවිවිධත්ත්වය, පස, ජලය ආදී තොරතුරු එක් රැස් කර සිදු කරන ලද ජාතික සංරක්ෂණ විමසුමේ දත්ත ආශ්‍රයෙන් පාසල් සිසුන්, පර්යේෂකයින් සහ විවිධ පුද්ගලික සහ රාජ්‍ය අංශවල පුද්ගලයින් යන සියල්ලන්ටම අවශ්‍ය තොරතුරු සපයන ලදී.

## 5 වන පරිච්ඡේදය

## පර්යේෂණ, අධ්‍යාපන සහ සංවර්ධන අංශය

### 5.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විධිමත්, වන විද්‍යාත්මක පර්යේෂණ කටයුතුවල ආරම්භය සනිටුහන් කරමින්, 1937 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහ අධ්‍යාපන අංශය, වන විද්‍යාත්මක පර්යේෂණ ඒකකය ලෙස ආරම්භ කරන ලදි. මෙම අංශයට දෙපාර්තමේන්තු බල සීමාව තුල, වන විද්‍යාත්මක පර්යේෂණ කටයුතු පරිපාලනය සහ වන විද්‍යා ක්ෂේත්‍රය හා සම්බන්ධ අධ්‍යාපන කටයුතු ක්‍රියාත්මක කිරීම යන කටයුතුවල වගකීම පැවරී තිබේ.

මෙම අංශය, කුරුණෑගල සහ බදුල්ල යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන, ශ්‍රී ලංකා වන විද්‍යායතනය සහ වන විද්‍යා තොරතුරු ඒකකය යන අංශ වලින් සමන්විත වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුස්තකාලයද මෙම අංශය යටතේ පවතී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික පර්යේෂණ වැඩ සටහන්, පර්යේෂණ මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය දැව සංස්ථාවේ සහ වන වගා කටයුතු වල නිරතව සිටින පුද්ගලික අංශයේ ගැටළු නිරාකරනය කිරීමේලා සෘජුව ක්‍රියා කරයි. මෙම මධ්‍යස්ථාන විසින්, සංරක්ෂණ සහ නිෂ්පාදන වන විද්‍යාව සම්බන්ධව ව්‍යවහාරික සහ අනුවර්තීය පර්යේෂණ කටයුතු සිදු කරයි.

දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවයේ කාර්ය මණ්ඩල හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා, ප්‍රධාන වශයෙන්ම වන විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත විෂයන් මත පුහුණු වැඩ සටහන්, නුවරඑළියේ පිහිටා තිබෙන ශ්‍රී ලංකා වන විද්‍යායතනය මඟින් සිදු කරනු ලබයි.

වන විද්‍යා තොරතුරු ඒකකය මඟින්, වන විද්‍යාව හා සම්බන්ධ පර්යේෂණ වල ප්‍රතිඵල, එවා අපේක්ෂාවෙන් සිටින ප්‍රතිලාභ ලබන්නන් වෙත වඩාත් සාර්ථක අන්දමට ලබා දීමේ අරමුණින් ක්‍රියා කරයි. මේ වන විට පුස්තකාලය සතුව ග්‍රන්ථ 31,489 ක් පමණද, වාර්තා 987 ක් පමණද, සඟරා 29 ක් පමණද තිබේ.

### 5.2 පර්යේෂණ හා අධ්‍යාපන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

1. පර්යේෂණාත්මක සහ සංවර්ධනාත්මක පරිශ්‍රමයක් තුලින් ජාතික වන ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන් සඳහා තාක්ෂණිත සහාය ලබාදීම.

2. ජාතික වන ප්‍රතිපත්තියේ අරමුණු කරා ළඟාවීමට ශ්‍රී ලංකාව තුල සිදු කරන වන විද්‍යාත්මක පර්යේෂණ සඳහා මගපෙන්විම, එම කටයුතු සම්බන්ධීකරණය, ප්‍රගතිය පාලනය කිරීම සහ ඇගයිම

3. වනාන්තර පරිසර පද්ධතියට අදාළ පර්යේෂණ යෝජනා සමාලෝචනය කරන්නාවූද එම පර්යේෂණ කටයුතු සඳහා අවසර ලබාදෙන්නා වූද ජාතික වන ක්ෂේත්‍ර පර්යේෂණ කමිටුවේ රැස්වීම් හා සම්බන්ධව කටයුතු සම්බන්ධීකරණය කිරීම

4. ජාතික ප්‍රමුඛතාවන්ට අනුව පර්යේෂණ වැඩසටහන් සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරිම.

5. පර්යේෂණ අවසානයේදී ලබා ගන්නා ප්‍රයෝජනවත් තොරතුරු ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට සහ අනෙකුත් අවශ්‍ය පුද්ගලයින් හට ලබාදිම සහ අවශ්‍ය කරන තාක්ෂණික උපදෙස් ලබාදීම.

6. ජාතික වන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ කටයුතු සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලබා දී අදාල ආයතන වලට නිර්දේශ ලබාදීම.

7. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය දැව සංස්ථාවේ තාක්ෂණික සහ උප තාක්ෂණික මට්ටම්වල සිටින නිලධාරීන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සහ හැකියාවන් දියුණු කිරීම මෙන්ම අනෙකුත් ආයතන වල පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කටයුතු කිරීම.

8. වන විද්‍යා තොරතුරු ඒකකය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පුස්තකාලය කළමනාකරණය කිරීම.

9. ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ පරිපාලනය සහ සංවර්ධනය යන අංශවල සමස්ත අධීක්ෂණය.

10. දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය කරන සියළුම ලිපි ලේඛණ ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවටද සිංහල භාෂාවෙන් ඉංග්‍රිසි භාෂාවටද පරිවර්තනය කිරීම.

11. දෙපාර්තමේන්තුවේ සියළුම කටයුතු වලදී අවශ්‍ය කරන භාෂා සංස්කරණ සහාය ලබාදීම.

## 5.3 ආයතනික සැකැස්ම (ප්‍රධාන කාර්යාලය)

මෙම අංශයේ ප්‍රධානියා ලෙස අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන) ක්‍රියා කරන අතර අනෙකුත් කාර්ය මණ්ඩලයට එක් සහකාර වන සංරක්ෂක වරයෙකු, එක් භාෂා පරිවර්තකයෙකු, එක් භාෂා සංස්කාරවරයකු, එක් සංවර්ධන සහකාරවරයකු, එක් කලමනාකරණ සහකාරවරයකු, එක් වන ක්ෂේත්‍ර සහකාරයෙකු, කාර්යාල  කාර්ය සහායකයින් දෙදෙනෙකු අයත් වේ. පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා එක් පුස්තකාලයාධිපතිනියක් සහ වන ක්ෂේත්‍ර සහකාරවරු දෙදෙනෙක් අයත්වේ.

## 5.4 2018 වර්ෂය තුලදී ස්ථාපනය කරන ලද නව පර්යේෂණ

**i. දේශගුණික විපර්යාස වලට අනුවර්තනයවීම සඳහා තේක්ක වන වගා ස්ථාපනය කිරීමේදී යොදාගත හැකි යෝග්‍ය ක්‍රම පිළිබඳව අධ්‍යයනය කිරීම.**

දීර්ඝ වියළි කාලයක් සහ අධික ලෙස වල් පැලෑටි වර්ධනය වීම වැනි දේශගුණික විපර්යාසවල බලපෑම්වලට අනුවර්තනය වීමට තේක්ක වන වගා වල මුල් අවධියේ වර්ධනය ඉහළ නැංවීමට වැඩි දියුණුකළ වන විද්‍යාත්මක ක්‍රම හඳුනාගැනීම සඳහා මෙම පර්යේෂණ වවුනියාව දිස්ත්‍රික්කය තුල සිදුකරනු ලැබේ. මෙහිදී ප්‍රතිකර්ම ලෙස යාන්ත්‍රික භූමි සකස්කිරීමේ ක්‍රම භාවිතා කරන ලදි. මෙම පර්යේෂණය හෙක්ටයාර 0.5 ක භූමි ප්‍රමාණයක ස්ථාපනය කරන ලදි.

**ii. තේක්ක වන වගා ස්ථාපනය කිරීමේදී වන විද්‍යාත්මක ප්‍රතිකර්ම තුලින් සාර්ථක ලෙස වල් පැලෑටි පාලනය කිරීමේ ක්‍රම පිළිබඳව අධ්‍යයනය කිරීම.**

මෙම අධ්‍යයනයේ අරමුණවන්නේ තේක්ක නැවත වගාකරන භූමිවල වල් පැලෑටි පාලනය කිරීම සඳහා ඉහළ ඝනත්වයකින් යුක්තව මිශ්‍ර වගාවන් ලෙස යොදාගැනීමට යෝග්‍ය ශාක විශේෂ හඳුනාගැනීමයි. මෙම පර්යේෂණය වවුනියාවේ ස්ථාපනය කර තිබේ. මෙම අතිරේක ශාක වර්ග ඉන්ධන දැව අස්වැන්න වශයෙන් අතරමැදදි ලබා ගැනීමට යෝජිතය.

### iii. වනාන්තර ප්‍රතිස්ථාපනය සඳහා සුදුසු ශාක විශේෂ මිශ්‍රන අධ්‍යයනය කිරීම.

අත්හැර දමන ලද හේන් ඉඩම් වැනි හායනයට පතුවූ ඉඩම් වල වනාන්තර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ශාක විශේෂ තෝරාගැනීම මෙහි අරමුණයි. මෙම ශාක විශේෂ ඉහළ නොනැසී පැවතීමේ හැකියාවක් සහ වර්ධන වේගයක් තිබියයුතු අතර විවිධ ආකාරයේ ප්‍රතිලාභ ලබාදෙන ශාක විශේෂ විය යුතුය. මෙම අරමුණ කරා ළඟාවීම සඳහා වවුනියා දිස්ත්‍රික්කයේ ඔයාමඩුව ප්‍රදේශයේ මෙම පර්යේෂණ කටයුතු ආරම්භකර තිබේ. මෙහිදී, ශාක විශේෂ අතර පවතින අන්තර්ක්‍රියා අධ්‍යයනය කිරීම සඳහා ශාක විශේෂ මිශ්‍රණයක් රෝපණය කර තිබේ. මෙමගින් විවිධ සම්පත් සහ දේශගුණික තත්වයන්ට පවත්නා බලපෑම්ද අධ්‍යයනය කර තිබේ.. ශාක විශේෂ තෝරා ගැනීමේදී එම ශාකවල විශේෂිත ලක්ෂණ පිළිබඳව සලකා බලන ලදි.

### iv. දැව නිශ්පාදනය සඳහා තෝරාගත් දේශීය ශාක විශේෂ වැඩිදියුණු කිරීම සඳහා වන විද්‍යාත්මක ප්‍රතිකර්ම යොදා ගැනීම.

පර්යේෂණ අත්දැකීම් තුලින් දැවමය වන වගා සඳහා යෝග්‍ය දේශීය ශාක විශේෂ රැසක් හඳුනාගෙන තිබේ. මෙම අධ්‍යයනයේදී මෙලෙස තෝරාගත් ශාක විශේෂ වලින් වඩාත් හොඳ වර්ධනයක් ලබාගතහැකිවන පරිදි කළමණාකරනයක් කිරීමට බලාපොරොත්තුවේ. තවද, වල් පැලෑටි පාලනය සඳහා යොදා ගත හැකි වඩාත්ම හොඳ තත්වයද මෙහිදී විමසා බලනු ලැබේ. මෙම පර්යේෂණය වවුනියාවේ ස්ථාපනය කර තිබේ.

### v. කඩොලාන පසේ තිබෙන කාබන් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමේ අධ්‍යයනය

කඩොලාන පරිසර පද්ධතිය වල පූර්ණ කාබන් සංචිතය අධ්‍යයනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ කඩොලාන වල මීට පෙර සිදු කරන ලද ජෛව ස්කන්ධ කාබන් අධ්‍යයනයෙහි මීලඟ පියවර ලෙස එම පරිසර පද්ධතිවල පාංශු කාබන් සංචිතය මෙහිදී අධ්‍යයනය කරන ලදි. මෙම අධ්‍යයනයේදී කඩොලාන පැතිරී ඇති දිස්ත්‍රික්ක 8 ක ස්ථාන 50 කින් පස් සාම්පල එක්රැස් කරන ලදි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාංශු විද්‍යාගාරයේදී කාබන් ප්‍රතිශතය ගණනය කරන ලදි. පස් සාම්පල සෙන්ට්‍රිග්‍රේඩ් අංශක 105 දී උදුනේ වියළා පාංශු ඝනත්වය සොයන ලදි. මීටරයක් දක්වා ගැඹුරට විවිධ පස් තට්ටු හතරක පාංශු ඝනත්වය සහ කාබන් ප්‍රතිශතය යොදාගනිමින් කාබන් ඝනත්වය (මෙගා ග්‍රෑම්/ හෙක්ටයාර) ගණනය කරන ලදි. ඇතැම් අවස්ථාවලදී යම් යම් වෙනස්කම් පෙන්නුම්කරන නමුත් කාබන් ඝනත්වයේ පොදු රටාවක් පවතින බව පැහැදිලිවම නිරීක්ෂණය කරන ලදි. ඒ අනුව, අඩුම පාංශු ඝනත්වයක් ඉහළම පස් තට්ටුවෙන් වාර්තාවූ අතර ඉහළම පාංශු ඝනත්වය සෙන්ටි මීටර 50 – 100 අතර පස් තට්ටුවෙන් වාර්තා විය. මෙයට අමතර අඩුම කාබන් ප්‍රතිශතය සෙන්ටිමීටර 50 – 100 අතර පවත්නා පාංශු ස්ථරයෙන් වාර්තාවිය.

කඩොලාන ප්‍රදේශවල පාංශු කාබන් ව්‍යාප්තවී පවත්නා රටාව මගින් ඉතා ඉහළ කාබන් ප්‍රතිශතයක් පවතිනුයේ ඉහළ වර්ෂාපතනයක් පවතින ප්‍රදේශවල බව වාර්තාවී තිබේ. මෙම අධ්‍යයනයේදී සොයාගත් කරුණුවලට අනුව පසේ සෙන්ටිමීටර 0 – 50 අතර ගැඹුරක පවත්නා සාමාන්‍ය කාබන් ඝනත්වය හෙක්ටයාරයකට මෙගා ග්‍රෑම් 80 ක් පමණ වේ. පසේ සෙන්ටි මීටර 50 – 100 අතර කාබන් ඝනත්වය හෙක්ටයාරයකට මෙගා ග්‍රෑම් 85 වේ. එම එක් එක් පාංශු තට්ටුවේ පවත්නා උපරිම කාබන් ඝනත්වය පිළවෙලින් හෙක්ටයාරයකට මෙගා ග්‍රෑම් 181 සහ 217 වේ.

### vi. තේක්ක හා කුඹුක් බද්ධ කිරීම

ආනපල්ලම පර්යේෂණ වගා වලින් තෝරාගත් මව් ශාක 20ක් භාවිතා කරමින් තේක්ක පැල බද්ධකරන ලදි. තේක්ක බද්ධකිරීම සඳහා අල්ලි අංකුර බද්ධය ඉතා පහසු සහ වඩාත් යොග්‍ය ක්‍රමය ලෙස මෙම අධ්‍යනයේදී හඳුනාගන්නා ලදි. කුඹුක් ශාක විශේෂය බද්ධ කිරීමේ විභවය ඇගයීම සඳහා තවත් පරීක්ෂණයක් සිදුකරන ලදි. ආරම්භක සාර්ථකත්වය 66% කි. මින් පෙනීයන්නේ කුඹුක් ශාකය සාර්ථකව

බද්ධකල හැකි බවයි. මෙම තොරතුරු ඔස්සේ කුඹුක් වන වගා ස්ථාපනයකිරීමට අවශ්‍යවන බීජ නිපදවීම සඳහා විශිෂ්ඨ ලක්‍ෂණ පෙනනුම්කරන ශාක වලින් අංකුර ලබාගෙන ඒවා වෙනත් කුඹුක් ශාකවලට බද්ධකල හැකිය. මෙලෙස බද්ධකල ශාක කුරුණෑගල ප්‍රදේශයේ ක්ලෝනීකරණය කරනලද බීජ වතු ස්ථාපනය කිරීම සඳහා යොදාගනු ඇත.

## 5.5 පර්යේෂණන නඩත්තු කිරීම

මෙම වසර තුලදී දිස්ත්‍රික්ක 09 ක ක්ෂේත්‍ර පරීක්‍ෂණ හතලිස් දෙකක් දිසා වන නිලධාරී කාර්යමණ්ඩලය හා පර්යේෂණ කාර්ය මණ්ඩලය විසින් නඩත්තුකරන ලදි. සැලසුම්කළ පරිදි දත්ත රැස්කිරීමද සිදුකරන ලදි.

**බීජ උද්‍යාන**

කුරුණෑගල වන විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය විසින් හෙක්ටයාර 40 ක් පුරාවට ව්‍යාප්තව පවත්නා බීජ උද්‍යාන කුරුණෑගල දිස්ත්‍රික්කය තුල (තේක්ක සහ කායා) නඩත්තුකරන ලදි.

**බීජ රැස් කිරීම**

මෙම උද්‍යාන වලින් මෙම වසර තුලදී තේක්ක බීජ කිලෝග්‍රෑම් 500 ක් පමණ රැස්කරන ලදි. බීජ රැස්කරන කාලයේදී පැවති අධික වර්ෂාව හේතුකොටගෙන මෙන්ම කුලියාපිටියේ බරිගොඩ සහ හොරකැලේ බීජ උද්‍යාන වල සෑම ගසකටම මෙන් බලපෑ පරපෝෂී ආක්‍රමණවල ප්‍රතිඵලයක් ලෙස බීජ අස්වැන්න පහත වැටීම හේතුකොටගෙන අපේක්‍ෂා කල පරිදි බීජ රැස්කිරීම සම්පූර්ණකිරීමට නොහැකිවිය. ඇත්ගල පිහිටි බීජ උද්‍යානය ගුණාත්මක බීජ නිශ්පාදනයට ප්‍රමාණවත් මට්ටමකට පරිණතවී නැත. *Eucalyptus grandis* බීජ කිලෝ ග්‍රෑම් 7.2 ක් රැස්කරන ලදි.

**බීජ පැල නිෂ්පාදනය**

පර්යේෂණ කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් දේශීය විශේෂවලින් බීජ පැල 5000 පමණ නිෂ්පාදනය කරන ලදී. මෙලෙස නිෂ්පාදනය කළ බීජ පැල රුක් රෝපණ කටයුතු සඳහා යොදා ගන්නා ලද අතර ඉතිරිය බාහිර ආයතන සහ පුද්ගලයින් හට බෙදා දෙන ලදී.

## 5.6 පර්යේෂණ වලින් ලබා ගන්නා නව සොයා ගැනීම් අන් අයටද ලබා දීම.

**<u>පර්යේෂණ වාර්තා</u>**

පහත දැක්වෙන පර්යේෂණ වාර්තා පිළියෙලකරන ලදි.

1. වන වගාවක ආක්‍රමණශීලී ශාක විශේෂ පාලනයේ වර්තමාන තත්වය පිළිබඳ වාර්තාව.
2. ශ්‍රී ලංකාවේ ස්වාභාවික වනාන්තරවල සහ වන වගාවල හමුවන ආක්‍රමණශීලී ශාකවල වර්තමාන තත්වය පිළිබඳ කෙටුම්පත් වාර්තාව.
3. ශ්‍රී ලංකාවේ තිබෙන හායනයට පත් වූ වනාන්තර ප්‍රතිස්ථාපනයකිරීම පිළිබඳ කෙටුම්පත් කල අත් පොත.
4. ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධතියේ පසේ අඩංගු කාබන් ප්‍රමාණය ඇස්තමේන්තුකිරීමේ වාර්තාව.

**<u>සම්මන්ත්‍රණවල ඉදිරිපත් කිරීම්</u>**

1. රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි සිංහරාජ ලෝක උරුම වනාන්තරය තුල සහ ඒ අවට තිබෙන ස්වාභාවික වනාන්තරවල සහ වන වගාවල ආක්‍රමණශීලී ශාකවල වර්තමාන තත්වය පිළිබඳව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති තෙත් කලාපීය වනාන්තර පිළිබඳ පර්යේෂණ සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කල පර්යේෂණ වාර්තාව (එස්.එච්. බන්ධුමාලා සහ ආර්.එම්.ඩී. අලවතුගොඩ)

2. ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ පිහිටි කඩොලාන පරිසර පද්ධතියේ වර්තමාන තත්වය පිළිබඳව මන්නාරමේ වෙඩිතලතිව්හිදී පැවැත්වූ අන්තර් ජාතික කඩොලාන පර්යේෂණ සම්මන්ත්‍රණයේදී කරුණු ඉදිරිපත් කිරීම. (ආර්.එම්.ඩී. අලවතුගොඩ සහ කේ.ටී. ප්‍රේමකාන්ත)

**ප්‍රකාශන**

1. වන පර්යේෂණ පුවත් ලිපිය (13 වන කලාපය)

2. තේක්ක රිකිලි කලමණාකරනය පිළිබඳ පත්‍රිකාව. (සිංහල භාෂාවෙනි)

3. *Acacia* ශාකයෙහි පාරිසරික බලපෑම පිළිබඳ පොත් පිංච මුද්‍රණය සඳහා සූදානම් කර තිබේ. (සිංහල භාෂාවෙනි)

**පර්යේෂණ ලිපි**

1. සංරක්ෂණය සහ දේශගුණික විපර්යාස මැඩපැවැත්වීම සඳහා උපාය මාර්ගයක් ලෙස ශ්‍රී ලංකාවේ මැහෝගනී මිශ්‍ර වනාන්තර වල ජෛව ස්කන්ධ කාබන් සංචිතය ඇගයීම : කුරුණෑගල බඩගමුව සංරක්ෂණ වනාන්තරය. (ආර්.එම්.ඩී. අලවතුගොඩ සහ කේ.ටී ප්‍රේමකාන්ත) - ශ්‍රී ලංකා ෆොරස්ටර් සඟරාවෙහි ප්‍රකාශයට පත්කිරීම සඳහා පිළිගෙන ඇත.

2. *Chloroxylon Swietenia* ශාක විශේෂය කෙරෙහි *Papilio demoleus* දළඹුවා ගෙන් ඇති බලපෑම. (ආර්.එම්.ඩී. අලවතුගොඩ) - වන පර්යේෂණ පුවත් ලිපිය, 13 වන කලාපය.

3. *Acacia* ශාකය මඟින් මී මැස්සන්ට කරනු ලබන බලපෑම ( ආර්.එම්.ඩී. අලවතුගොඩ) - වන පර්යේෂණ පුවත් ලිපිය, 13 වන කලාපය.

4. ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය වන වගාවල *Ochlandra stridula* (බට) පාලනය (එස්.එච්.බන්ධුමාලා) වන පර්යේෂණ පුවත් ලිපිය, 13 වන කලාපය.

5. නැවත වන වගාකිරීම සහ වනාන්තර පුනරුත්ථාපනය සඳහා දේශීය ශාක විශේෂ යොදාගැනීම. (ආර්.එම්.ඩී. අලවතුගොඩ සහ එස්.එච්. බන්ධුමාලා) - වන පර්යේෂණ පුවත් ලිපිය, 13 වන කලාපය.

6. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ *Aquilaria subintegra* කෙරෙහි පවත්නා පලිබෝධක ගැටළු පිළිබඳ නිරීක්ෂණ. (එස්.එච්. බන්ධුමාලා සහ ආර්.එම්.ඩී. අලවතුගොඩ) වන පර්යේෂණ පුවත් ලිපිය, 13 වන කලාපය.

7. *Eucalyptus* වන වගාවලට වේයන්ගෙන් ඇති බලපෑම (ඒ.එල්.එම්.සුහ්රි) - වන පර්යේෂණ පුවත් ලිපිය.

8. *Santalum album* ශාකයට හානි කරන කඳ පණුවාගේ ආක්‍රමණය සහ එය පාලනය කිරීම. (ආර්.එම්.ඩී. අලවතුගොඩ) වන පර්යේෂණ පුවත් ලිපිය, 13 වන කලාපය.

## 5.7 ජාතික වන ක්ෂේත්‍ර පර්යේෂණ කමිටුව

මෙම අංශය ජාතික වන ක්ෂේත්‍ර පර්යේෂණ කමිටුව සම්බන්ධීකරණය කිරීමේ කටයුතුවල තවදුරටත් නිරත විය. අදාල වර්ෂය තුල රැස්වීම් 4 ක් පවත්වන ලදි. නව පර්යේෂණ ව්‍යාපෘති 38 ක් ඇගයීමට ලක්කල අතර ඒවා සඳහා පර්යේෂණ කටයුතු සිදුකරගෙන යාමට අවසරද ලබාදෙන ලදි. එයට අමතරව දැනට සිදුකරගෙන යමින් පවතින ව්‍යාපෘති 17 ක් සඳහා කාලය දීර්ඝ කිරීම් ලබාදෙන ලදි.

**වගුව 5.1 - පර්යේෂණ කමිටුවේ සාමාජිකයින්**

| | | |
|---|---|---|
| 1. | අනුර සතුරුසිංහ මයා | වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 2. | ආචාර්ය. එන්.ඩී.ආර්.වීරවර්ධන | අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 3. | දීපානි අලවතුගොඩ මිය | වන සංරක්ෂක ( පර්යේෂණ) වන විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය - කුඹල්පොල |
| 4. | ආචාර්ය. සුධීරා රංවල | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ විශ්ව විද්‍යාලය |
| 5. | ආචාර්ය. ප්‍රියාන් පෙරේරා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| 6. | ආර්.එච්.එම්.පී.අබේකෝන් මිය | අධ්‍යක්ෂ / ජෛව විවිධත්ව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය |
| 7. | දිල්රුක්ෂි ඒකනායක මිය | සහකාර අධ්‍යක්ෂ, ජාතික විද්‍යා පදනම |
| 8. | ආචාර්ය.එස්.ඒ.ශෙලෝමි ක්‍රිෂ්ණරාජා | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව |
| 9 | මහාචාර්ය එන්.ඒ.ඒ.එස්.පී. නිස්සංක | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භෝග විද්‍යා දෙපාර්තමේන්තුව පේරාදෙණිය විශ්ව විද්‍යාලය. |
| 10. | ආචාර්ය යූ.කේ.එල්.පීරිස් | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ සහ<br><br>අධ්‍යාපන) වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව. |
| 11. | මහාචාර්ය නිහාල් දයාවංශ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, විද්‍යා පීඨය,කොළඹ විශ්ව විද්‍යාලය. |
| 12. | එම්.ඒ.ඒ.එන්.හේමකුමාර මයා | අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය. |

## 2018 වර්ෂයේ පැවැත් වූ ජාතික වන ක්ෂේත්‍ර පර්යේෂණ කමිටු රැස්වීම් සහ අනුමත කරන ලද පර්යේෂණ ව්‍යාපෘති

### 67 වන රැස්වීම ( 2018 / 01 )

1. ශ්‍රී ලංකාවේ කුරුඳුවල සහ එහි වල් දර්ශවල අණුක හා ජෛව රසායනික ස්වරූපය නිරූපණය කිරීම විවිධ පාරිසරික තත්වයන් යටතේ ප්‍රධාන ජෛව රසායනික ජාන ප්‍රකාශවන ආකාරය අධ්‍යනය කිරීම සහ ශ්‍රී ලංකාවේ කුරුඳු වල ප්‍රයෝජනයට ගැනීමේ අගය එම ශාකයේ විවිධ කොටස් මඟින්ඉහළ නැංවීම - ආචාර්ය. ප්‍රදීපා සී.ජී. බණ්ඩාරණායක සහ මහාචාර්ය ඩී.කේ.ජී පුෂ්පකුමාර, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

2. ලංකාවේ කුරුඳු වල ජෛව රසායනික පැතිකඩ, ජෛව ක්‍රියාකාරී සංයෝග සහ ඖෂධවේදී අධ්‍යයනය. - ආචාර්ය ජිනසේන හේවගේ සහ ආචාර්ය. හේමලිකා වඩුමෙතිරිගේ, රුහුණු විශ්ව විද්‍යාලය.

3. ශ්‍රී ලංකාවේ ඇරක්නිඩාවන් (ගෝනුස්සන් සහ මකුළුවන් ) පිළිබඳ සෛලීය වර්ගීකරණ විද්‍යා අධ්‍යයනය - මහාචාර්ය කේ.බී. රණවන, මටියාස් හර්මන්, ඒ.එන්. තුඩුගල සහ වී.ඒ.ඕ.එස්. ජයරත්න, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

4. ශාක ගවේෂණය - ආචාර්ය. ඒ.එම්.ඒ.එස්. අත්තනායක, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පේරාදෙණිය.

5. ශ්‍රී ලංකාව තුල *Cryptocoryne* සනයේ ( අතිඋදයන්) විශේෂ ව්‍යාප්තියේ සීමාවන් - රූප විද්‍යාත්මක සහ අණුක වංශ ප්‍රෙව්ණික ප්‍රවේශය - ආචාර්ය. සුභානි ඩබ්ලිව්. රණසිංහ සහ මහාචාර්ය. දීප්ති යකන්දාවල, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

6. ශ්‍රී ලංකාවේ කඳු මුදුන් හමුවන ශාක ගවේෂණය: ශ්‍රී පාදයේ කඳුකර ශාක - ආචාර්ය. ඒ.එම්.ඒ.එස්. අත්තනායක, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පේරාදෙණිය සහ ආචාර්ය. එච්.එස්. කත්‍රිආරච්චි, කොළඹ විශ්ව විද්‍යාලය.

7. කඳපොල - සීතා එළිය වන රක්ෂිතයේ සපුෂ්ප ශාක සහ පර්ණාංග ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය - ආචාර්ය. ඒ.එම්.ඒ.එස්. අත්තනායක සහ දොනිල් කුලරත්න, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

8. බඹරබොටුව වන රක්ෂිතය තුල හමුවන සපුෂ්ප ශාක, පර්ණාංග සහ පාසිවල ශාක විවිධත්වය ගවේශණයකිරීමේ මූලික සමාලෝචනය - ආචාර්ය. සුභානි ඩබ්ලිව්. රණසිංහ සහ ඒ.ජී. සුනිල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

9. ශ්‍රී ලංකාවේ මීගමු කලපුව තුලින් හමුවන අන්තලයිකනීය දිලීරවල ජෛවභව්‍යතාව: විශේෂ ව්‍යුහ සහ ජෛව ක්‍රියාකාරී සංයෝගවලින් සමන්විත මෙතෙක් කිසිදු ප්‍රයෝජනයකට නොගත් සම්පත් - මහාචාර්ය. පී.ඒ. පරණගම සහ ආචාර්ය. කේ.පී.ආර්.එන්. අත්තනායක, කැලණිය විශ්ව විද්‍යාලය.

10. ශ්‍රී ලංකාවේ නකල්ස් ලෝක උරුම සංරක්ෂණ වනාන්තරය තුලින් වල් උඩවැඩියා විශේෂ සොයාගැනීම - ආචාර්ය. එච්.අයි.ජී.සී. කුමාර සහ වී.ඒ.එම්.පී.කේ. සමරවික්‍රම, රුහුණු විශ්ව විද්‍යාලය.

11. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ උඩරට සහ මැද රට පසේ අන්තර්ගත විෂ සහිත අංශු මාත්‍ර මූලද්‍රව්‍යවල සාන්ද්‍රණයේ, ද්‍රාව්‍යතාවයේ සහ සුලබතාවයේ පාදක රේඛාව - ආචාර්ය. ඒ.එම්.සී.පී.කේ. අත්තනායක සහ ආචාර්ය. ඩබ්ලිව්. ඒ.වී. විතාරණ, පේරාදෙණිය විශ්විද්‍යාලය.

12. *Buctrocera dorsalis* සංකීර්ණය හා සම්බන්ධ ජාත්‍යන්තර වැදගත්කමක් සහිත පළිබෝධ විශේෂ දෙකක් වන *B.invadens*" Drew" Tsuruta සහ White සහ *B. Kandiensis* ආචාර්ය. යූ.ජී.ඒ.අයි. සිරිසේන සහ ආචාර්ය කෙන්ජි ට්සුරුටා, රජරට විශ්ව විද්‍යාලය.

**<u>68 වන රැස්වීම (2018 / 02)</u>**

1. *Duttaphrynus melanostictus, Euphlyctis Cyanophlyctis* සහ *Lankanectus corrugatus* යන විශේෂ තුනේ පරිසරවිද්‍යාව, රූප විද්‍යාව සහ ජාන සංයුතිය හා බැඳුණු වෙනස්කම් විමර්ශනය කිරීම.

2. ශ්‍රී ලංකාව තුල හමුවන *Boiga* සනය (කුලය - Colubridae) පිළිබඳ චර්යා අධ්‍යයනය - මහාචාර්ය. රණවන, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

3. මහා මාර්ග, දුම්රිය මාර්ග සහ විදුලි රැහැන් වැනි රේඛීය සංවර්ධන මගින් වන ජීවීන් කෙරෙහි පවතින බලපෑම - මහාචාර්ය. දේවක කේ. වීරකෝන්, මහාචාර්ය. එම්.ආර්. විජේසිංහ, කොළඹ විශ්ව විද්‍යාලය.

4. ශ්‍රී ලංකාවේ මුලතිව් දිස්ත්‍රික්කයේ හමුවන ඝන සහ විවෘත වනාන්තර මෙන්ම වන වගා පිළබඳ වන සංගණන සහ මෙහෙයුම් පද්ධතිය - ආචාර්ය. සිවමතී සිවචන්දිරන්, යාපනය විශ්වවිද්‍යාලය.

5. ශ්‍රී ලංකාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි වැද්දාකන්ද වන රක්ෂිතයේ කාබන් සංචිතය සහ විශේෂ විවිධත්වය ප්‍රමාණයකිරීම - ආචාර්ය. සිවමතී සිවචන්දිරන්, යාපනය විශ්වවිද්‍යාලය.

6. වාසස්ථාන විවිධත්වයට ප්‍රතිචාර ලෙස ශ්‍රේණි සංයුතියේ සහ ව්‍යූහයේ වෙනස්කම් - මහාචාර්ය. එච්.ආර්.විජේසිංහ, කොලඹ විශ්වවිදයාලය.

7. කන්නෙලිය රක්ෂිත වනාන්තරයට යාබඳව පිහිටි හායනයටපත්වූ පරණාංග භූමිය ප්‍රතිස්ථාපනය සහ කළමණාකරනය - ශ්‍රී ලංකාවේ IUCN ආයතනය.

8. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ විවිධ වාසස්ථාන වර්ග දෙකක සලබයින්ගේ විවිධත්වය. (Insecta, Lepidoptera) ආචාර්ය චන්දිමා දීපානි දංගල්ල, කොළඹ විශ්ව විද්‍යාලය.

9. ශ්‍රී ලංකාව තුල හමුවන උභය ජීවීන් හා උරගයින් වර්ගීකරණයේ පවත්නා හිදැස් අධ්‍යයනය, ව්‍යාප්තිය,මිනිස් වර්ගයාගෙන් පවත්නා තර්ජන සහ සංරක්ෂණ තත්වය පිළිබඳව ඇගයීම - එල්.ජේ. මෙන්ඩිස් වික්‍රමසිංහ, සභාපති, උරග උභයජීවී පදනම, ශ්‍රී ලංකාව.

10. මැල්සිරිපුර, දොළුකන්ද සහ ගල්කිරියාකන්ද වනාන්තර ප්‍රදේශයේ ඖෂධීය වටිනාකමක් සහිත මානව වංශ උද්භිද විද්‍යාව පිලිබඳ අධ්‍යනය - ආචාර්ය. ජයන්ත විජය බණ්ඩාර, බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය.

11. මධ්‍යම ප්‍රමානයේ විභේදනයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප උපයෝගීකර ගනිමින් වීරක්කොඩිචෝලෙයි - වන්නියාගම වනාන්තර සංකීර්ණයේ භූමි ආවරණය වර්ගීකරණයකිරිම සහ වෙනස්කම් විශ්ලේෂණය කිරීම - ආචාර්ය. කේ.ටී. ප්‍රේමකාන්ත

12. වීරක්කොඩිචෝලෙයි - වන්නියාගම වනාන්තර සංකිර්නයේ භූ දර්ශන මට්ටමේ කාබන් සංචිතය ඇගයිම ආචාර්ය. කේ.ටි.ප්‍රේමකාන්ත.

13. ශ්‍රී ලංකාවේ *Lagoenandra* ඝනය (කෙතල) සංරක්ෂණය සහ එහි ජෛව භූගෝල විද්‍යාව - මහාචාර්ය. කේ.යකන්දාවල, වයඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව.

**69 වන රැස්වීම (2018 / 03)**

1. ශ්‍රී ලංකාවේ විවිධ භූගෝලීය ප්‍රදේශ තුනක Carnivora වර්ගයට අයත් මධ්‍යම ප්‍රමාණයේ භෞමික ක්ෂීරපායීන්ගේ විවිධත්වය සහ පරිසර විද්‍යාව - මහාචාර්ය. ඩබ්ලිව්.ඒ.ඩී.මහඋල්පත, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

2. ආදි සම්භවය උපකරණ සහ අණුක ජීව විද්‍යාත්මක උපකරණ යන දෙවර්ගයම උපයෝගීකර ගනිමින් *Dendrobium* වර්ග වල ජානමය විවිධත්වය සහ ප්‍රභේද වැඩි දියුණුකිරීම මහාචාර්ය. ප්‍රියංගනී සේනානායක.

3. *Osbeckia lantana Alston* නැමති ආවේණික සහ වඳවීයාමේ තර්ජනයට ලක් වූ ශාක විශේෂයේ ස්වභාවික වල් දර්ශ සඳහා උපායමාර්ගිකව ප්‍රකෘති තත්වයට පත්කිරීම සඳහා සැලැස්ම.

4. ජලයේ ගුණාත්මකබව නිර්ණය කිරීමේ දර්ශක ලෙස මිරිදිය කෘමීන් රාශිවීම - ආචාර්ය නිර්මලී පල්ලෙවත්ත කොළඹ විශ්ව විද්‍යාලය.

5. ශ්‍රී ලාංකීය ආහාරයටගත හැකි වල් හතු දර්ශ වගාකිරීමේ තත්වයන් උපරිම තත්වයකට පත්කිරීම - ආචාර්ය. මුනසිංහ, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විදයාලය.

6. ශ්‍රී ලංකාවේ වර්ෂා වනාන්තර තුල *Ceratophara aspera* (අගම්ඩේ) විශේෂයේ ප්‍රමාණාත්මක අගැයිමක් සිදුකිරිම සහ ජානමය විවිධත්වය සිතියම්ගත කිරිම - ආචාර්ය. නිර්මලී පල්ලෙවත්ත කොලඹ විශ්ව විද්‍යාලය.

7. ස්ථානිය නොවන ජීව ක්‍රියාකාරී හැකියාව සඳහා *Gyrinops walla* ශාකය සහ ඒ හා සම්බන්ධව අන්තශ්ශාක පිරික්සීම - මහාචාර්ය. ප්‍රීති සොයිසා කොළඹ විශ්ව විද්‍යාලය.

**<u>70 වන රැස්වීම (2018 / 04</u>)**

1. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ඉඩම්වල භෞමික ගොළුබෙල්ලන්ගේ ව්‍යාප්තිය, ඔවුන්ගේ ඍතුමය සුලබතාව සහ බෝගවලට සිදුකරන හානියේ ස්වභාවය - ආචාර්ය. එන්.පී.එස්. කුඹුරෙගම, පේරාදෙනිය විශ්ව විද්‍යාලය.

2. ශ්‍රී ලංකාවේ තිබෙන කරපිංචා විශේෂය ආහාර පිසීමේදී ආහාරයේ ඉතිරිව තිබෙන. තෝරාගත් පලිබෝධනාශක අවශේෂ අවශෝෂණයකර ගැනිම සහ එහි කැරටිනොයිඩ් සංයුතියේ වෙනස්කම් කෙරෙහි මෙහි බලපෑම ආචාර්ය. ඩී.ටී. අබේසිංහ, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

3. ශ්‍රී ලංකාවේ හමුවන Myrtaceae කුලයට අයත් *Zyzygium* විශේෂයේ DNA තීරු කේතකිරීම, රූප විද්‍යාත්මක වර්ගීකරණයසහ වංශ ප්‍රවේණිය - සංරක්ෂණය සඳහා පවතින සම්බන්ධතා සහ තිරසාර අන්දමට භාවිතයට ගැනීම - ආචාර්ය. එච්.එස්.කත්‍රිආරච්චි. කොළඹ විශ්ව විද්‍යාලය.

4. තුන්ඩෝලා සංරක්ෂණ ව්‍යාපෘතිය - වාසස්ථාන ප්‍රතිජනනය සහ ප්‍රජාව දැනුවත්කිරීම තුලින් තුන්ඩෝලා පරිසර පද්ධති සංරක්ෂණය කිරීම - හර්ෂිනී ද සිල්වා, ජෛව විවිධත්ව ආයතනය, ශ්‍රී ලංකාව.

5. ශ්‍රී ලංකාවේ කඩොලාන සහ කරදිය වගුරු පරිසර පද්ධතිවල කාබන් රඳවාතබාගැනීමේ හැකියාව ඇස්තමේන්තුකිරීම සහ සිතියම්කරණය - ආචාර්ය. රේණුකා රත්නායක, ජාතික මූලික අධ්‍යයන ආයතනය.

6. ශ්‍රී ලංකාවේ *Strobilanthes* විශේෂ සංරක්ෂණය සහ වර්ගීකරණය සමාලෝචනය කිරීම - ආර්.එම්.ආර්. නිලන්ති, වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

7.

<u>දැනට සිදුකරන පර්යේෂණ ව්‍යාපෘතිවල කාලය දීර්ඝකිරීම</u>

1. ශ්‍රී ලංකාවේ හමුවන පත්‍රාකාර අක්මාශාකවල වර්ගීකරණය සහ ජෛව භූගෝල විද්‍යාව - ආචාර්ය. සුමුදු කේ.සුබසිංහ, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

2. ශ්‍රී ලංකාවේ හමුවන ඔඩොනාටාවන් (බත්කූරන් සහ මැස්සන්) පිළිබඳ පර්යේෂණ - සුලභතාව, ව්‍යාප්තිය සහ ජීවන ඉතිහාසය - ආචාර්ය. ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්, හම්මාලිය වත්ත, බණ්ඩාරකොස්වත්ත.

3. අම්බොක්ක කඳු පන්තියේ ශාක විවිධත්වය - මහාචාර්ය. එච්.එම්.එස්.පී. මඩවල, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

4. ශ්‍රී ලංකාවේ සමනළුන් පිළිබඳ පර්යේෂණ - සුලබතාව, ව්‍යාප්තිය සහ ජීවන ඉතිහාසය - ආචාර්ය. ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්, හම්මාලිය වත්ත, බණ්ඩාරකොස්වත්ත.

5. සිංහරාජ රක්ෂිත වනාන්තරයේ අපි පත්‍රී ලයිකන පිළිබඳ වර්ගීකරණය අධ්‍යයනය - ආචාර්ය. ආර්.ජී.යූ. ජයලාල්, සබරගමුව විශ්වවිද්‍යාලය.

6. ශ්‍රී ලංකාව තුල වඳුරු - මිනිස් ගැටුම විසඳීම තුලින් ප්‍රයිමේටාවන් සංරක්ෂණය කිරීම - මහාචාර්ය. දේවක වීරකෝන්, කොළඹ විශ්ව විද්‍යාලය.

7. ඉදිකඩ මූකලාන යෝජිත වන රක්ෂිතය තුල වෙසෙන *Semnopithecus vetulus nester* විශේෂයේ පරිසර විද්‍යාව, ආහාර ගැනීමේ චර්යාව සහ භාවිතාකරන පරාස පිළිබඳව අධ්‍යයනය කිරීම සහ මෙම විශේෂය සංරක්ෂණය කිරීමට මහජන සහාය ලබාගැනීම - ආචාර්ය. ජිනී දැල.

8. ශ්‍රී ලංකාවේ වෙසෙන ක්‍රැබ් මකුළුවන්ගේ ජෛව විවිධත්වය ඔවුන්ගේ රූප විද්‍යාව සහ DNA තීරු කේතය උපයෝගී කරගනිමින් අධ්‍යයනය කිරීම - මහාචාර්ය. එස්.පී.බෙන්ජමින්, ජාතික මූලික අධ්‍යයනය ආයතනය.

9. ශ්‍රී ලංකාවේ හිකනළුන් පිළිබඳ අණුක ක්‍රමානුකූල අධ්‍යයනය සහ පරිණාමය හා ජෛව භූගෝල විද්‍යාව පිළිබඳ අධ්‍යයනය - ආචාර්ය. කේ.ඩී.බී. උකුවෙල, රජරට විශ්ව විද්‍යාලය.

10. කන්නෙලිය රක්ෂිත වනාන්තරයේ ශාක විවිධත්වය ආචාර්ය. ලේඛා වනසේකර, හොරයිසන් විශ්ව විද්‍යාලය, මාලබේ.

11. වනාන්තරයේ ගති විද්‍යාව අධ්‍යයනය සඳහා සිංහරාජයේ තිබෙන හෙක්ටයාර 25 බිම් කොටසේ පස්වන වරට සිදුකරන සංගණනය - මහාචාර්ය. සිසිර එදිරිවීර, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය.

12. උප - පෝෂක මට්ටමේදී පාංශු පොස්පරස් සහ කාබනික ආකාරයට පවතින කාබන් පිළිබඳ සවිස්තරාත්මක සංගණනයක් සකස්කිරීම - ආචාර්ය. ඩබ්ලිව්. ඒ.වී.විතාරණ, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

13. කුමාරගල වන රක්ෂිතය තුල මරගමුවේ පිහිටි දැව ඉවත්කල ඉයුකැලිප්ටස් වන වගාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම - මහාචාර්ය. කේ.බී. රණවන, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

14. ජෛව විවිධත්වයෙන් අනූන ස්ථානයක සංරක්ෂණ ක්‍රියාවලිය පසහුකිරීමට ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන්ගේ පරිණාමන පරිසර විද්‍යාව සහ වංශප්‍රවේණික බන්ධුතා - ආචාර්ය. මාධව මීගස්කුඹුර, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

15. නිවර්තන වර්ෂා වනාන්තරවල කාබන් ශේෂය සහ ජෛව විවිධත්වය කෙරෙහි අනාගත දේශගුණික විපර්යාසවල බලපෑම පිළිබඳව අනාවැකි කළකිරීම සඳහා වෙනස්වන වායුගෝලීය උෂ්ණත්වයට ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන එම වනාන්තර වර්ගයේ ප්‍රතිචාරය ප්‍රමාණාත්මකව ගණනය කිරීම - මහාචාර්ය. ඩබ්ලිව්. ඒ.ජේ.එම්.ද කොස්තා, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

16. ශ්‍රී ලංකාව තුල ජාන ගලායාම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ආවේණිකත්වයට පවත්නා බාධක - දේශගුණික සහ උච්චත්ව අනුක්‍රමණයක් ඔස්සේ ආවේණික පක්ෂීන් සහ ඔවුනගේ වංශප්‍රවේණික බන්ධූන් අතර ජාන ගලායෑම සහ ලක්ෂණ වෙනස්වන මට්ටම පිළිබඳව ගැඹුරින් අගැයීම - ආචාර්ය. සම්පත් එස්. සෙනෙවිරත්න, කොළඹ විශ්ව විද්‍යාලය.

17. ට්‍රෙමටෝඩාවන් සහ පාරජම්බුල විකිරණ මගින් ඇති කළ විරූපතාවන් සහ උභය ජීවීන් කෙරෙහි කෘෂිරසායනික ද්‍රව්‍ය මගින් ඇතිකරන විෂ - මහාචාර්ය. ආර්.එස්. රාජකරුණා, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

## 5.8 පුස්තකාලය.

රු. 494,347.50 ක වටිනාකමකින් යුක්ත පොත් සහ සඟරා පුස්තකාලය සඳහා මිලදීගන්නා ලදි. පොත් 48 ක් සහ සඟරා 08 ක් මෙම වසර තුල මිලදීගෙන තිබේ. පොත් 60 ක් පරිත්‍යාග ලෙස ලැබී තිබේ.

CD – ISIS පුස්තකාල පැකේජය යොදා ගනිමින් පුස්තකාල ග්‍රන්ථ නාමාවලිය මෙම වසරේදී ද පරිගනක ගතකරන ලදි. අදාල වර්ෂය අවසානයේදී දත්ත 5,100 ක් මෙම දත්ත ගබඩාවට ඇතුලත්කර තිබුණි.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෙම වසර සඳහාද IUFRO සමාජිකත්වය ලබාගෙන තිබේ. ( සමාජික මුදල් ලෙස රු. 76,387.00 ක් ගෙවා තිබේ)

## 5.9 වන විද්‍යා තොරතුරු සේවාව

ශ්‍රී ලංකා ෆොරස්ටර් සඟරාවේ 39 වන වෙළුම ප්‍රකාශයට පත්කරන ලදි.

## 5.10 වන විද්‍යා අධ්‍යාපනය

### 5.10.1 දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා සාමාන්‍ය පාඨමාලා.

වන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව (NVQ මට්ටම) යටතේ අඩවි වන නිලධාරීන් 47 ක් පුහුණු කරන ලදි. මෙම පාඨමාලාවට තාක්ෂණික සහ මෘදු කුසලතා යන දෙවර්ගයේම පාඨමාලා අන්තර්ගතවිය. 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා වන විද්‍යායතනය මඟින් ලබා දෙන වන තාක්ෂණික විද්‍යාවේ NVQ 5 මට්ටමේ පාඨමාලාව සඳහා පිළිගැනීමක් ලැබුණි. NVQ 5 පාඨමාලාව සහ එහි විභාග තෘතීක වෘත්තීය අධ්‍යාපන කොමිසමේ නීති රීති වලට යටත්ව පවත්වන ලදි. පාඨමාලාවේ ඇගයීම් ප්‍රශ්න පත්‍ර තෘතීක

වෘත්තීය අධ්‍යාපන කොමිසම විසින් ලත්කරන ලද ප්‍රමිදූ කාරකයින් විසින් ප්‍රමිදූකරණයට ලක්කරන ලදි. NVQ 5 වන මට්ටමේ පාඨමාලාවේ අන්තර්ගතය 5.2(අ) හා 5.2(ආ) වගු මඟින් දක්වා තිබේ.

වගුව **5.2 (**අ) - වන තාක්ෂණික විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ NVQ 5 වන මට්ටමේ පාඨමාලාවේ 1 වන අධ්‍යයන වාරයේ පාඨමාලාවේ අන්තර්ගතය.

| මොඩියුල කේතය | අධ්‍යන ඒකකය (මොඩියුලය) | කාණ්ඩය | මතික පැය | දේශන / නිබන්ධන | ප්‍රායෝගික / නිර්මාණ /ක්ෂේත්‍ර චාරිකා | ස්වයං අධ්‍යය නය |
|---|---|---|---|---|---|---|
| A02C001M01 | මූලික ගණිතය | C | 50 | 30 | 10 | 10 |
| A02C001M02 | උද්භිද විද්‍යාවේ මූලධර්ම | C | 50 | 36 | 12 | 02 |
| A02C001M10 | තවාන් කලමනාකරණය | C | 100 | 30 | 60 | 10 |
| A02C001M03 | රුක් රෝපණය, දැව නොවන වනජ නිශ්පාදන සහ ඒවායේ භාවිතය | C | 150 | 84 | 42 | 24 |
| A02C001M04 | වනාන්තර මැනීම සහ සංගණනය | C | 100 | 40 | 42 | 18 |
| A02C001M06 | වන විද්‍යාව හා පරිසරය හඳුන්වාදීම | C | 100 | 60 | 20 | 20 |
| A02C001M11 | මැනීම සහ සිතියම් සකස්කිරීම | C | 75 | 24 | 42 | 09 |
| A02C001M16 | ගිනි කලමනාකරණය | C | 25 | 10 | 10 | 05 |
| සේවායෝජනීය මොඩියුල | | | | | | |
| EMPM01 | සේවා ස්ථානයේ තොරතුරු කලමනාකරණය | C | 75 | 30 | 30 | 15 |
| | | | **750** | | | |

වගුව **5.2 (**ආ) - වන තාක්ෂණික විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ NVQ 5 වන මට්ටමේ පාඨමාලාවේ 2 වන අධ්‍යයන වාරයේ පාඨමාලාවේ අන්තර්ගතය.

| මොඩියුල කේතය | අධ්‍යන ඒකකය (මොඩියුලය) | කාණ්ඩය | මතික පැය | දේශන / නිබන්ධන | ප්‍රායෝගික / නිර්මාණ /ක්ෂේත්‍ර චාරිකා | ස්වයං අධ්‍යය නය |
|---|---|---|---|---|---|---|
| A02C001M07 | දුරස්ථ සන්නිවේදනය GIS - 1 | C | 50 | 20 | 22 | 08 |
| A02C001M08 | වන කලමණාකරන - 1 | C | 50 | 30 | 12 | 08 |
| A02C001M12 | පාරිසරික සංචාරක කර්මාන්තය | C | 75 | 33 | 36 | 06 |
| A02C001M13 | වනාන්තරවලින් අස්වැන්න ලබාගැනීම සහ මූලික ඉංජිනේරු ශිල්පය | C | 75 | 36 | 30 | 09 |
| A02C001M14 | දැව විද්‍යාව සහ දැව භාවිතය | C | 75 | 30 | 36 | 09 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| A02C001M15 | සමාජ වන විද්‍යා හා වන ව්‍යාප්ති | C | 100 | 60 | 40 | 10 |
| A02C001M09 | අඩවි පරිපාලනය - 1 | C | 50 | 30 | 06 | 14 |
| A02C001M17 | නීති ක්‍රියාත්මකකිරීම | C | 100 | 72 | 24 | 04 |
| A02C001M05 | වෘක්‍ෂ විද්‍යාව | | 75 | 30 | 36 | 09 |
| සේවායෝජනීය මොඩියුල | | | | | | |
| EMPM02 | සේවා ස්ථානයේ සන්නිවේදනය කලමනාකරණය කිරීම | C | 50 | 20 | 20 | 10 |
| EMPM03 | සේවා ස්ථානයේ රාජකාරි සැලසුම්කිරීම සහ ලේඛනගත කිරීම | | 75 | 30 | 20 | 25 |
| එකතුව | | | **750** | | | |

**5.10.2** **වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ සේවයේ නිරත නිලධාරීන් සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන්**

සේවයේ නිරත නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ පැවැත්වූ පුහුණු වැඩසටහන් සඳහා පරිසර පද්ධති සංරක්‍ෂණ සහ කලමනාකරණ ව්‍යාපෘතිය මඟින් මූල්‍යාධාර සපයන ලදි. ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ කාර්ය මණ්ඩලය විසින් මෙම පුහුණු වැඩසටහන පවත්වනලද අතර බාහිර ආයතනවලින් සම්පත් දායකයින් ලබාගන්නා ලදි. මෙම පාඨමාලාව පිළිබඳ කෙටි විස්තරයක් වගුව 5.3 මගින් දක්වා තිබේ.

**වගුව 5.3 - 2018 වර්ෂය තුල ශ්‍රී ලංකා වන විද්‍යාලය විසින් වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුවේ සේවයකරන නිලධාරීන් සඳහා පවත්වනලද පුහුණු වැඩසටහන්**

| අනු අංකය | පාඨමාලාවේ නම | සහභාගීවූ කණ්ඩායම | ස්ථානය | සහභාගීවූ සංඛ්‍යාව | දිනය | දින සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 01 | වියළි කලාපීය වනාන්තරවල හායනයට පත් වූ භූමි ප්‍රතිස්ථාපනය | අඩවි වන නිලධරී/ වන පාලක | පටපිළිකන්ද මින්නේරිය | 31 | 14.03.2018 16.03.2018 | 03 |
| 02 | වියළි කලාපීය වනාන්තරවල හායනයට පත් වූ භූමි ප්‍රතිස්ථාපනය | අඩවි වන නිලධරී/ වන පාලක | පසු අස්වනු තාක්‍ෂණික ආයතනය, අනුරාධපුර | 30 | 06.06.2018 08.06.2018 | 03 |
| 03 | පෞරුෂ වර්ධනය සහ නායකත්ව පුහුණු වැඩසටහන | වන විද්‍යායතනයේ කාර්ය මණ්ඩලය සහ අඩවි වන නිලධාරී (පුහුණු) | ශ්‍රී ලංකා වන විද්‍යායතනය, නුවරඑළිය | 60 | 18.05.2018 19.05.2018 | 01 |
| 04 | වන විද්‍යාව පිළිබඳ උසස් පරිගණක යෙදවීම | වන විද්‍යාලයේ කාර්යමණ්ඩලය/ පර්යේෂණ කාර්යමණ්ඩලය/ | ශ්‍රී ලංකා වන විද්‍යායතනය, නුවරඑළිය | 30 | 08.08.2018 10.08.2018 | 03 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | දිසාවන කාර්යාල කාර්ය මණ්ඩලය | | | | |
| 05 | නීති ක්‍රියාත්මකකිරීම සහ උසාවි පරිපාටිය පිළිබඳ සේවස්ථ පුහුණු වැඩසටහන | අඩවි වන නිලධාරී/ බීට්ටු වන නිලධාරී/ වන ක්ෂේත්‍ර සහකාර | ශ්‍රී ලංකා වන විද්‍යායතනය, නුවරඑළිය | 50 | 09.07.2018 13.07.2018 | 05 |
| 06 | නායකත්ව පුහුණු වැඩසටහන | අඩවි වන නිලධාරී (පුහුණු) | ඉනාමළුව | 50 | 20.07.2018 22.07.2018 | 03 |
| 07 | වන විද්‍යාවේ පැල තවාන් කලමනාකරණය හා සම්බන්ධ පුහුණු වැඩසටහන | බීට්ටු වන නිලධාරී/ වන ක්ෂේත්‍ර සහකාර | ශ්‍රී ලංකා වන විද්‍යායතනය, නුවරඑළිය | 40 | 30.07.2018 02.08.2018 | 05 |
| 08 | ආක්‍රමණශීලී ආගන්තුක ශාක විශේෂ පිළිබඳ පරිපූර්ණ පුහුණු වැඩසටහන | අඩවි වන නිලධරී/ වන පාලක | පස්සර, බදුල්ල | 38 | 18.09.2018 20.09.2018 | 03 |
| 09 | ජාතික උද්භිද විද්‍යා උද්‍යානයේ වන විද්‍යාව සඳහා ගෙඋයන් විද්‍යා පිළිබඳ ශිල්පීය ක්‍රම | වන විද්‍යායතනයේ කාර්ය මණ්ඩලය/ ක්ෂේත්‍ර කම්කරුවන් | රාජකීය ජාතික උද්භිද විද්‍යා උද්‍යානය, පේරාදෙණිය | 40 | 22.10.2018 26.10.2018 | 05 |
| 10 | නීති ක්‍රියාත්මක කිරීම සහ උසාවි පරිපාටිය පිළිබඳ සේවස්ථ පුහුණු වැඩසටහන | අඩවි වන නිලධාරී/ බීට්ටු වන නිලධාරී/ වන ක්ෂේත්‍ර සහකාර | පසු අස්වනු තාක්ෂණික ආයතනය, අනුරාධපුර | 75 | 27.08.2018 31.08.2018 | 05 |
| 11 | විනය පරිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්, සහකාර වන සංරක්ෂක, විශේෂ වන පාලක, වන පාලක, අඩවි වන නිලධාරී | ශ්‍රී ලංකා වන විද්‍යායතනය, නුවරඑළිය | 42 | 24.05.2018 25.05.2018 | 02 |
| 12 | පරිසර පද්ධති කලමනාකරණය සඳහා භූ දර්ශ ප්‍රවේශය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | වන විද්‍යාලයේ කාර්ය මණ්ඩලය, අඩවි වන නිලධාරී (පුහුණු) | ශ්‍රී ලංකා වන විද්‍යායතනය, නුවරඑළිය | 54 | 03.12.2018 | 01 |
| 13 | අළුතින් බඳවාගත් ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පදවි පිරිනැමීමේ පුහුණු වැඩසටහන | අඩවි වන නිලධාරී, වන ව්‍යාප්ති නිලධාරී, වන ක්ෂේත්‍ර | ශ්‍රී ලංකා වන විද්‍යායතනය, නුවරඑළිය | 38 | 05.11.2018 11.11.2018 | 07 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | නිලධාරී | | | | |

**5.10.3 අනෙකුත් ආයතන සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන්.**

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ඉන්ධන දර ජෛව ස්කන්ධ ව්‍යාපෘතියේ සහයෝගීත්වය ඇතිව තිරසර ඉන්ධන දර නිශ්පාදනය පිළිබඳ එක්, කෙටිකාලීන පුහුණු වැඩසටහනක් පවත්වන ලදි. පුහුණු වැඩසටහන පැවැත්වීම සඳහා මූල්‍යාධාර එම ව්‍යාපෘතිය මඟින් සපයන ලදි. වැව්ලි, කෘෂිකර්ම යන ක්ෂේත්‍ර වලින් සහ රාජ්‍ය නොවන සංවිධාන වලින් පුද්ගලයින් 30 ක් මෙම වැඩසටහන සඳහා සහභාගීවන ලදි. එම පුහුණු වැඩසටහන පිළිබඳ වැඩිදුර තොරතුරු වගුව 5.4 මඟින් ඇක්වේ.

**වගුව 5.4 - අනෙකුත් ආයතන සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන්**

| අනු අංකය | පාඨමාලාවේ නම | සහභාගී වූ කණ්ඩායම | ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව | දිනය | දින සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකාවේ තිරසර ඉන්ධන දර නිෂ්පාදන පිළිබඳ තුන් දින නේවාසික පුහුණු වැඩසටහන | වැවිලි සහ කෘෂිකර්ම ක්ෂේත්‍රවල සේවකයින් | බණ්ඩාරවෙල එරබැද්ද වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පැල තවාන | 30 | 07.10.2018<br>09.10.2018 | 03 |

වන ක්ෂේත්‍ර සහකරුවන් 265 ක් සඳහා ශාක විද්‍යාව (මූලික මට්ටම) පිළිබඳ සිද්ධාන්ත විභාගය පවත්වන ලදි. සිද්ධාන්ත සහ ප්‍රායෝගික යන විභාග දෙකෙහිම ප්‍රතිඵල සකස්කර අවසන්කර තිබේ. ( දිසා වන නිලධාරීන් විසින්)

**5.10.4 පරිසර පද්ධති සංරක්ෂණ සහ කලමණාකරන ව්‍යාපෘතිය මගින් සැපයෙන මූල්‍යාධාර යොදාගන්මින් ශ්‍රී ලංකා වන විද්‍යායතනය අලුත් වැඩියා කිරීම සහ වැඩිදියුණුකිරීම.**

ලෝක බැංකු ආධාර ලබන පරිසර පද්ධති සංරක්ෂණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය මගින් ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ සහ ඉනාමළුව ක්ෂේත්‍ර ස්ථානයේ අළුත්වැඩියා සහ වැඩිදියුණු කිරීම් කටයුතු මෙහෙයවනු ලැබේ. ව්‍යාපෘතියේ නිර්මාණ කටයුතු සහ අධීක්ෂණ කටයුතු Resource Development Consultant (Pvt) Ltd. වෙත ලබාදී තිබේ. මෙම ස්ථාන දෙක සඳහාම සැලසුම් නිර්මාණයකිරීමේ කටයුතු මේ වන විට අවසන්වී තිබෙන අතර ඒවා සඳහා අදාල අනුමතකිරීමේ ආයතනවලින් අනුමැතියද ලබාගෙන තිබේ. වැඩිදුර සැලසුම්කිරීමේ කටයුතු, BOQ සකස්කිරීමේ කටයුතු සහ ටෙන්ඩර් ලේඛන සකස්කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

## 5.11 අංශයේ මූල්‍යමය කාර්යසාධනය.

මෙම අංශයට ලැබුණු රුපියල් මිලියන 27.971 ක් සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රුපියල් මිලියන 27.410 ක මුදලක් වසර අවසාන වන විට වියදම්කර තිබේ.

## 6 වන පරිච්ඡේදය

## වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශය

### 6.1 හැඳින්වීම

වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ, නීතිමය ආරක්ෂාව තහවුරු කර, ස්වභාවික වනාන්තර, වන වගා සහ එහි සිටින වන ජීවීන්ද, අනෙකුත් ජෛව විවිධත්වය සඳහා දායකවන සම්පත්ද, සුරැකීමට සහ සංරක්ෂණය කිරීමට සහාය වී, එමඟින් වනාන්තර වලින් සැපයෙන පාරිසරික සේවාවන් සහ වනජ නිෂ්පාදන අඛණ්ඩව සැපයීමට, රජයට අයත් වන සම්පත් වලට ලැබිය යුතු නීතිමය ආරක්ෂාව සැපයීමයි. මීට අමතරව ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය, හදිසි වැටලීම් අංශ සහ දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන හරහා, වන නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරයි.

### 6.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දක්වා තිබේ.

- **i.** වන සංරක්ෂණ ආඥා පනතේ පරිපාලනමය කටයුතු.
- **ii.** ජාතික උරුම වන භූමි පනතේ පරිපාලනමය කටයුතු.
- **iii.** වන සංරක්ෂණ ආඥා පනත යටතේ වනාන්තර ප්‍රකාශයට පත් කිරීම.
- **iv.** දැව පදනම් කරගත් කර්මාන්ත සහ දැව ප්‍රවාහනය පාලනය කිරීම.
- **v.** රජයේ වනාන්තර සම්පත්, භෞතික වශයෙන් ආරක්ෂා කිරීම සහ පාලනය කිරීම.
- **vi.** වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ, පරිපාලන කටයුතු සිදු කිරීම.
- **vii.** වන නිලධාරින් සඳහා නිල ඇඳුම් මිලදී ගැනීම හා සැපයීම.
- **viii.** දැව සහ දැව නොවන වනජ ද්‍රව්‍ය අපනයනය පාලනය කිරීම.

### 6.3 ආයතනික සැකැස්ම

**2018** වසරේදී මෙම අංශය වන සංරක්ෂකවරයෙකු යටතේ පාලනය වූ අතර, අධීක්ෂණ කටයුතු වලට සහකාර වන සංරක්ෂකවරයෙක්, විශේෂ වන පාලකවරුන් තිදෙනෙක්, අඩවි වන නිලධාරීන් තිදෙනෙක්, බීට්ටු වන නිලධාරීන් දෙදෙනෙක් සහ වන ක්ෂේත්‍ර සහකාරවරුන් දෙදෙනෙක් සහාය දක්වන ලදී.

දිසා වන නිලධාරීන් 23 දෙනාට සහ ඔවුන්ගේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට, අදාල දිසාවන්හි පිහිටි රජයේ වනාන්තර ආරක්ෂා කිරීම සහ නීති ක්‍රියාත්මක කිරීම යන කටයුතු වල වගකීම පැවරී තිබේ.

ප්‍රාදේශීය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හැරුණු විට කලාපභාර නියෝජ්‍ය වන සංරක්ෂකවරුන් අදාල දිසාවන්හි දිසා වන නිලධාරීන්ගේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ සෘජුවම ක්‍රියාත්මක වන, පහත සඳහන් ඒකකද පාලනය වේ.

**i)** හදිසි වැටලීම් අංශය - **02**
(ප්‍රධාන කාර්යාලය **01,** වයඹ/බස්නාහිර කලාප කාර්යාලය **01)**

**ii)** ස්ථිර දැව පරීක්ෂාකිරීමේ මධ්‍යස්ථාන - **02**
(දඹුල්ල, පස්යාල)

ප්‍රධාන කාර්යාලයේ හදිසි වැටලීම් අංශය විශේෂ වන පාලකවරුන් 03, අඩවි වන නිලධාරීන් 03, බීට්ටු වන නිලධාරීන් 02, සහ වන ක්ෂේත්‍ර සහකාරවරයන් 02 දෙනෙකුගෙන් සමන්විත වන අතර සහකාර වන සංරක්ෂකවරයෙකුගේ අධීක්ෂණය යටතේ පවතී. මෙය ලංකාව පුරා නීති විරෝධී ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීමට අදාල හදිසි වැටලීම් කටයුතු වල නිරත වේ. මෙයට අමතරව ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර 01, කළමනාකරණ සහකාර 02, වන ක්ෂේත්‍ර සහකරුවන් 06 දෙනෙකු

කළමනාකරණ සහකාර වරුන්ගේ කාර්යයන් ඉටු කරනු ලැබේ. තවද කාර්යාල කාර්යය සහයක සේවකයන් 04 දෙනෙකුද, කාර්යාල කම්කරු 01 අයෙකුද සේවය කරනු ලැබේ. කලාප හදිසි වැටලීම් ඒකකය වන පාලකවරයෙකු, අඩවි වන නිළධාරීන් දෙදෙනෙකු සහ බීට්ටු වන නිළධාරීවරු දෙදෙනෙකු යටතේ පවත්වාගෙන යනු ලබයි. හදිසි වැටලීම් ඒකකයේ විමර්ෂණ හා පරීක්ෂණ වන සංරක්ෂක ජනරාල්ගේ උපදෙස්වලට අනුව සිදු කරනු ලැබේ. අදාල දිසා වන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ, දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන අතර, මෙම ඒකක ජොෂ්ඨ අඩවි වන නිලධාරියෙකුගේ මූලිකත්වයෙන් ක්‍රියා කරයි.

## 6.4 ක්‍රියාකාරකම් පිළිබඳ සාමාන්‍ය සමාලෝචනයක්

ආරක්ෂණය සහ සම්බන්ධ ප්‍රධාන කාර්ය භාරයන් දිසාවන් 23 ට අනුබද්ධව සේවය කරන ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් ඉටු කරයි. 2018 වසර තුලදී මෙම දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය විසින් වන අපරාධ 3,757 ක් නීතියට හසුකරගෙන තිබේ.

මහජනයාගෙන් වන සංරක්ෂක වෙත හෝ වන සංරක්ෂක ජනරාල් වෙත හෝ අමාත්‍යාංශය වෙත හෝ ජනාධිපති කාර්යාල වෙත සෘජුව ලැබෙන තොරතුරු මත විශාල ප්‍රමාණයේ වන අපරාධ වැටලීම සඳහා ප්‍රධාන කාර්යාලයේ හදිසි වැටලීම් අංශය යෙදවීමට ක්‍රියා කරයි.
වන සංරක්ෂණ ආඥා පනතේ නියෝගවලට අනුකූලව දවසේ පැය 24 පුරාම නීති විරෝධී දැව සහ වනජ නිෂ්පාදන ප්‍රවාහනයන් අල්ලා ගැනීම සඳහා ස්ථිර දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ.

දැව ඉරුම්හල්, දැව අලෙවිසැල්, වඩුමඩු, දැව පදම් කිරීමේ ආයතන, ජංගම දැව ඉරුම්හල්, දර අලෙවිසැල් ආදිය ලියාපදිංචි කිරීම, ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ, අඩවි වන නිලධාරීන්ගේ නිර්දේශ මත දිසා වන නිලධාරින් විසින් සිදු කරනු ලැබේ.

වන සංරක්ෂණ ආඥා පනත අනුව ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණ වනාන්තර ලෙස හෝ රක්ෂිත වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කිරිම මෙම අංශය මගින් සිදු කරන තවත් ප්‍රධාන කාර්යයකි.
ඉහත ක්‍රියාකාරකම් වලට අමතරව දැව / දැවමය නිෂ්පාදන සහ ශාක / ශාකමය ද්‍රව්‍ය අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කරමින් එම ද්‍රව්‍ය අපනයනය නියාමනය කිරිමද මෙම අංශයේ වගකීමක් වේ.

## 6.5 වන සංරක්ෂණ ආඥා පනත යටතේ නව වනාන්තර ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරිම

2018 වසර තුල එම කාර්යයන් යටතේ අති විශේෂ ගැසට් 06ක් නිකුත් කරන ලද අතර, සංරක්ෂිත වනාන්තර 01ක් සහ රක්ෂිත වනාන්තර 09ක් ප්‍රකාශයට පත් කරන ලදී.

## 6.6 ආරක්ෂණ කටයුතු වල ප්‍රගතිය

### 6.6.1 සාමාන්‍ය

නීති විරෝධී දැව හෙළීම්, එළි පෙහෙළි කිරීම්, ප්‍රවාහනය, මැණික් ගැරීම්, රජයේ දැව සන්තකයේ තබාගැනීම සහ ලියාපදිංචියක් රහිතව පුද්ගලික දැව ව්‍යාපාර පවත්වාගෙන යාම ආදිය ඇතුලත් වන අපරාධ 3,757 ක් 2018 වසර තුලදී වාර්තා වී ඇත.
දෙපාර්තමේන්තුව විසින් නීති විරෝධී දැව සන්තකයේ තබාගැනීම් 84ක් පිළිබඳව අවසන් තීරණ ගන්නා ලද අතර, ඉතිරි වන අපරාධ 3,577ක් උසාවියට ඉදිරිපත් කරන ලදී. ඒවාට පුද්ගලයින් 3,990ක් සම්බන්ධ වී තිබේ. මේවාට අයත් පුද්ගලයින් 53දෙනෙක් සිරගත කරන ලද අතර, තවත් නඩු 07කදී අදාල පුද්ගලයින්ට දැඩි ලෙස අවවාද කර තිබේ. තවත් නඩු 1994 කදී වැරදිකරුවන්ගෙන් රු. 41,731,814.65 ක මුදලක් දඩ ලෙස අය කරගෙන තිබේ. රාජසන්තක කරන ලද වාහන අතර ලොරි 29ක්, රෝද දෙකේ ට්‍රැක්ටර් 47ක්, ට්‍රැක්ටර් 07ක්, යතුරු පැදි 10ක්, හා පාපැදි 21ක් වන අතර ඒවායේ

මුළු වටිනාකම රු. 34,003,300.00 කි. වන අපරාධ පිළිබඳ වැඩිදුර විස්තර ඇමුණුම් I , II , සහ III මගින් දැක්වේ.

### 6.6.2 හදිසි වැටලීම් ඒකකයන්හි කාර්ය සාධනය

හදිසි වැටලීම් ඒකකයන්ගේ කාර්ය සාධනය පහත 6.1 වගුවේ දක්වා තිබේ.**(ඇමුණුම VIII )**

**වගුව 6.1 හදිසි වැටලීම් අංශයේ ප්‍රගතිය**

| ඒකකයේ නම | වන අපරාධ සංඛ්‍යාව | දැව පරිමාව (ඝන මීටර) | දැව වටිනාකම (රු) | දඩය (රු) |
|---|---|---|---|---|
| වයඹ/බස්නාහිර කලාප හදිසි වැටලීම් ඒකකය | 34 | 27.493 | 1,080,006.62 | 370,000.00 |

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හදිසි වැටලීම් අංශය විසින් සොයා ගනු ලබන වන අපරාධවල වැටලීම් කටයුතු ආසන්නතම අඩවි වන කාර්යාලය වෙත භාරදෙනු ලැබේ.

### 6.6.3 දැව පරීක්ෂණ මධ්‍යස්ථාන

2018 වසර තුලදී දඹුල්ල සහ පස්යාල යන ස්ථානවල දැව පරීක්ෂණ මධ්‍යස්ථාන ක්‍රියාත්මක විය.

### 6.6.4 පුද්ගලික දැව ව්‍යාපාර

2018 වසර තුලදී දැව ඉරුම් හල් 364ක්, දැව අලෙවිසැල් 550ක් වඩු මඩු 724ක්, ගෘහ භාණ්ඩ වෙළඳසැල් 627ක් සහ දර විකුණුම්හල් 51ක් ද, දැව පදම් කිරීම් හා සැකසුම් කර්මාන්තශාලා 17ක් හා ජංගම දැව ඉරුම්හල් 417ක් අළුතින් ලියාපදිංචි කරන ලදී. (ඇමුණුම V)

2018 වසර අවසාන වනවිට ලියාපදිංචි දැව ව්‍යාපාර සංඛ්‍යාව 28731ක් ලෙස වාර්තා වී තිබුණි. (ඇමුණුම IV)

## 6.7 පුහුණු වැඩසටහන්

පහත සඳහන් දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩ සටහන් අදාල වර්ෂය තුලදී සිදුකරන ලදී.

- **i.** පොලිස් නිලධාරීන් 1,243ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 26ක් පවත්වන ලදී.
- **ii.** ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුබද්ධ නිලධාරීන් 3.570ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 85ක් පවත්වන ලදී.
- **iii.** වන නිලධාරීන් 1,330ක් සඳහා, දැනුවත් කිරීමේ වැඩසටහන් 54ක් පවත්වන ලදී.
- **iv.** වෙනත් පිටස්තර පුද්ගලයින් 20,318ක් සඳහා, දැනුවත් කිරීමේ වැඩසටහන් 556ක් පවත්වන ලදී. (ඇමුණුම VII)

## 6.8 ත්‍යාග මුදල් ලබා දීම

උසාවිය මගින් වරදකරුවන් කරන ලද වන අපරාධ වලට අදාලව කරන ලද කටයුතු වෙනුවෙන් 2018 වසර තුලදී රුපියල් 1,927,711.00ක මුදලක් නිලධාරින් 170ක් අතර බෙදා දෙන ලදි.
(වැඩිදුර විස්තර ඇමුණුම VIහි දක්වා ඇත.)

## 6.9 මුල්‍යමය ප්‍රගතිය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදල යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා 2018 වසරේදී ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 32,000,000.00 කි. 2018 වසරේදී නිල ඇඳුම් සඳහා රු. 1,7000,000.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වූ අතර, එයින් 7,314,188.00 ක මුදලක් වියදම් වී ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ මුල්‍යමය ප්‍රගතිය 83.3% ක් වන අතර නිල ඇඳුම් සඳහා වැය වූ ප්‍රතිපාදන ප්‍රමාණය මත එහි මුල්‍යමය ප්‍රගතිය 43% ක්ද වේ. ආහාර හා නිල ඇඳුම් වැය ශීර්ෂය යටතේ ප්‍රගතිය අඩු වීමට හේතු වී ඇත්තේ සපත්තු සහ බඳපටි සැපයීමට තෝරාගත් සැපයුම්කරුට නියමිත කාලය තුළ අමුද්‍රව්‍ය ආනයනය කර ගත නොහැකි වීමෙනි.

(වගුව 6.2 මගින් වැඩිදුර තොරතුරු දැක්වේ.)

**වගුව 6.2 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ මුල්‍යමය ප්‍රගතිය**

| විෂය | ප්‍රතිපාදන | වියදම | ප්‍රගතිය % |
|---|---|---|---|
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට සහ අනෙකුත් තොරතුරු සැපයූවන්ට ලබාදුන් ත්‍යාග මුදල් | 7,000,000.00 | 6,911,150.00 | 98.73 |
| ගමන් වියදම් (උසාවි) | 7,000,000.00 | 3,487,676.00 | 49.82 |
| වන ආරක්ෂණ ක්‍රියාකාරකම් | 12,000,000.00 | 11,755,052.51 | 97.95 |
| පුහුණු වීම් | 2,000,000.00 | 1,746,724.00 | 87.33 |
| වෙනත් (බලපත්‍ර පොත් මුද්‍රණය , ගැසට් ප්‍රකාශයට පත් කිරීම ආදිය) | 4,000,000.00 | 2,756,780.00 | 68.91 |
| **එකතුව** | **32,000,000.00** | **26,657,382.51** | **83.3** |

## 6.10 වනාන්තර නොවන ප්‍රභව වලින් ලබා ගන්නා නිෂ්පාදන අපනයනය කිරීම

වනාන්තර නොවන ප්‍රභව වලින් ලබා ගන්නා නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදි. ශීඝ්‍රගාමී සේවාවන් තුලින් රු.1,755,187.50ක මුදලක්ද, සාමාන්‍ය සේවාවන් තුලින් රු. 168,906.25ක මුදලක්ද, ,ශාක/ශාකමය ද්‍රව්‍ය සහ බීජ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් අදාල වර්ෂය තුලදී උපයා ගෙන තිබේ. තවද ගෘහ භාණ්ඩ, අත්කම් භාණ්ඩ, සෙල්ලම්බඩු සහ අගය එකතු කරන ලද දැවමය නිෂ්පාදන අපනයනය සඳහා ශීඝ්‍රගාමී සේවාව මගින් බලපත්‍ර නිකුත් කිරීමෙන් රු. 2,273,062.50ක්ද, සාමාන්‍ය සේවාව මගින් බලපත්‍ර නිකුත් කිරීමෙන් රු. 762,593.75ක්ද උපයාගෙන තිබේ. තවද ඉහත දක්වන ලද නිශ්පාදන සඳහා එක්දින සේවාව යටතේ බලපත්‍ර නිකුත් කිරීමෙන් රු.1,790,032.50ක්ද උපයාගෙන තිබේ. මෙලෙස ඉහත දැක්වූ සියළුම සේවාවන් මගින් රු.6,749,782.50ක සම්පූර්ණ ආදායමක් උපයා තිබේ. (ඇමුණුම **IX, X,XI,XII,XIII,XIV)**

# 7 වන පරිච්ඡේදය
# සැලසුම් හා ප්‍රගති පාලන අංශය

## 7.1 හැඳින්වීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් වලට අදාළ වාර්ෂික සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ සැලසුම් හා ප්‍රගති පාලන අංශය වෙතයි. වාර්ෂික අයවැය සකස් කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන සියළුම ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ප්‍රගතිය වාර්තා කිරීම සහ නව ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම මෙන්ම ගොඩනැගිලි ඉදි කිරීම සහ ගොඩනැගිලි නඩත්තු කිරීම, ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සහ දියුණු කිරීම යන ක්‍රියාකාරකම්ද සැලසුම් හා ප්‍රගති පාලන අංශය විසින් සිදු කරනු ලැබේ.

## 7.2 මෙම අංශයේ ප්‍රධාන අරමුණු

i. ඉදිරි වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අයවැය ඇස්තමේන්තු සැකසීම.

ii. ප්‍රාග්ධන අයවැය යටතේ මූල්‍යමය බැඳීම් ඇතුළු වාර්ෂික වැඩසටහන දෙපාර්තමේන්තුව වෙනුවෙන් සැලසුම් කිරීම.

iii. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් පිළිබඳව මාසික ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ඇතුළු විවිධ ආයතනවලට ප්‍රගතිය වාර්තා කිරීම.

iv. විදේශ අරමුදල් සහ ඒකාබද්ධ අරමුදල් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම.

v. නව ගොඩනැගිලි ඉදි කිරීම සහ දැනට තිබෙන ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම මගින් දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන යටිතල පහසුකම් ගොඩ නැංවීම.

vi. වාර්ෂික කාර්ය සාධන වාර්තාව සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම පිළියෙල කිරිම හා එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරිම සඳහා ඉදිරිපත් කිරිම.

vii. පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ හා පාරිසරික සංවේදී ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය සහ පරිසර පද්ධතිවල තිරසාර බව ඉහල නැංවීම පිළිබඳ ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීම.

## 7.3 ආයතනික සැකැස්ම

සැලසුම් හා ප්‍රගති පාලන අංශය වන සංරක්ෂකවරයකුගේ පාලනය යටතේ පවතී. වන සංරක්ෂකවරයාට සහකාර වන සංරක්ෂකවරයකුගේ සහාය ලැබේ. වන සංරක්ෂක සහ සහකාර වන සංරක්ෂකගේ සහායට සංවර්ධන නිලධාරීවරියක් ද, රාජ්‍ය කළමනාකරණ සහකාරවරියක්ද , බීට්ටු වන නිලධාරීන් තිදෙනෙක් සහ වන ක්ෂේත්‍ර සහකාරවරුන් තිදෙනෙක් සහ කාර්යාල කාර්ය සහයකයකු මෙම අංශයට අනුයුක්ත කර ඇත.

## 7.4 ප්‍රධාන ක්‍රියාකාරකම්

මෙම වාර්තා කරන කාලය තුළ පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම්, සැලසුම් සහ ප්‍රගති පාලන අංශය විසින් සිදු කරන ලදී.

### 7.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රාග්ධන අයවැය සකස් කිරීම

2019 වසර සඳහා දෙපාර්තමේන්තුවේ වාර්ෂික සැලසුම් සහ 2019 වසරේ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සියල්ල සැලකිල්ලට ගෙන, 2019 වසර සඳහා වාර්ෂික ප්‍රාග්ධන අය වැය සකස් කරන ලදී.

### 7.4.2 ප්‍රගති වාර්තා සැපයීම

ප්‍රාග්ධන අය වැය යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය කාර්තුවකට වරක් වශයෙන් මහවැලි සංවර්ධන හා පරිසර  අමාත්‍යාංශය වෙත යවන ලදී. වෙනත් විවිධ ආයතන වෙත ඒවායේ ඉල්ලීම සහ අවශ්‍යතාව අනුව වරින්වර ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලදී.

අදාල කාලය තුලදී, 2017 වසර තුල දෙපාර්තමේන්තුව විසින් සිදුකල ක්‍රියාකාරකම් පිළිබඳ සියළු තොරතුරු අඩංගු කාර්ය සාධන වාර්තාව සකස් කරන ලදී.

### 7.4.3 ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියාව

7.4.3.1 **ගොඩනැගිලි ඉදිකිරීම**

සමාලෝචනය සිදු කල වසර තුලදී ඒකාබද්ධ අරමුදලේ, මුදල් උපයෝගී කර ගනිමින් ගොඩනැගිලි 2 ක ඉදි කිරීම් කටයුතු සිදු කරන ලදී. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු වගුව 7.1 මගින් දක්වා ඇත.

**වගුව 7.1 - ඒකාබද්ධ අරමුදල උපයෝගී කර ගනිමින් ඉදි කල ගොඩනැගිලි පිළිබඳ  තොරතුරු - 2018**

| දිසාව | ගොඩනැගිල්ල |
|---|---|
| හම්බන්තොට | දිසා වන  නිලධාරි කාර්යාලය - හම්බන්තොට |
| කුරුණෑගල | අඩවි වන  නිලධාරි කාර්යාලය - කුලියාපිටිය |

ඉහත වැඩසටහනේ මූල්‍යමය කාර්ය සාධනය පහත දක්වා ඇත. (වගුව 7.2)

**වගුව 7.2 - 2018  වසර තුල ගොඩනැගිලි ඉදිකිරීම හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය**

| අරමුදල | වාර්ෂික ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදල | 8,500,000.00 | 8,499,998.55 | 100 |

### 7.4.3.2 ගොඩනැගිලි නඩත්තු කිරීම

මෙම වසර තුලදී ගොඩනැගිලි නඩත්තු කිරීමේ වැඩසටහන් යටතේ ගොඩනැගිලි වල නඩත්තු කටයුතු සිදු කරන ලදී.ඒ පිළිබඳ වැඩිදුර විස්තර වගුව 7.3 මගින් දක්වා ඇත.

**වගුව 7.3 - වර්ෂ 2018 තුල නඩත්තු කරන ලද ගොඩනැගිලි වල තොරතුරු**

| ගොඩනැගිලි | ස්ථානය |
|---|---|
| දිසා වන කාර්යාල | 1. අනුරාධපුරය<br>2. මන්නාරම<br>3. මුලතිව්<br>4. වව්නියාව<br>5. කළුතර<br>6. ගම්පහ<br>7. මාතලේ<br>8. කෑගල්ල<br>9. රත්නපුර<br>10. ගාල්ල<br>11. හම්බන්තොට<br>12. ත්‍රිකුණාමලය<br>13. මඩකලපුව |
| දිසා වන නිලධාරී නිල නිවාස | 1.අනුරාධපුරය<br>2. මන්නාරම<br>3. වව්නියාව<br>4. ගම්පහ<br>5.බදුල්ල<br>6.මොණරාගල<br>7.මාතර<br>8.හම්බන්තොට<br>9.පොලොන්නරුව<br>10.මඩකලපුව |
| වන පාලක නිවාස | 1.යාපනය |
| අඩවි වන නිලධාරි කාර්යාලය | 1. කිලිනොච්චිය<br>2. වාලච්චේන<br>3. ලාහුගල<br>4. අම්පාර<br>5. ත්‍රිකුණාමලය<br>6. කන්තලේ<br>7. අනුරාධපුරය<br>8. මන්නාරම<br>9. කුරුණෑගල<br>10. කුලියාපිටිය<br>11.මතුගම<br>12.වග<br>13.මීරිගම<br>14.හැටන් |

| | |
|---|---|
| | 15.නාවලපිටිය<br>16.බිබිල<br>17.වැල්ලවාය<br>18.හුන්නස්ගිරිය<br><br><br>19.කලවාන<br>20.වැද්දාගල<br>21.කිතුල්ගල<br>22.දෙහිඕවිට<br>23.රත්නපුර<br>24.කඹුරුපිටිය<br>25.අකුරැස්ස<br>26.නෙළුව<br>27.තවලම<br>28.වලස්මුල්ල<br>29.මැදවච්චිය<br>30.අක්කරපත්තුව<br>31.තඹුත්තේගම<br>32.කැකිරාව<br>33.කන්තලේ<br>34.දිඹුලාගල<br>35.වාලච්චේන |
| අඩවි වන නිලධාරී නිල නිවාස | 1.ලාහුගල<br>2.ත්‍රිකුණාමලය<br>3.කිලිනොච්චිය<br>4.පලෙ<br>5.කුරුණෑගල<br>6.නාවලපිටිය<br>7.නාවුල<br>8.වාගොල්ල<br>9.මහකුඩුගල<br>10.හැටන්<br>11.රත්නපුර<br>12.රඹුක්කන<br>13.වලස්මුල්ල<br>14.ඇල්පිටිය<br>15.ත්‍රිකුණාමලය<br>16.මැදවච්චිය |
| අතිරේක අඩවි වන නිලධාරී නිල නිවාස | 1. නා උල<br>2. කණදොල |
| බීට්ටු වන කාර්යාල | 1.අම්පාර<br>2.පදියතලාව<br>3.හුලන්නුගේ<br>4.සේරන්කඩ |

| | |
|---|---|
| | 5.ගුරුනගර්<br>6.යගිරල<br>7.මෝල්කාව<br>8.ඉංගිරිය<br>9.පුලියන්කුලම<br>10.රිදීමාලියද්ද<br>11.බෝපත්තලාව<br>12.ඉගිණියාගල<br>13.මීගහකිවුල<br>14.තිරුක්කෝවිල්<br>15.කෝමාරි<br>16.ලාහුගල<br>17.උණුවතුරබුබුල<br>18.අරන්තලාව<br>19.පන්නල්ගම<br>20.ගලෙන්බිඳුණුවැව<br>21.නොච්චියාගම |
| බීට්ටු වන නිලධාරී නිල නිවාස | 1සෙට්ටිකුලම<br>2.වෙල්ලන්කුලම<br>3.මඩු<br>4.ඔඩ්ඩුසුඩාන්<br>5.මුලංගාවිල්<br>6.වඩ්ඩකච්චි<br>7.උතුරු දූපත්<br>8.පලෛ<br>9.වව්නියාව<br>10.සෙට්ටිකුලම<br>11.ඕමන්ත<br>12.ගල්ගමුව<br>13.තෙල්දෙණිය<br>14.සියඹලාණ්ඩුව<br>15.මීගහකිවුල<br>16.ඉළුක්කුඹුර<br>17.ඉණාමළුව<br>18.ඉවුල්දණ්ඩ<br>19.උඩුදුම්බර<br>20.මහයියාව<br>21.බඹරකැලේ<br>22.උස්වැව<br>23.කුරුවිට (ලස්කන්ද)<br>24.සිංහරාජය<br>25.සූරියවැව<br>26.වැද්දාගල<br>27.රඹුක<br>28.රත්තනගොල්ල |

| | |
|---|---|
| | 29.දොලමාවත<br>30.මාතර<br>31.පූනානි<br>32.නාවල්ආඩි<br><br>33.පුළුකුනාව<br>34.වාකරේ<br>35.තොප්පිගල<br>36.ගලෙන්බිඳුණුවැව<br>37.මනන්පිටිය |
| සංචාරක බංගලා | 1.යාපනය<br>2.පට්ටිපොල<br>3.හපුතලේ<br>4.හාලිඇල<br>5.සිංහරාජ<br>6.අම්පාර (එක්ගල්ඔය)<br>7.අනුරාධපුරය<br>8.ත්‍රිකුණාමලය<br>9.මාතර (නාදුගල)<br>10.ගාල්ල (වැකුණුගොඩ) |
| වන ක්ෂේත්‍ර සහකාර නිල නිවාස | 1.හල්දුම්මුල්ල<br>2.හපුතලේ |
| තවාන | 1.දෙපානම<br>2.හුන්නස්ගිරිය<br>3.වල්පිට |
| මුර කුටි | 1. දිගම්පතන ( නාඋල)<br>2.පිදුරුතලාගල<br>3.උඩවත්ත කැලේ |
| වන විද්‍යාතනය<br>ක්ෂේත්‍ර සුපරීක්ෂක කාර්යාලය<br>තොරතුරු මධ්‍යස්තානය<br>කළාප කාර්යාලයේ ගොඩනැගිල්ල | 1. නුවරඑළිය<br>2. මඩකලපුව<br>3.බඩගමුව<br>4. නුවඑරළිය<br>5.අනුරාධපුරය |

**සමාලෝචනය සිදු කරන වසර තුල ගොඩනැගිලි නඩත්තු කිරීමේ වැඩසටහනේ මූල්‍යමය ප්‍රගතිය පහත දැක්වේ. (වගුව 7.4)**

වගුව 7. **4 - ගොඩනැගිලි නඩත්තුව - මූල්‍යමය ප්‍රගතිය 201**8

| **වාර්ෂික ප්‍රතිපාදන (රු.)** | **වියදම (රු.)** | **ප්‍රගතිය (%)** |
|---|---|---|
| 50,000,000 | 49,998,831.17 | 100 |

වගුව **7.5 - 2018** වසර තුල ගෘහ භාණ්ඩ, හා කාර්යාල උපකරණ හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය

| අරමුදල | වාර්ෂික ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | ප්‍රගතිය (%) |
|---|---:|---:|---:|
| ඒකාබද්ධඅරමුදල | 9,000,000.00 | 8,997,104.97 | 91.2 |

වගුව **7.6 - 2018** වසර යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය

| අරමුදල | වාර්ෂික ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | ප්‍රගතිය (%) |
|---|---:|---:|---:|
| ඒකාබද්ධ අරමුදල | 2,500,000.00 | 2,499,999.26 | 100 |

වගුව **7.7 - 2018** වසර යන්ත්‍රෝපකරණ නඩත්තුව හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය

| අරමුදල | වාර්ෂික ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | ප්‍රගතිය (%) |
|---|---:|---:|---:|
| ඒකාබද්ධ අරමුදල | 3,000,000.00 | 2,997,372.68 | 100 |

# 8 වන පරිච්ඡේදය
# ප්‍රවාහන අංශය

## 8.1 හැඳින්වීම.

මෙම අංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වාහන නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම, සංචිතයේ තිබෙන වාහන වලට සහ නිලධාරීන්ට වෙන් කරන ලද වාහනවලට ඉන්ධන සැපයීම, සහ රියදුරන්ගේ අතිකාල සහ අමතර ප්‍රවාහන ඉල්ලීම් සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම යනාදී කටයුතු සඳහා වගකියනු ලැබේ. මෙයට අමතරව, ප්‍රධාන කාර්යාලයට සහ ක්ෂේත්‍ර කාර්යාලවලට අයත් වාහන නඩත්තු කටයුතු, අළුත්වැඩියා කටයුතු සහ ඉන්ධන සඳහා අවශ්‍යවන මුදල් ප්‍රතිපාදන සැපයීමද මෙම අංශය මඟින් සිදුකරයි.

## 8.2 කාර්ය මණ්ඩලය හා ආයතනික සැකැස්ම.

මෙම අංශය, කාර්ය භාර නිලධාරී - ප්‍රවාහන ( අතිරේක වන සංරක්ෂක ජනරාල් - පර්යේෂණ, අධ්‍යාපන හා සංවර්ධන) යටතේ පවතී. අනෙකුත් කාර්ය මණ්ඩලයට කලමනාකරණ සහකාරවරු තිදෙනෙක් සහ එක් කාර්යාල කාර්ය සහායකයෙක් අයත් වේ.

## 8.3 මූල්‍යමය ප්‍රතිපත්ති

2018 වර්ෂය සඳහා ප්‍රවාහන අංශයට ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය සහ වියදම් පහත වගුව මඟින් දක්වා තිබේ. මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදනවලට අමතර වනාන්තරවල වියන් ආවරණය පුළුල්කිරීමේ වැඩසටහන යටතේ ද ඉන්ධන සඳහා මෙන්ම වාහන වල නඩත්තු කටයුතු සඳහාද මූල්‍යමය අරමුදල් ලැබී තිබුණි.

**8.1 වගුව - 2018 වසරේ ලැබුණු ප්‍රතිපාදන හා ඒවා වියදම් වූ ආකාරය**

| ක්‍රියාකාරකම | ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | වියදම (රු) | ප්‍රගතිය |
|---|---|---|---|
| වාහන නඩත්තු කිරීම සහ සේවා කිරීම. (වැය ශීර්ෂ අංක.014) | 18,800,000.00 | 18,545,406.38 | 98.64% |
| ඉන්ධන ( වැය ශීර්ෂ අංක. 009) | 12,000,000.00 | 11,960,532.69 | 99.67% |
| වාහන අළුත් වැඩියාව (වැය ශීර්ෂ අංක. 203) | 9,000,000.00 | 8,964,068.00 | 99.60% |

# 9 වන පරිච්ඡේදය

## මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන අංශය

### 9.1 හැඳින්වීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණ පරිපාලන හා ආයතනික සංවර්ධන අංශය වශයෙන් සමස්ථ පරිපාලන කටයුතු සිදු කිරීම සහ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාව වර්ධනය කරමින් මහජනයාට සහ රටට උපරිම සේවාවක් සැපයීම සඳහා සුදුසු පරිපාලන සහ කළමනාකරණ වැඩ රාමු තුල ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල, අඩවි වන කාර්යාල වන විද්‍යාලය හා පර්යේෂණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම යන වගකීම් පැවරී තිබේ.

පිරිස් හා පාලන යන විෂයයන්ට අදාල විවිධ කටයුතු 2018 වසරේදී මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද අතර එහිදී ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් චක්‍රලේඛ විධි විධාන සහ සියළුම අදාල නීති, රෙගුලාසි සහ නියෝගයන්ගේ සීමාවන් ඇතුලත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි වලට අනුකූලව සියළු බඳවා ගැනීම් හා උසස් වීම් හා අනෙකුත් වරප්‍රසාද ලබා දීම් සිදු කිරීම මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

2018 වසර අවසාන වන විට ජොෂ්ඨ, තෘතීක, ද්වීතීක සහ ප්‍රාථමික සහ සියළුම කාණ්ඩ වලින් සමන්විත වන පහත දක්වා ඇති ආකාරයේ සේවක සංඛ්‍යාවක් මෙම දෙපාර්තමේන්තුව සතුවේ.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ සමස්ථ අනුමත සේවක සංඛ්‍යාව 3145 ක් වන අතර 2018.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 505 ක් විය. විස්තර වගු අංක 9.1 හි දැක්වේ.

**වගුව 9.1 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු**

| | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජොෂ්ඨ මට්ටම | 87 | 63 | 24 |
| තෘතීක මට්ටම | 42 | 28 | 14 |
| ද්විතියික මට්ටම | 1382 | 1095 | 287 |
| ප්‍රාථමික මට්ටම | 1634 | 1454 | 180 |
| **එකතුව** | **3145** | 2640 | 505 |

**වගුව 9.2 - 2018 වසරේ බඳවා ගැනීම්**

| | |
|---|---|
| අඩවි වන නිලධාරීන් | 07 |
| වන ව්‍යාප්ති නිලධාරී | 54 |
| බීට්ටු වන නිලධාරී | 115 |
| වන ක්ෂෙත්‍ර සහකාර | 110 |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් විභාග පවත්වා සම්මුඛ පරීක්ෂණ වලින් අනතුරුව ඉහත බඳවා ගැනීම් සිදුකරන ලදී.

**I. <u>2018 වසරේ විශ්‍රාම ගැනීම්</u>**

අදාල කාල වකවානුව තුල පහත සඳහන් තනතුරු දරණ ලද නිලධාරීන් විශ්‍රාම ගන්නා ලදී.

**වගුව 9.3 - 2018 වසරේ විශ්‍රාම ගැනීම්**

| | |
|---|---|
| වන පාලක | 03 |
| අඩවි වන නිලධාරී | 05 |
| බීට්ටු වන නිලධාරී | 26 |
| වන ක්ෂෙත්‍ර සහකාර | 11 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 |
| වගා කම්කරු | 12 |
| රියදුරු | 03 |

| | |
|---|---|
| සැලසුම් ශිල්පී | 02 |
| රිය සහයක | 02 |
| රසායනාගාර සහයක | 01 |

**II. සේවයෙන් ඉල්ලා අස්වීම් / තනතුරු වලින් නිදහස් වීම්**

**වගුව 9.4 - සේවයෙන් ඉල්ලා අස්වීම් / තනතුරු වලින් නිදහස් වීම්**

| | |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධරීන් | 02 |
| බීට්ටු වන නිලධාරි | 07 |
| වන ක්ෂේත්‍ර සහකාර නිලධාරින් | 87 |
| වන ව්‍යාප්ති නිලධාරී | 01 |
| වගා කම්කරු | 13 |

**III. මිය ගිය නිලධාරීන් පිළිබඳ විස්තර**

**වගුව 9.5 - මිය ගිය නිලධාරීන් පිළිබඳ විස්තර**

| | |
|---|---|
| වන ව්‍යාප්ති නිලධාරී | 02 |
| සිනමා යන්ත්‍ර ක්‍රියාකරු | 01 |

**IV. විනය කටයුතු**

**වගුව 9.6 - විනය කටයුතු**

| | |
|---|---|
| වැඩ තහනම් කිරීම් | 02 |
| නැවත සේවයේ පිහිටුවීම් | 02 |
| අවසන් කළ විධිමත් විනය පරීක්ෂණ | 04 |
| වර්ෂය තුල ආරම්භ කළ විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ | 30 |

**V. සේවය අත්හැර යාම්**

**වගුව 9.7 - සේවය අත්හැර යාම්**

| | |
|---|---|
| වගා කම්කරු | 04 |

## 9.2 ස්ථාන මාරු

i. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ ස්ථාන මාරු පරිපාටිය ක් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ක්‍රියාත්මක කිරීම.

ii. දෙපාර්තමේන්තුගත සේවාවන් වෙනුවෙන් ස්ථාන මාරු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

iii. දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා ස්ථාන මාරු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ක්‍රියාත්මක කිරීම.

## 9.3 බඳවා ගැනීම්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාල සටහනට ඇතුලත්ව මෙම දෙපාර්තමේන්තුවේ තනතුරුවලට බඳවා ගැනීම් විභාග පැවැත්වීම මත සුසුදුකම්ලත් නිලධාරීන් තෝරාපත් කර ගන්නා ලදි.

ඒ අනුව 2018 වර්ෂයේ තුල පහත පරිදි නිලධාරින් බඳවා ගෙන ඇත.

වගුව **9.8 -** බඳවා ගැනීම්

| | බඳවා ගත් සංඛ්‍යාව |
|---|---|
| අඩවි වන නිලධාරි | 07 |
| බීට්ටු වන නිලධාරීන් (විවෘත-සීමිත) | 115 |
| වන ක්ෂේත්‍ර සහකාරවරුන් (විවෘත-සීමිත) | 110 |
| වන ව්‍යාප්ති නිලධාරීන් (විවෘත) | 54 |

## 9.4 තනතුරු උසස් වීම්

i. වන ක්ෂේත්‍ර සහකාරවරු 0ක් 3, කළමනාකරණ සහකාර තනතුරු ලෙස උසස් වීම් ලබා ඇත.
ii. බීට්ටු වන නිලධාරි 07 ක්, අඩවි වන නිලධාරීන් ලෙස උසස් වීම් ලබා ඇත.
iii. වන ක්ෂේත්‍ර සහකාර 84 ක්, බීට්ටු වන නිලධාරීන් ලෙස උසස් වීම් ලබා ඇත.
iv. වගා කම්කරු 13 ක්, වන ක්ෂේත්‍ර සහකාර ලෙස උසස් වීම් ලබා ඇත.

## 9.5 ණය ලබා දීම

දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයට අයත් නිලධාරීන්ට රජයේ සේවකයින්ට හිමි ණය යටතේ පහත සඳහන් ණය ලබා දී ඇත.

01. ආපදා ණය 85 ක්
02. දේපල ණය 13 ක් ලබා දී ඇත.

## 9.6 තොරතුරු අයිතිවාසිකම් ඒකකය

01. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ තොරතුරු ඉල්ලීම් 48කි .

| | | |
|---|---|---|
| i. | ඉඩම් පිළිබඳ ගැටළු | 11- |
| ii. | වනජ ද්‍රව්‍ය පිළිබඳ ගැටළු | 04- |
| iii. | වන නීතිය භාවිතය පිළිබඳ ගැටළු | 11- |
| iv. | දෙපාර්තමේන්තු බඳවා ගැනීම් හා උසස් වීම් පිළිබඳ ගැටළු සහ කාර්ය මණ්ඩල | 08- |
| v. | මූලික පරිසර ඇගයීම් පිළිබඳ ගැටළු | 01- |
| vi. | වන සංරක්ෂිත පිළිබඳ ගැටළු | 11- |
| vii. | වන ශාක විශේෂ පිළිබඳ ගැටළු | 02- |

02. දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ඉල්ලුම් කරන ලද ඉල්ලුම් කරුවන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ජන මාධ්‍යවේදින් | - | 04 |
| රාජ්‍ය නොවන සංවිධාන | - | 08 |
| පුරවැසියන් | - | 27 |
